# බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව
# මහා සභා රැස්වීමේ වාර්තාව.
# 2020.10.20

වර්ෂ 2020 ක් වූ ඔක්තෝම්බර් මස 20 වන අඟහරුවාදා දින පෙ.ව. 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වූ ඔක්තෝම්බර් මස මහා සභා රැස්වීමේ වාර්තාවයි.

**සහභාගීත්වය.**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
04. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
05. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
07. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
08. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
09. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
10. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
11. ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය
12. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
13. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
14. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
15. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
16. ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා
17. ගරු මන්ත්‍රීනි ජී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
18. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
19. ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය
20. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
21. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා
22. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

මීට අමතරව ප්‍රාදේශීය සභාවේ ලේකම් එල්.එච්. අනිල් රංජන් මහතා ද සහභාගී විය.

**<u>ආගම සිහි කිරීම හා සභාව පිළිගැනීම.</u>**

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සියලුම ගරු සභිකවරුන්, ලේකම්තුමා ප්‍රධාන නිලධාරීන් හා මාධ්‍යවේදීන් පිළිගැනීමෙන් අනතුරුව පළමුව ආගම සිහිපත් කරන ලදී. ඉන් අනතුරුව විනාඩියක නිශ්ශබ්දතාවය රැකීමෙන් රට වෙනුවෙන් සටන් වැද මියගිය රණවිරුවන් හා මියගිය සභිකවරුන්, නිලධාරීන් හා සේවකයන් සිහිපත් කරන ලදී.

(ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා, ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා සභාවට සහභාගි වීම සිදුවිය.)

**<u>(අ) පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම</u>**

**<u>01) 2020-09-15 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2020-09-15 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව කියෙව්වා සේ සලකා, විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන්න. නැත්නම් 2020-09-15 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව ලියා ඇති පරිදි ස්ථිර කරන ලෙස යෝජනා කරන්න. සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** 2020-09-15 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධනවලට යටත්ව සභා සම්මත කිරීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, 30 වෙනි පිටුවේ තියෙනවා අපේ අබේසේකර මන්ත්‍රීතුමා කරාමයක් යවන්න කියලා. 30 වෙනි පිටුවේ තියෙන්නේ. ගරු මන්ත්‍රී අබේසේකර මැතිතුමා කියලා තියෙනවා කරාමයක් යවන්න කියලා. මොන කරාමයක්ද දන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් එතුමා ඒක බලන්නෙත් නැහැ. දැන් එතුමාට අඩුපාඩු පේන්නේ නැහැ. බලන්නෙත් නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** විශේෂ සභාවේද.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** මහා සභා වාර්තාවේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** 30 වෙනි පිටුවේද.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** 31 පිටුව.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** යෝජනාව කාගේද, ඔබතුමාගේද, ඔබතුමා කියපු එකක්ද.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** මම කියපු එකක් නෙමෙයි, අබේසේකර මන්ත්‍රීතුමා කියපු එකක්.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** කී වෙනි පිටුවේද.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** 31 පිටුව, කරාම යවන්න කියලා තියෙනවා. 31 පිටුවේ අබේසේකර මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කරුණාකරලා මම ඒකයි කිවුවේ මේ වාර්තාවේ මම දැකපු ලොකු අඩුවක් නැහැ. හැබැයි අපි මීට ඉස්සරත් කතා කරලා තියෙනවා. කතා කරන කොට ගරු සභාපතිතුමා කියලා කියන්න අපිට බැරිවුණොත්, එහෙම නැත්නම් ගරු මන්ත්‍රීතුමා කියලා කියන්න බැරිවුණොත් එහෙම ඇත්තටම ඒක ගරු මන්ත්‍රීතුමා කියලා දාන්න. මේක මේ නිසා මම ඉල්ලනවා, සංශෝධනය කරා කියලා ගරු සභාපතිතුමා ඇත්තටම ඊළඟ සභා වාර්තාවත් බලන්න ඕන. අපි උදාරහණයකට හිතමු මේක පුස්තකාලයට දානවා. මිනිස්සු ඇවිල්ලා බලනවා. බැලුවම සංශෝධන ආපු ඒක නොබැලුවොත් හොඳ නැහැ. සංශෝධන ආවත් අපි වගේ මේක සම්මත කරාට පස්සේ බලන්න යන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ වචනය මොකක්ද, කියපු එක මට තේරෙන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මහායාන මේව එකේ කරහම යවන්න කියන එකනේ කරාම යවන්න කියලා තියෙන්නේ. තේරුණාද, මම කරුණාකරලා ඉල්ලනවා අපිට මේ වාර්තාව සභාගත කරන්න ඉස්සෙල්ලා, දවසකට දෙකකට ඉස්සෙල්ලා අපිට බලන්න පොඩ්ඩක් තියන්න. අපි ඉස්සර එහෙම කරා සභාපතිතුමා. එතකොට නිවැරදිව ආවා. දැන් මේකේ නෙමෙයි විශේෂ සභා වාර්තාව බැලුවම මට නම් ඔලුව කකියනවා. නිවැරදි කරනවා කියලා කරන්න බැහැ. මම මීට පස්සේ ඇත්තටම මගේ කතාව මම ලිඛිතව ඉදිරිපත් කරනවා බොහොම පැහැදිලිව. බොහොම පැහැදිලිව එවෙලෙට මම ඉදිරිපත් කරනවා. මගේ කතාව මම දන්නවානේ. මේ යටතේ කතා කරන්නේ මේක.

දැන් ඉතිං මම කිවුවේ මෙහෙම තිබුණම අහන්න ඕන. ගැලපීමක් නැති බව හොඳටම තේරෙනවා. මේ සභාවට අපි නිතර එනවා. ආවම අපෙන් ඇහීමේ යුතුකමක් තියෙනවා. ඒ ඇරෙන්න අපිට ගරු සභාපතිතුමනි, පරණ විදියටම, ඔබතුමන්ලා අපි ඉල්ලලා දිනාගත්ත දෙයක් තියෙනවා. සභාවට කලින් අපිට දවසක් හරි මේක බලන්න තියන්න. එතකොට අපි නිවැරදි කරලා දෙනවා. මේකේ තියෙන නරක තියෙන්නේ වෙන දෙයක් හින්දා නෙමෙයි. මේවා පුස්තකාලවලට දානවානේ. මිනිස්සු බලනවානේ. එතකොට අප්‍රබංශ. ස්තුතියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තවත් මොනවද තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේකේ නෙමෙයි අනිත් එකේ තියෙනවා තොගයක දේවල්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම දාලා ගිය සැරේ වුණේ සංශෝධන වලට මන්ත්‍රීවරු ඒක වෙනස් කරලා දෙනවා. නමුත් තමන් කියපු ප්‍රකාශය නෙමෙයි ඊට හාත්පසින්ම වෙනස් ප්‍රකාශයක් දෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** වෙනස් ප්‍රකාශයක් නෙමෙයි දෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකද ඒකේ රෙකෝඩින්වල තියෙනවානේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ සභා වාර්තාවේ මේ වගේ ලොකු එකක් විතරයි තියෙන්නේ. නමුත් මේක ඇත්තටම නිවැරදි කළ යුතුයිනේ. මොකක්ද කියලා අහන්න ඕනනේ. මොකක්ද කරාමය කියලා අහන්න ඕනනේ. මහා විකාරයක්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කරහම කියන එක දැම්මා නම් හරි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** තාප්පය කඩලා මේවා කරහම දාන්න කියන එකනේ කිවුවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ අර්ථය වෙනස් විදියකට අදහස් කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපිට අඩු ගානේ දවස් දෙකකට කලින්වත් බලන්න දාන්න. ඒක මේවා කරන්න ගරු සභාපතිතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වෙනත් සංශෝධන තියෙනවාද, කරහම කියලා දාන්නකෝ ඕක වෙන මුකුත් දාන්න විදියක් නැත්නම්. සිදු කරහම කියලා දාන්නකෝ. මෙතුමා කියන ඒවා දාන්න ගියොත් ඕකේ අමුතුම අර්ථ එන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ වාර්තාවේ ලොකුවට නැහැ. විශේෂ මහා සභා වාර්තාව බැලුවම ඔලුව කකියනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2020-09-15 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධනවලට යටත්ව ඒකමතිකව සභා සම්මත විය.

(ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා සභාවට සහභාගි වීම සිදුවිය.)

02) 2020-09-24 දින පැවති විශේෂ මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2020-09-24 දින පැවති විශේෂ මහා සභා රැස්වීමේ වාර්තාව කියෙව්වා සේ සලකා, විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන්න. නැත්නම් 2020-09-24 දින පැවති විශේෂ මහා සභා රැස්වීමේ වාර්තාව ලියා ඇති පරිදි ස්ථිර කරන ලෙස යෝජනා කරන්න. සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** 2020-09-24 දින පැවති විශේෂ මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධනවලට යටත්ව සභා සම්මත කිරීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඊළඟ එකේදී ලිඛිතව දෙනවා. එහෙම නැත්නම් අපිට බලන්න කාලයක් දෙන්න ගරු සභාපතිතුමනි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සතියකට කලින් බලන්න දෙන්න පුලුවන්නේ. සභාව දවසට සතියකට කලින් දවස් දෙකක් බලන්න පුලුවන්. ඒක ඉල්ලන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** බලන්න දුන්නම නිවැරදි කරන්නම්.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, දැන් මේකේ වචන, කියන ඒවා ලිඛිත භාෂාවෙන් නෙමෙයි බොහෝ දුරට කියන විදියටම තමයි මේකෙ සටහන් වෙන්නේ. නමුත් මේක දැන් රමේෂ් මහත්තයාට පුලුවන් අපි හැමෝගෙම දුරකථන අංක තියෙන නිසා මේ වගේ ගැටලුවක් ආවම දුරකථන ඇමතුමක් අපිට දීලා මේ මොකක්ද කියලා අහන්න. කරහම කියලා දැම්මානම් හරි. නැත්නම් වෙන අර්ථයක් එනවා. ඕකේ පොඩි පොඩි දේවලුත් එනවා. බලාගෙන යනකොට ලොකු වැඩක්නේ මේක. ඒක නිසා ඔබතුමාට ඉදිරියට අපි ඇවිල්ලා වාර්තාව බලන කොට කාලය මිඩංගු කරන්න වෙනවා. පොඩි

කාලයක් ඇතුළත වාර්තාව හදලා අපිට භාර දෙන්න ඕන. හොඳම දේ එහෙම ගැටළුවක් ආපු තැන දුරකථන ඇමතුමක් දීලා අහන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඊට වැඩිය මන්ත්‍රීතුමා අරක හොඳයි. සතියකට කලින් අරහෙම දෙන එක හොඳයි. මේකේ දැනට එතුමා වැරැද්දක් කියන්නේ. කරාම කියන එක දැම්මා. ඒක එහෙමයි කියන එක කියන්නේ. අරහෙම ප්‍රින්ට් එක දුන්නම වෙනස්කම් තියෙනවා නම් ඉදිරිපත් කරන්න.

2020-09-24 දින පැවති විශේෂ මහා සභා රැස්වීමේ වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

(ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා, ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා සභාවට සහභාගි වීම සිදුවිය.)

**<u>(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පළමු කාරණය තමයි ආදාහනාගාරය පිළිබඳ කාරණය. ඒක අපි කලින් බලපු ස්ථානයටත් වැඩිය තවත් ටිකක් මෙහොට වෙන්න ගන්නේ. රමේෂ් පතිරණ ඇමතිතුමා අපි එක්ක ගියා. වැවිලි සමාගමත් එක්ක එතුමා සාකච්ඡා කරලා ටිකක් මෙහාට වෙන්න, ළඟට වෙන්න ගන්නේ. දැන් කලින් තිබුණේ එතනින් හැරිලා කිලෝමීටර් දෙකකට කිට්ටුවෙන්න යන්න තිබුණා. පාරත් පටුයි. දැන් මේ අලුත් එක අනුව මීටර් 900 ක් වගේ ඇතුළට යන්න තියෙනවා. කලින් තිබුණේ කන්දක් මුදුනේ. මේක පහළට වෙන්න, පාර අයිනකට වෙන්න ඇතුළේ යන මාර්ග වලින් පාරක් අයිනට වෙන්න කොටසක් දැන් මැනලා වෙන් කරලා ඒක නැවත අනුමැතියට යවලා තියෙන්නේ. අපි ඒ අතරේදී කියන්න ඕන ඒ ආදාහනාගාරයට ණය පහසුකම් යටතේ කරන්න තමයි බලාපොරොත්තු වුණේ. නමුත් අපගේ තියෙන මුද්දර ගාස්තු ඒකට අදියර තුනක් වශයෙන් ආදාහනාගාරය හදන්න ගන්නවා. දැනට අපිට කෝටියක මුදලක් ඇවිල්ලා තියෙනවා. ඒක නිදහස් කරලා තියෙනවා. ඒවගේ අදියර තුනකදී ඒ අවශ්‍ය මුදල, කෝටි තුනක් හෝ තුනහමාරක මුදල, ඒ ටෙන්ඩර් එකට යන මුදල ලබා දීමට රමේෂ් පතිරණ ඇමතිතුමත් සමග සාකච්ඡා කරලා ආණ්ඩුකාරතුමා එකඟතාවය පළ කරලා ඒකේ පළවෙනි කොටස මේ වෙන විට අපිට ලැබිලා තියෙනවා. ගිණුම්ගත කරලා තියෙන්නේ. ඒ පිළිබඳව සඳහන් කරන්න ඕන. මම හිතන්නේ මේ අවුරුද්ද අවසන් වෙන්න ප්‍රථමව අපිට වැඩ ආරම්භ කරන්න හැකියාව ලැබෙයි කියන හැඟීමක් තියෙනවා. ටෙන්ඩර් කිරීමේ කාලය තමයි දැන් යන්නේ. සැලැස්ම දැනට සකස් කරමින් යනවා පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන්. ඒක සකස් කරලා ඇස්තමේන්තුව ගත්තම අපි ඒක ටෙන්ඩර් කරනවා. විවෘතව ඕන කෙනෙකුට ටෙන්ඩර් දාන්න පුලුවන් විදියට තමයි බොහොම විනිවිද භාවයෙන් අපි මේ වැඩේ කරන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක කරන කට්ටියට විතරනේ දාන්න පුලුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක තමයි කරන අයට විතරයි පුලුවන්.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඒ සම්බන්ධව මට විනාඩියක් කතා කරන්න අවස්ථාව ලබා දුන්නොත් ඔබතුමාට මම ස්තුතිවන්ත වෙනවා. වසර ගණනාවක් තිස්සේ බෝපෙ පෝද්දලට අඩුවක්ව පැවති මේ අවශ්‍යතාවය ඉෂ්ඨ කර දීම කාගෙත් යුතුකමක්. ඒකට මැදිහත් වුණ ගරු සභාපතිතුමාට, ගරු ඇමතිතුමාට බොහොම ස්තුතිවන්ත වෙනවා. ඒ පළමුව තෝරාගත් ස්ථානයට වැඩිය ඉතාමත්ම සාර්ථක හොඳ තැනක් තමයි දෙවනුව තෝරලා තියෙන්නේ. යන්න පුලුවන් තැනක්, වාහන යන්න පුලුවන් තැනක් ඒක. ඉතාමත් සුන්දර විදියට ඒක නිර්මාණය කිරීමේ හැකියාවක් තියෙනවා ගරු සභාපතිතුමා. ඒ නිසා මොන සභාවල් අවුරුදු ගාණක් තිස්සේ උත්සාහ කරත් ඒ උත්සාහයේ ප්‍රතිඵල හැටියට මේ කාලයේ මේක ආරම්භ කිරීම පිළිබඳව මම බොහොම සතුටු වෙනවා. ඒක ප්‍රකාශ කළ යුතුයි. පෝද්දල සුසාන භූමියේ ආදාහනාගාරය හදන්න කතා කරේ හදන්න වෙන තැනක් නැති නිසා. නමුත් ඇමතිතුමා මැදිහත් වෙලා මේ ලබා දීපු ස්ථානය පිළිබඳව ඇත්තටම එතුමාට අපේ මුළු සභාවේම ගෞරවය බොහොමත්ම පුද කරන්න ඕන. ඒ වගේමයි ඔබතුමත් ඒකට මැදිහත් වුණා. මගේ අවංක ස්තුතිය ඇත්තටම ඔබතුමාට පුද කරනවා. ඒක කළ යුතුයි. දෙයක් පටන් ගත්තොත් අවසන් වෙනකම් ඒක යන්න ඕන. ඒක කළ යුතුයි කියන තැන තමයි මම ඉන්නේ. ඒ ස්ථානය තෝරා ගැනීම පිළිබඳවත්, ඒකට මුදල් හොයා ගෙන මේක ආරම්භ කිරීම පිළිබඳවත් ගරු ඇමතිතුමාට සහ ගරු සභාපතිතුමා ඇතුළු සියලුම දෙනාට ස්තුතිය පුද කරනවා.

(ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා සභාවට සහභාගි වීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ වගේම මම ඉල්ලා සිටිනවා ඔබතුමාගෙන්, මොකද ඇත්තටම අපිට පර්චස් 80 ක ප්‍රමාණයක් තමයි ලැබෙන්නේ. ඒ පර්චස් 80 කණ්ඩිය කැපිලා එන්නේ. ඉස්සරහ පැත්තෙන් නම් කණ්ඩියක් එන එකක් නැහැ. තුන් පැත්තකින් කණ්ඩියක් එන්න පුලුවන්. ඒක බලලා අවශ්‍ය විදියට අපි කරනවා. ඒකෙදි මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා උද්‍යාන අලංකරණය පිළිබඳව ඔබතුමාට විශේෂ හැකියාවක් තියෙන නිසා මන්ත්‍රීවරයෙක් විදියට ඒ කටයුත්ත කරලා දෙන්න. අපි දකිනවා

බද්දේගම ආදාහනාගාරයට ගියාම බොහොම දැකුම්කළු විදියට තමයි ඒක පිහිටලා තියෙන්නේ, පරිහරණය වෙන්නේ. ඉතිං ඒක හින්දා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා ඒ කටයුතු ටික ඔබතුමා මන්ත්‍රීවරයෙක් විදියට නෙමෙයි, ඔබතුමා ඒ ක්ෂේත්‍රයේ නිපුණ කෙනෙක් විදියට ඒක භාර අරගෙන අදාළ කටයුත්ත කරලා දෙන්න කියන ඉල්ලීම මම මේ අවස්ථාවේදී කරනවා.

ඒ වගේම දෙවැනි කාරණය තමයි මෙතන පොළ භූමිය සම්බන්ධ කාරණාව. ඒකෙන් අපි බලාපොරොත්තු වුණේ ඇත්තටම තට්ටු තුනක ගොඩනැගිල්ලක් හදන්න. තට්ටු හතරයි බිම් මහළත් එක්ක. නමුත් අපිට විශාල මුදලක් වැය වෙනවා ඒ විදියට හැදුවම. අපිට මේ වැඩේ ඉවර කරන්නත් ඕන. කලින් එකට බැලුවම මිලියන දෙසීය තිහක් විතර යනවා. අපි දළ වශයෙන් තට්ටුවක් දෙකක් හරි අඩු කරලා මිලියන 100 ක වගේ මුදලක් යන විදියට, කෝටි 10 ක් යන විදියට කරන්න බැලුවේ. අපිට කරන්න පුලුවන් සීමාවකුත් තියෙනවා. සභාව ණය කරලා අපිට යන්න ඕනත් නැහැ. ඒක හින්දා මිලියන 100 ක වගේ මුදලක් යන්න තට්ටු දෙකකුයි, රූෆ් ටොප් එකක් එක්ක හදන්නේ. අපිට රැස්වීම් පවත්වන්න පුලුවන් තැනක් විදියට හදන්නේ. අපිට හිතෙනවා ඒක ඒ මුදලෙන් කරන්න පුලුවන් කියලා. ඒක අපි බලාපොරොත්තු වෙනවා. ඒකෙත් මූලික වැඩ මේ වෙන විට ආරම්භ කරලා තියෙන්නේ. මම හිතනවා ඒකෙත් මුල්ගල් තැබීම මේ වර්ෂය අවසන් වෙන්න කලින් කර ගන්න පුලුවන් වේවි කියලා. ඒ සඳහා මම ලේකම්තුමාට සම්පූර්ණයෙන්ම වැඩේ භාර දීලා තියෙන්නේ. මේ අනිත් සියලුම කාරණා වලට වැඩිය ඔය කාරණා දෙක තමයි අපිට කරන්න තියෙන්නේ.

ඊළඟට සභා ගොඩනැගිල්ල පිළිබඳ කාරණය තියෙන්නේ. සභා ගොඩනැගිල්ලත් අපිට හදන්න ඕන. අපි ඊයේ ගියා, ලේකම්තුමයි, මමයි, තාක්ෂණ නිලධාරිතුමයි හබරාදූවේ අලුතින් ඉදිකරපු සභා ගොඩනැගිල්ල බලන්න. ඒ වගේම මට ආරංචිය ලැබුණා රත්ගම අලුතින් ඉදිකරපු සභාවත් ඉතාමත් දැකුම්කළු විදියට තියෙනවා කියලා. උප සභාපතිතුමත් ඒක කිවුවා. ඉතිං ඒක හින්දා අපි ටිකක් බලලා ඒ සැලැස්මට හරියන මුදල බලලා ඒක කරමු. ඒකත් සාමාන්‍යයෙන් අර වගේ මුදලකට යන්න පුලුවන් මට්ටමේ තියෙනවා. රමේෂ් පතිරණ ඇමතිතුමා ඒකට ලස්සන සැලැස්මක් හදලා ඉල්ලුවා. ඒකට මුදල් කොහොම හරි හොයා ගන්න ඕන. ඔබතුමන්ලා දන්නවා අලුත් රජය යටතේ අලුතින් ඉදිකිරීම් සිදු කිරීම තාවකාලිකව නවත්වලා තියෙන්නේ. පුර නැගුම ව්‍යාපෘතිය යටතේ තමයි අනිත් හැම සභාවක්ම තම තමන්ගේ ගොඩනැගිලි ඉදිකර ගන්නේ. නමුත් ඒ අවාසිය අපිට තියෙනවා. රමේෂ් පතිරණ ඇමතිතුමා පොරොන්දු වුණා එතුමා කොහොම හරි උත්සාහයක් දරලා මේකට අනුමැතිය ලබා ගන්නම් කියලා. ඉතිං ඔය කාරණා තමයි ප්‍රධාන කාරණා තුනක් හැටියට අපි ඉදිරි අවුරුදු එකහමාරක කාලය පුරාවට කරන්න උපරිම උත්සාහ දරන්නේ. ඔය කාරණා තුන ප්‍රධාන වශයෙන් අපි සාක්ෂාත් කර ගන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** ගරු සභාපතිතුමනි, අපි ඒ උත්සාහවල් හැම දේකටම ගරු කරනවා. මොකද කොහෙත් හරි පටන් ගැනීමක් තියෙන්න ඕන. මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා ඇත්තටම මේකෙදී මේ සාකච්ඡාවල් වලට සභාවම කැඳවා ගන්නවා නම්, සියලු පක්ෂ වලින් විසි දෙදෙනාම කැඳවා ගන්නවා නම් මේ කිසිම ප්‍රශ්නයක් නැහැ. මොකද, කාගෙත් අදහස් එනවා. මම නිකං මගේ අදහසක් විදියට විතරක් කියනවා ඇත්තටම අද මේ භූමිය කියන්නේ ලියලන එකක් නෙමෙයි. ඒ හින්දා භූමියෙන් උපරිම ප්‍රයෝජන ගන්න ඕන. ඔබතුමන්ලාම අපිම යෝජනා කරලා සොයිල් ටෙස්ටින් එකක් පවා කරලා තියෙනවා. අපිට තට්ටු හතරකට ඒක නිර්මාණය කරලා අපේ සල්ලි වලින් එක තට්ටුවද හදන්න පුලුවන් ඒක අපි විවෘත කරමු. ඒක තව කාලයකදී කඩලා හදන්න යන්න බැහැ. ඒ ගෞරවය සම්පූර්ණයෙන්ම රමේෂ් පතිරණ ඇමතිතුමාට, සභාපතිතුමා විදියට ඔබතුමාට, අපි කාටත් එනවා. ඒකේ අඩුපාඩුවක් වෙන්නේ නැහැ. මම හිතන්නේ එතුමාට වුණත් මේ දේ පහදලා දුන්නා නම් මම හිතන්නේ තේරුම් ගනීවි.

ඊළඟට ආදාහනාගාරය ඉතාම වැදගත්. මම මේ යෝජනාව කාලයකට උඩදී ගෙනාවා. ඇත්තටම දැන් එතුමා ඒක පළ දරන්න වැඩ කරපු එකට සන්තෝෂයි. මොකද හේතුව ඒ ආණ්ඩුව කාලෙදිම තමයි අපි අක්කර පහක් අරගෙන මේවා කරන්න කියලා මැනුම් කටයුතුත් කරේ. රමේෂ් පතිරණ ඇමතිතුමා ඒ කාලෙත්, හිටපු කාලයෙත් කරේ. ජයතිලක මහත්මයාලාම තමයි කරේ. ඉතිං ඇත්තට අද දවසේත් ඔබතුමන්ලාට පුලුවන් නම් නිකං හරි කියලා, සාමුහිකව කියලා ගන්න. මේක ඉතා වැදගත්. ඒක ගැන කතා දෙකක් නැහැ. පර්චස් 80 නෙමෙයි 50 ක් තිබුණත් ඒක වැදගත්. එතුමාට කියලා පුලුවන්නම් අපේ කුණු මේවා එකටයි, ඒ දෙක තුනටම ගන්න මේවා කරන්න. මේ සාකච්ඡාවලදී හරිම හොඳයි කියලා හිතෙනවා හැම කෙනෙක්ගේම අදහස් ගත්තානම්. මොකද හේතුව මේක මේ රටේ ප්‍රධාන ප්‍රශ්නයක්. බලප්‍රදේශයේ ප්‍රශ්නයක්. ආයතන 19 න්ම අපිට විතරයි ආදාහනාගාරයක් නැත්තේ. ඇත්තටම දැන් අපිට විතරයි නැත්තේ. ඇත්තටම දැන් මතක් කරා බද්දේගම ගැන. බද්දේගම ඇත්තටම ලැන්රෝයි මැතිතුමා ඉන්න කාලේ ඒකට ගියාම හග්ගල ගාර්ඩන් එකට ගියා වගේ. හැබැයි ඊට පස්සේ ඇත්තටම ඒක වැටුණා. එතුමාට නඩුවකුත් වැටුණානේ මල් අත්තක් කැපුවා කියලා. වහළ පවා හේදෙව්වා. එහෙම ටිකක් ඉඩ් අමින් සයිස් එකෙන් ඒ වැඩ ටික කෙරෙව්වායින් ලස්සනට තිබුණා. ඉතිං දැන් ඇත්තටම ඒ වගේ වෙන්න ඕන. ඒක අවසන් කටයුතු කරන තැනක්. මම හිතන්නේ ඔබතුමාගෙන් මම ඉදිරියට ඉල්ලා සිටිනවා මේ කෙරෙන දේවල් වලදී අපිව කැඳවන්න.

(ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය සභාවට සහභාගි වීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් එදා වුණේ අබේසේකර මන්ත්‍රීතුමා මේකයි. ඇත්තටම මට සතියකට කලින් කිව්වා බදාදා උදේ 08.30 ට එනවා කියලා. ඒපාර එතුමාට විශේෂ වැඩක් යෙදිලා ඊට පස්සේ දවසේ කතා කරලා කිව්වා ඒක අවලංගුයි කියලා. අපි ඒ වෙන කොට කොමසාරිස්තුමාටයි, ඉංජිනේරුතුමාටයි ඔක්කොටම කියලා තිබුණේ. නමුත් ඊට පස්සේ දවසේ කිව්වේ ඒක අවලංගුයි එන්න විදියක් නැහැ කියලා. ඊට පස්සේ අඟහරුවාදා රෑ 07.30 ට විතර කතා කරලා කිව්වා අර මට තිබුණ වැඩේ අවලංගු වුණා කියලා කොරෝනා ප්‍රශ්නයත් එක්ක. මට ඕන නම් හෙට උදේ එන්න පුලුවන් කියලා කිව්වා. බොහොම ක්ෂණයෙන් මම එවෙලේ පළාත් පාලන කොමසාරිස්තුමාටයි, ඉංජිනේරුතුමාටයි කතා කරලා වැඩේ කර ගත්තා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමාට කියන්න ගියේ ප්‍රේමලාල් අබේසේකරට එන්න කියන්න කියපු එක නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපේ අදහස තිබුණේ පොදුවේ ඒක සභාවෙන් කරන්න. මම ලේකම්තුමාට කිව්වා සියලු මන්ත්‍රීවරුන්ව දැනුවත් කරන්න. එහෙම තමයි අදහස තිබුණේ. නමුත් බොහොම ක්ෂණයෙන් ඒක කරන්න වුණා.

(ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**<u>(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම.</u> ඃ- නැත**

**<u>(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න</u> ඃ- නැත**

**<u>(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා</u>**

**<u>ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමාගේ යෝජනා</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2021 වර්ෂය සඳහා බදු හා ගාස්තු පැනවීමට අදාළ යෝජනා තියෙන්නේ. ඔබතුමන්ලාට මේකේ එකින් එක සඳහන් කරන්න දෙයක් නැහැ. ඒක වාර්ෂිකව කළ යුතු කාරණයක්. අපි වැඩිවීම් කරලා නැහැ. සම්පූර්ණයෙන්ම පසුගිය අයවැය සාකච්ඡා වලදී ගනිපු තීරණම තමයි ක්‍රියාත්මක කරලා තියෙන්නේ. මේකේ වැඩිවීම් මුකුත් නැහැ. පසුගිය වර්ෂයේ තිබ්බ්ච ඒ මුදලම තමයි මේ වර්ෂයේදීත් අපි යෝජනා කරලා තියෙන්නේ. මොකක් හරි ගැටළුවක් තියෙනවා නම් අහන්න. ගරු ජනාධිපතිතුමාගේ තීරණයක් මත කොහොමත් අපි අවුරුදු දෙකක් යනකම් බදු වැඩි කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. ඒ බදු මුදල එහෙමමයි. මට අමතක වුණා කියන්න. අපි ආදාහනාගාරය සෑදීම පිළිබඳව ලබන වර්ෂයේ අයවැයට ඇතුල් කරා. අපිට මේ වර්ෂයේදීත් ඒකෙ කොටසක් කරන්න වෙනවා. ණය මුදලකට යන්නේ නැහැ. මුද්දර ගාස්තු වලින් කරන්නේ. සෞඛ්‍ය වලට වෙන් කරපු මුදල් ගන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඊළඟට ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලනවා. අපි මේ බදු අය කරනවා කියන එකේ තේරුම අපි උපකල්පනයක් එක්ක කරන්නේ. මේ වෙළඳ ව්‍යාපාරයෙන් මෙච්චර හම්බකර ගන්න පුලුවන් එහෙම කියලා. ඔබතුමා මේක පිළිබඳව අහන්න. මටත් මේක පිළිබඳව හරියටම දැන ගන්න බැරි වුණා. මේ ටවර් වලින් ලක්ෂ ගණන් හම්බ කරනවා මේ ආයතන. මේකටත් රුපියල් තුන්දාහයි. මම හිතන්නේ ඔබතුමන්ලා කාටත් ඒක තේරෙනවා ඇති. මේකටත් රුපියල් තුන්දාහයි ගන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක අබේසේකර මන්ත්‍රීතුමා මෙහෙමයි. ඒකට අපි අතුරු ව්‍යවස්ථාවක් හදාගන්න වෙනවා. ඒ සඳහා වෙනම. උදාහරණයක් දැන් ත්‍රීරෝද රථ සංගම්වලටත් එකක් හදන්න මම කියලා තියෙන්නේ. ඒවාට අපි වෙනම අතුරු ව්‍යවස්ථාවක් හදා ගන්න වෙනවා. ඒකට වෙනම උපලේඛනයකින් යන්න වෙනවා. මේක ගැන ආදායම් පරීක්ෂකතුමාට කියලා තියෙන්නේ. ඔබතුමා කියන කාරණයට වෙනම අතුරු ව්‍යවස්ථාවක් යන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේක අපි ඒකට කියලා යවන්න ඕන නැහැ. අපි මේ සභාවෙන් එක්තරා අන්දමක යෝජනාවක් කරලා ආණ්ඩුවට කියමු. අපේ ඇමතිතුමාට කියමු. රටේම තියෙන සභාවල් වලින් ගේන්න කියන්න. ලොකු ආදායමක් ගන්න පුලුවන්. යෝජනාවක් විදියට සම්මත කරලා යවමු මේක.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, දැන් අපි මේ සම්ප්‍රේෂණ කුළුණු ගැන කතා කරන්නේ. එක සමාගමක ඒවා නෙමෙයි, සමාගම් කිහිපයකම මේවා තියෙන නිසා ඒකට වැඩපිළිවෙලක් හදමු. දැන් හිරිඹුරගම, ජස්ටින් කන්දේ තියෙන කුළුණේ ආයතන පහක විතර ඒවා සවිකරලා තියෙනවා. දැන් ඒක හින්දා ඒකට අවශ්‍ය මොකක් හරි දෙයක් කරන්න. ඒ අය අතුරු බදු දීලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ අය දැන් කරන්නේ විදුලි සන්දේශ නියාමන කොමිෂන් සභාව හරහා මේ සම්බන්ධ ගනුදෙනු ඔක්කොම. භූමිය අපේ. ඒ නිසා ඒකේ වෙනත් කාර්යයක් වෙනවා නම් ඒ දැනුවත් වීම අපිට වෙන්න ඕන. අපි ගිවිසුමට යන ආයතන වෙනස් වෙනවානේ. කුළුණට විතරක් බද්ද ගැහුවම ඒ අයට අතුරු බදු යන්න බැහැනේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඒ සමාගමට අපි ලිඛිතව යවලා අහමු ඔය ගොල්ලන්ගේ කුළුණේ සවිකරලා තියෙන වෙනත් ඒවා මොනවද කියලා. අපි ඊපාර ඒකට ක්‍රමවේදයක් හදමු.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, දැන් මේ වෙලාවේ මතු කරපු කාරණයේදී කුළුණු සම්බන්ධයෙන් ගත්තම අපිට සභාවේ යෝජනාවක් සම්මත කරලා විදුලි සංදේශ කොමිෂන් සභාවෙන් ඉල්ලීමක් කරමු අපේ බලප්‍රදේශයට අදාළව ඒ අය ලියාපදිංචි කරනවා නම් ඒකට සභාව දැනුවත් කරන්න කියලා. එතකොට හරි පැහැදිළියි. එතකොට අතුරු බදු දුන්නත් ඒ ආයතනය අවසර ගන්න ඕන කොමිෂමෙන්නේ. කොමිෂමෙන් අවසර ගන්න වෙලාවේදී ඒ බලප්‍රදේශයට අදාළව අපිව දැනුවත් කරනවා නම් සමාගම් වලින් අහන්න දෙයක් නැහැ. ඒ අය අපිට දෙනවද නැද්ද කියලා අපිට තහවුරුවකුත් නැහැනේ. අපිට කරන්න පුලුවන් හොඳම දේ තමයි විදුලි සන්දේශ නියාමන කොමිෂන් සභාව දැනුවත් කරලා බලප්‍රදේශය ඇතුලේ කරන ඒවා ගැන අපිව දැනුවත් කරන්න කියලා ඉල්ලීමක් කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඊට පරිබාහිරව හොයලා බලන්න ඔබතුමා අපිට එහෙම බද්දක් අය කරගන්න පුලුවන් ක්‍රමවේදයක් තියෙනවද, නැද්ද කියලා. අපිට පුලුවන් නම් අතුරු ව්‍යවස්ථාවකින් හරි ඒක ඇතුලත් කරන්න පුලුවන්. අතුරු ව්‍යවස්ථාවකට අපිට ඒක ඇතුලත් කරන්න පුලුවන්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අරක තමයි නිවැරදිම ක්‍රමවේදය වෙන්නේ. අනිවාර්යයෙන්ම ඒ අය ලියාපදිංචි වෙන්න ඕන. එතකොට ඒ ලියාපදිංචි කිරීම ගැන අපිට දැනුවත් කරන්න කියලා දැනුම් දෙනවා නම් හරි. රාජ්‍ය ආයතනයක් හැටියට ඒක ඒ අය කරාවි. එහෙම ඉල්ලීමක් කරන්න කියලා යෝජනා කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට විදිමත් යෝජනාවක් ලබන සභාවට ඉදිරිපත් කරන්න.

**01.** 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 146 (1) වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ප්‍රධාන කාර්යාලයට අයත් ප්‍රදේශය තුළ දියුණු කළ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද වරිපනම් පනවා ඇති ප්‍රදේශයේ පිහිටි සෑම නිශ්චල දේපළක් සඳහා වාර්ෂික වටිනාකම 2016 වර්ෂයේදී බලපැවැත් වූ තක්සේරුව 2021 වර්ෂයේ වාර්ෂික වටිනාකම ලෙස පිළිගැනීමටත්, පෝද්දල උප කාර්යාලයීය බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශය ලෙස ප්‍රකාශයට පත් කර ඇති ප්‍රදේශය තුළ පිහිටා ඇති වරිපනම් බදු පනවා ඇති ප්‍රදේශයේ පිහිටි සෑම නිශ්චල දේපළක් සඳහාම වරිපනම් බදු අයකිරීම සඳහා වන වාර්ෂික වටිනාකම ලෙස 2017 වර්ෂයේ නියම කරන ලද තක්සේරුව පිළිගැනීමටත්, එකී පනතේ 134 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව ඉහතින් විස්තර කරන ලද වරිපනම් ප්‍රදේශය තුළ පිහිටි සෑම නිශ්චල දේපළකම වාර්ෂික වටිනාකමින් 7% බැගින් වරිපනම් බද්දක් පනවා අය කිරීමටත්, එකී පනතේ 134 වැනි වගන්තියේ (6) වැනි උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව යථෝක්ත වාර්ෂික වරිපනම් බද්ද 2021 මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනයන් වලින් අවසන් වන කාර්තු 04 තුළදී සමාන වාරික 04 කින් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු බවටද, එකී පනතේ 134 (7) වැනි වගන්තිය ප්‍රකාර එකී වාර්ෂික බදු මුදල් වර්ෂ 2021 ක් වූ ජනවාරි මස 31 දින හෝ ඊට ප්‍රථම ගෙවුවහොත් එම වර්ෂයේ වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක්ද දෙනු ලැබෙන අතර එක් එක් කාර්තුවේ පළමු මාසය තුළ ගෙවනු ලබන විට කාර්තුවට අදාළ මුදලින් සියයට පහක (5%) වට්ටමක්ද දිය යුතු බවටත් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**02.** 2013.05.17 වැනි දින අංක 1811 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූ ද, දකුණු පළාතේ පළාත් සභාව විසින් අනුමත කරන ලද බව 2014.08.29 වන දින අංක 1878 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළකරන නිවේදනයෙන් ප්‍රකාශයට පත්කරන ලද්දාවූ ද, 2015.04.21 වන දින පවත්වන ලද මහා සභා රැස්වීමේදී ප්‍රාදේශීය සභා සම්මත අතුරු ව්‍යවස්ථා පිළිගෙන 2015.09.11 වන දින සිට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු 149 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව, පහත උපලේඛනයේ I වැනි තීරුව දැක්වෙන ව්‍යාපාරය/කර්මාන්තය සම්බන්ධයෙන් වන විට දී එයට ඉදිරියෙන් II තීරුව දැක්වෙන එකී ව්‍යාපාරය කර්මාන්තය/ කර්මාන්තය පවත්වාගෙන යන ස්ථානයේ හෝ පරිශ්‍රයේ වාර්ෂික වටිනාකමට අදාළව දැක්වෙන බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමටත්, එකී උපලේඛනයේ සඳහන් කර්මාන්තය / ව්‍යාපාරය 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්ය සඳහා ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තා වූ හෝ එම මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ හෝ පිළිගන්නා වූ හෝටලයක් /ආපනශාලාවක්/ නවාතැන්පළක් වන අවස්ථාවක ඉහත කී උපලේඛනයේ II වැනි තීරුවේ කුමක් සඳහන් වුව ද ඒ හෝටලය හෝ ආපන ශාලාව හෝ නවාතැන්පළ හෝ පවත්වාගෙන යනු ලබන ස්ථානය වෙනුවෙන් නිකුත් කරනු ලබන බලපත්‍රය සඳහා වන ගාස්තුව ඒ හෝටලය හෝ ආපනශාලාවේ හෝ නවාතැන්පළේ 2021 වර්ෂය තුළ ලැබූ ආදායමින් 1% ක් විය යුතු බව යෝජනා කරමි.

**උප ලේඛනය**

| **I තීරුව** | | **II තීරුව** | | |
|---|---|---|---|---|
| **අනු අංකය** | **කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය** | **වාර්ෂික වටිනාකම රු.750.00 නොඉක්මවන අවස්ථාවක බලපත්‍ර ගාස්තුව රු. ශත** | **වාර්ෂික වටිනාකම රු.750.00 ඉක්මවන එහෙත් රු.1500.00 නොඉක්මවන අවස්ථාවක බලපත්‍ර ගාස්තුව රු. ශත** | **වාර්ෂික වටිනාකම රු.1500.00 ඉක්මවන අවස්ථාවක බලපත්‍ර ගාස්තුව රු. ශත** |
| 01 | මාළු විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 02 | මස් විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 03 | සිසිල් බීම කර්මාන්තශාලා | 500.00 | 750.00 | 1000.00 |
| 04 | කොණ්ඩා සැකසීමේ ස්ථාන, බාබර් සාප්පු හා සැලුන්හල් සහ රූපලාවන්‍ය මධ්‍යස්ථාන | 500.00 | 750.00 | 1000.00 |
| 05 | බේකරි | 500.00 | 750.00 | 1000.00 |
| 06 | කිරිපට්ටි | 500.00 | 750.00 | 1000.00 |
| 07 | පිහිණුම් තටාක | 500.00 | 750.00 | 1000.00 |
| 08 | අයිස් කර්මාන්තශාලා | 500.00 | 750.00 | 1000.00 |
| 09 | බත්කඩ, ආපනශාලා සහ තේ හෝ කෝපි කඩ | 500.00 | 750.00 | 1000.00 |
| 10 | හෝටල් | 500.00 | 750.00 | 1000.00 |
| 11 | නවාතැන් පොළවල් / ලැගුම්හලක් (Resturant) | 500.00 | 750.00 | 1000.00 |
| 12 | ලොන්ඩරි | 500.00 | 750.00 | 1000.00 |
| 13 | කර්මාන්තශාලා | 500.00 | 750.00 | 1000.00 |
| 14 | සංචාරක වෙළඳුන් විසින් ආහාර පාන ද්‍රව්‍ය වෙළඳාම් කිරීම | 500.00 | 750.00 | 1000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 15 | ඉදිකිරීම් ද්‍රව්‍ය ආශ්‍රිත කර්මාන්ත ස්ථාන හා ඉදිකිරීම් ද්‍රව්‍ය ගබඩා ස්ථාන | 500.00 | 750.00 | 1000.00 |
| 16 | යෝගට් නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 17 | උත්සව අවස්ථාවන්ට ආහාර සැකසීම | 500.00 | 750.00 | 1000.00 |
| 18 | ශීතකල මස් හෝ මාලු විකිණීම, ගබඩා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 19 | ඌරු කොටුවක් පවත්වාගෙන යාම / එවැනි ඇතිකිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 20 | මස් පිණිස, බිත්තර පිණිස, කුකුළන් කිකිළියන් ඇති කිරීම (කුකුළු කොටුවක් පවත්වාගෙන යාම) | 500.00 | 750.00 | 1000.00 |
| 21 | අවමංගල සේවා සපයන ස්ථානයක් (මල් ශාලාවක්) පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 22 | කාමර පහසුකම් ලබා දීම | 500.00 | 750.00 | 1000.00 |
| 23 | ක්ෂණික ආහාර විකිණීම හා නිපදවීම (පේස්ට්‍රි ෂොප්) හා ස්නැක් බාර් හෝ කිරි හලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 24 | ආහාර වශයෙන් අනු භවය සඳහා බීජ වර්ග (අංකුර සහිත මුං ඇට) පැකට් කර විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 25 | අයිස්ක්‍රීම්, බටර්, යෝගට් අලෙවිසැලක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 26 | සකස් කරන ලද ආහාර වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 27 | සංචාරක සත්කාරක නිවහනක් හෝ ආගන්තුක නිවාසයක් පවත්වා ගෙන යාම (Villas) | 500.00 | 750.00 | 1000.00 |
| 28 | සිරප් හෝ පළතුරු බීම වර්ග නිපදවීම, ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 29 | ජෑම්, සෝස්, සිරප්, පුඩිං, ජෙලි නිපදවීම හෝ ගබඩා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 30 | විනාකිරි නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 31 | රස කැවිලි නිපදවීම, කේක් වර්ග නිපදවීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 32 | මිරිස්, ධාන්‍ය වර්ග, පිටි, මාංශ, බෙහෙත් ද්‍රව්‍ය කෙටීමේ ඇඹරුම්හලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 33 | පානීය ජලය බෝතල් කර ගබඩා කිරීම හා විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 34 | පපඩම් හෝ නූඩ්ල්ස් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 35 | කරවල, ජාඩි වේලීම හෝ ගබඩා කිරීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 36 | තේ කුඩු විකිණීම හා පැකට් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**03.** 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වගන්තියේ (1) වැනි උප වගන්තියේ ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර, බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ I තීරුවේ සඳහන් එක් එක් කර්මාන්ත වෙනුවෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ එක් එක් කර්මාන්ත පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකම අනුරූප වන තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2021 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවටත්, එකී කර්මාන්ත බද්ද 2021 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට යෝජනා කරමි.

## උපලේඛනය

| | I වැනි තීරුව | II වැනි තීරුව | | |
|---|---|---|---|---|
| අනු අංකය | කර්මාන්තයේ ස්වාභාවය | වාර්ෂික වටිනාකම රු.750/-ට වැඩි නොවන රු. ශත | වාර්ෂික වටිනාකම රු.750/- සිට රු.1500 දක්වා රු. ශත | වාර්ෂික වටිනාකම රු.1500 ට වැඩි ස්ථාන රු. ශත |
| 1 | ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 2 | වෙල්ඩින් වැඩපළක් හෝ ඩ්‍රිල් වැඩපළක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 3 | බලවේග යන්ත්‍ර මගින් නූල් නිෂ්පාදනය , පුළුන් සකස් කිරීම හා රෙදි විවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 4 | ස්ක්‍රීන් ප්‍රින්ටින් වැඩපළක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 5 | කොන්ක්‍රීට් සිලින්ඩර් හෝ වෙනත් සිමෙන්ති භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 6 | සිමෙන්ති බ්ලොක්ගල්, මල් පෝච්චි , බීරළු නිපදවීම හෝ විකිණීම ස්ථානයක් පැවැත්වීම | 500.00 | 750.00 | 1000.00 |
| 7 | වායු සමීකරණ යන්ත්‍ර, ශීතකරණ, පරිගණක යන්ත්‍ර, සෙලියුලර්, අධිශීතකරණ, දුරකථන අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 8 | මෝටර් කොයිල් එතීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 9 | පොහොර වර්ග, කෘෂි රාසායනික ද්‍රව්‍ය, පොහොර නිපදවීම, සත්ව ආහාර වර්ග නිපදවන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 10 | ගල්වලක් හෝ අතින් ගල් කඩන ස්ථානයක් පැවැත්වීම (කබොක්, බොරළු, හෝ කළු ගල් ) | 500.00 | 750.00 | 1000.00 |
| 11 | බෝට්ටු එන්ජින් අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 12 | වී පාහින මෝලක් පවත්වාගෙන යාම/ධාන්‍ය ඇඹරීම | 500.00 | 750.00 | 1000.00 |
| 13 | විදුලි බලයෙන් හෝ අත් යන්ත්‍ර මගින් ක්‍රියා කරන මුද්‍රණාලයක් පැවැත්වීම. | 500.00 | 750.00 | 1000.00 |
| 14 | ගුවන් විදුලි යන්ත්‍ර, රූපවාහිනී යන්ත්‍ර, කැමරා වීඩියෝ, ඔරලෝසු අලුත්වැඩියා කිරීමේ, විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 15 | අතින් පාවහන් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 16 | ගල් ස්මාරක, සිහිවටන පුවරු සෑදීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 17 | විදුලි උත්පාදක යන්ත්‍ර (ජෙනරේටර්) කුලියට දීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 18 | ලී වෙළඳසැලක් පවත්වාගෙන යාම, යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම, ලෑලි සකස් කිරීම, පදම් කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 19 | පොල් පරාල හා යට ලී ඉරන, ගබඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 20 | දර මඩුවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 21 | යාන්ත්‍රික හෝ යාන්ත්‍රික නොවන වඩු මඩුවක් පවත්වාගෙන යාම/වඩුකර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 22 | මැටි බඳුන් නිපදවීම, ගබඩා කිරීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (විසිතුරු මැටි බඳුන් /කෝප්ප) | 500.00 | 750.00 | 1000.00 |
| 23 | කම්මලක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 24 | වැලි ගොඩදැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 25 | ත්‍රිරෝද රථ මෝටර් සයිකල් සර්විස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 26 | පාපැදි අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් (වින්කලයක්) පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 27 | යකඩ කම්හලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 28 | විදුලි භාණ්ඩ ශීතකරණ හෝ මහන මැෂින් හා අමතර කොටස් විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 29 | විසිතුරු භාණ්ඩ හෝ කැටයම් භාණ්ඩ නිපදවීමේ, අලි කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 30 | සම් භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 750.00 | 750.00 | 1000.00 |
| 31 | කුෂන් වැඩපළක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 32 | වාහන ෂිට් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 33 | කිරුම් මිනුම් උපකරණ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 34 | අභ්‍යාස පොත් නිෂ්පාදනය කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 35 | වානේ ගෘහ භාණ්ඩ නිපදවීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 36 | කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිපදවීම හා ගබඩා කර තැබීම | 500.00 | 750.00 | 1000.00 |
| 37 | බෙලෙක් වැඩපළක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 38 | බලවේග රෙදි විවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 39 | සබන් නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 40 | විදුලි කාර්මික වැඩපළක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 41 | ඉදල්, කොහු, පාපිසි නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 42 | ගොඩනැගිලි ඉදිකිරීමේ උපකරණ බඳු දීමේ (පලංචි ආදිය) ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 43 | පැන්ට්‍රි කබඩ් නිපදවීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 44 | මැණික් ගල් කැපීමේ හා ඔප දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 45 | කොප්පරා නිපදවන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 46 | බහුකාර්ය වඩු කම්හලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 47 | සයිලන්සර් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 48 | ලෝහමය සුන්බුන් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 49 | උළු හෝ ගඩොල් පෝරණුවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 50 | යන්ත්‍ර මගින් කළුගල් කඩන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 51 | ලී බීරළු කැපීම | 500.00 | 750.00 | 1000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 52 | යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති ගඩොල්/කැටගල් කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 53 | ගල් මෝලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 54 | කොහු හා කොහු ලණුවලින් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 55 | තේ පෙට්ටි හෝ ලෑලි පෙට්ටි තැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 56 | මෙරට හෝ රට වේවැල්වලින් භාණ්ඩ නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 57 | බුරුසු නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 58 | පොල් කටු අඟුරු පිලිස්සීමේ විකිණීමේ හා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 59 | මෝටර් වාහන සඳහා බොඩි නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 60 | අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 61 | රබර් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 62 | ලොරි බොඩි සෑදීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 63 | ප්‍රචාරක දැන්වීම් පුවරු ඇඳීම / ප්ලාස්ටික් අංක තහඩු සෑදීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 64 | බෑග් නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 65 | අත පිසදමන කඩදාසි (සර්වියට් පේපර්ස්)/ බත් ඔතන කොළ (ලන්ච් ෂීට්) කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 66 | බැටරි චාර්ජ් කිරීම/ අළුත්වැඩියා කිරීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 67 | ෆයිබර් ග්ලාස්/ ප්ලාස්ටික් වැඩපලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 68 | කොහු මෝලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 69 | පොල් ලෙලි හා දැව පල් කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 70 | හුණු වැරටි පිලිස්සීම සඳහා පෝරණුවක් පවත්වාගෙනයාම ගබඩා කිරීම/ විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 71 | හම් වර්ග පදම් කරන කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 72 | හම් වර්ග වලින් හෝ රබර් වර්ග වලින් භාණ්ඩ නිපදවීම හෝ විකිණීමේ ස්ථානයක් පැවතීම | 500.00 | 750.00 | 1000.00 |
| 73 | රබර් බුෂ් සාදන වැඩපලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 74 | රබර් දුම් ගෙයක් පවත්වාගෙන යාම, රබර් ෂීට් නිපදවීම, රෝලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 75 | ගිණිකෙළි භාණ්ඩ, රතිඤ්ඤා නිපදවීම හෝ විකිණීම ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 76 | වාහන ගෑස් කිරීම හෝ ගෑස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 77 | ගෑස් ගබඩා කිරීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 78 | රෙදි පින්තාරු, මුද්‍රණය, සායම් දමන ස්ථානයක් (බතික් වැඩපළක්) පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 79 | ස්වර්ණාභරණ නිපදවීම අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 80 | ස්වර්ණාභරණ පාට කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 81 | මෙට්ට නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 82 | සබන් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 83 | ලෝහ භාණ්ඩ නිපදවීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 84 | පිත්තල භාණ්ඩ නිපදවීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 85 | ටයර්, ටියුබ් වොල්කනයිසිං කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 86 | අලුත් හෝ පරණ ටයර්, ටියුබ් ගබඩා කිරීම, කට්ටා කැපීම, විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 87 | කොප්පරා නිෂ්පාදනය කිරීම, ගබඩා කිරීම, විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 88 | පොල් තෙල් හෝ වෙනත් තෙල් වර්ග නිෂ්පාදනය කිරීම | 500.00 | 750.00 | 1000.00 |

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**04.** 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධි විධාන යටතේ හෝ ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියාත්මක කිරීම සඳහා පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවන් යටතේ හෝ බලපත්‍රයක් ලබා ගැනීම අවශ්‍ය නොවන්නා වූ පහත උපලේඛනයේ පළවන කොටසේ දක්වෙන යම් ව්‍යාපාරයක් බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පවත්වා ගෙන යන සෑම තැනැත්තෙකුම එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබූ ආදායම උපලේඛනයේ දෙවන කොටසේ පළමු තීරයේ දැක්වෙන පරාසය තුල පිහිටන විට එහි දෙවන තීරුවේ දැක්වෙන එයට අනුරූපීතව ඇති බදු මුදල 2021 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, බද්දට යටත් සෑම තැනැත්තෙක්ම එකී ව්‍යාපාර බද්ද 2021 වර්ෂයේ අප්‍රේල් 30 වන දිනට පෙර බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට යෝජනා කරමි.

**උප ලේඛන**

පළමු කොටස

1. කොමිස් ඒජන්තවරුන්
2. බ්‍රෝකර්වරු
3. වෙන්දේසිකරුවන්
4. නීතිඥයින්
5. උකස් බඩු ගන්නන්
6. ගණන් පරීක්ෂවරුන්
7. කොන්ත්‍රාත්කරුවන්
8. රියදුරු පුහුණු ආයතන
9. ප්‍රවාහන නියෝජිතයන්
10. විදේශීය රැකියා ඒජන්සි පවත්වන්නවුන්
11. නොතාරිස්වරුන්
12. මූල්‍ය ආයතන හා බැංකු
13. මුදල් සපයන්නන් හෝ මුදල් ණයට දෙන්නන්
14. ගෘහ නිර්මාණ ශිල්පීන්
15. රක්ෂණ නියෝජිතයන්
16. බැංකු පවත්වා ගෙන යාම (වාණිජ බැංකු හා ග්‍රාමීය බැංකු)
17. ස්වර්ණාභරණ වෙළෙඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
18. සම්ප්‍රේෂණ කුළුණක් පවත්වාගෙන යාම
19. ඉන්ධන පිරවුම්හලක් පවත්වාගෙන යාම
20. සාත්තු නිවාසයක්, විශේෂඥ වෛද්‍ය සේවා ස්ථානයක්, ශල්‍යාගාරයක් (පෞද්ගලික රෝහලක්) පවත්වා ගෙන යාම.
21. (රටබීම) මත්පැන් විකිණීම වයින් ස්ටෝර්ස් එකක් පවත්වාගෙන යාම
22. ඇඟලුම් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
23. අපනයනය සඳහා ඇඳුම් නිපදවීම

24. රෙස් තුණ්ඩු එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
25. පාවිච්චි කළ හා / හෝ අලුත් මෝටර් රථ ගෙන්වීම හා/හෝ අමතර කොටස් වෙළඳාම් කිරීම, ප්‍රදර්ශනය කිරීම
26. ස්පයිස් තෙල් වර්ග, පින්තූර කාඩ් වර්ග, කුළුබඩු වර්ග විකිණීම හා වැවීම (සංචාරකයින් සඳහා)
27. දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.
28. ආරක්ෂක සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම (පෞද්ගලික)
29. සුදු යකඩ හා දැව වලින් භාණ්ඩ නිපදවීම, ගබඩා කිරීම හෝ විකිණීම
30. ලී මෝලක් හෝ දැව ගබඩාවක් පවත්වාගෙන යාම
31. ජාත්‍යන්තර පාසලක් පවත්වා ගෙන යාම
32. සුපිරි වෙළඳසැලක් (ෆුඩ් සිටි) පවත්වාගෙන යාම
33. ත්‍රිරෝද රථ, යතුරු පැදි, මෝටර් වාහන විකිණීම
34. තේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
35. ට්‍රැවල් ඒජන්සියක් පවත්වාගෙන යාම
36. බැකෝ, ලෝඩර් යන්ත්‍ර , බැකෝ යන්ත්‍ර , ඩෝසර් හා මෝටර්ගේඩර් යන්ත්‍ර මාර්ග තලන හා පස් තලන යන්ත්‍ර , ට්‍රැක්ටර් හා ටිපර් කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍ර, කුලියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
37. පොලිතින් බෑග් නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තැබීම ව්‍යාපාරයක් පැවැත්වීම
38. සිනමා ශාලාවක් පවත්වාගෙන යාම
39. වාහන දුම් පරීක්ෂා කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
40. රක්ෂණ සමාගමක් පවත්වාගෙන යාම
41. සැපයුම්කරුවන්
42. දේපළ වෙළඳාම් කිරීමේ සමාගමක් පවත්වාගෙන යාම
43. වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
44. ලොතරැයි නියෝජිතයින්
45. පෞද්ගලික අධ්‍යාපන පන්ති පවත්වාගෙන යාම
46. පෞද්ගලික පෙර පාසල් පැවැත්වීම
47. රැකියා ඒජන්තවරු
48. උත්සව පැවැත්වීම සඳහා ශාලාවක් පවත්වාගෙන යාම
49. උත්සව භාණ්ඩ කුලියට දීම
50. සිවිල් ඉංජිනේරු සම්බන්ධ උපදේශක සේවා සැපයීම
51. පෞද්ගලික හෙද විද්‍යාලක් පවත්වාගෙන යාම
52. පොල් එකතු කිරීමේ හෝ තොග හෝ සිල්ලරට විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
53. සහල් තොග හෝ සිල්ලරට විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
54. ගෘහ භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
55. සාප්පු බඩු, මනි බඩු , සුවඳ විලවුන් ගබඩා කිරීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
56. පාපැදි, මෝටර් සයිකල් හෝ ත්‍රී රෝද රථ අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
57. විසිතුරු භාණ්ඩ හෝ කැටයම් භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පැවැත්වීම
58. බුලත්, පුවක්, කොහු, ඉදල්, කෙසෙල් කැන්, පලා වර්ග, මැටි භාණ්ඩ, තැඹිලි විකිණීම (සාමාන්‍ය වෙළෙඳාම)
59. ඉංග්‍රීසි බෙහෙත් බඩු විකුණන (ෆාමසි) ස්ථානයක් පවත්වාගෙන යාම.
60. සිංහල බෙහෙත් බඩු විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම
61. ඉංග්‍රීසි හෝ සිංහල බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම
62. දන්ත චිකිත්සාගාරයක් දත් බඳින ස්ථානයක්, ශල්‍යාගාරයක් එක්ස්රේ යන්ත්‍රයක් පවත්වාගෙන යාම
63. විකිණීම සඳහා බිම් මල් හෝ වෙනත් මල්, එළවළු, පළතුරු, පැල වර්ග බෙහෙත් පැළෑටි තවාන් කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම
64. ප්ලාස්ටික් භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
65. ජෝතිෂ්‍ය කටයුතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
66. මෙඩි ලැබ් එකක් (ලේ හා මුත්‍රා පරීක්ෂා කිරීමේ) ස්ථානයක් පවත්වාගෙන යාම
67. උළු, ගඩොල්, වැලි, ගල් සැපයීම හා විකිණීම
68. මනාලියන් හැඩ ගැන්වීම, කොණ්ඩා මෝස්තර දැමීම (බියුටි සැලූන්) උපකරණ කුලියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

69. රෙදි පිළි විකිණීමේ ස්ථානයක් (රෙදි කඩයක්) පවත්වාගෙන යාම
70. මසා නිමකළ ඇඳුම් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
71. ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (තනි මැෂිමක)
72. ඇස් කණ්ණාඩි (ඔප්ටිකල්ස්) නිපදවීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
73. ඡායාරූප ශාලාවක් (ස්ටුඩියෝ) පවත්වාගෙන යාම
74. පින්තූර රාමු කරන ස්ථානයක් පවත්වාගෙන යාම
75. සී.ඩී, වී.සී.ඩී. වීඩියෝ කැසට් ගීත පටිගත කිරීම හෝ විකිණීම, කුලියට දීම, පවත්වාගෙන යාම, සංයුක්ත තැටි කුලියට දීම හා විකිණීම
76. ලිපිද්‍රව්‍ය , පුවත්පත් , සඟරා, පාසැල් උකරණ (බුක්ෂොප්) පවත්වාගෙන යාම ගබඩා කිරීම හා විකිණීම.
77. දේශීය හා විදේශීය දුරකථන ඇමතුම් ලබාදීමේ ස්ථානයක් (කොමියුනිකේෂන්) පවත්වාගෙන යාම
78. ක්ෂණික ඡායා පිටපත් කිරීම, රෝනියෝ කිරීම, ලැමිනේටින් කිරීම, යතුරු ලියනය කර දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
79. පරිගණක යන්ත්‍ර විකිණීමේ, අලුත්වැඩියා කිරීමේ, පුහුණු පාඨමාලා පැවැත්වීම, සේවා සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
80. විදේශ චෙක්පත් (මුදල්) මාරු කරන ස්ථානයක් පවත්වාගෙන යාම
81. ගොඩනැගිලි ද්‍රව්‍ය (හාඩ්වෙයාර්) විකිණීමේ/ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
82. අටපිරිකර, පූජා භාණ්ඩ ගබඩා කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
83. සංගීත භාණ්ඩ කුලියට දීම හා නිපදවීම හෝ විකිණීම ස්ථානයක් පවත්වාගෙන යාම
84. මදුරු දැල් මහන ස්ථානයක් හෝ විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම
85. පුවත්පත් දැන්වීම් පළකිරීමේ ඒජන්සියක් හෝ පුවත්පත් විකිණීම සඳහා ඒජන්සියක් පවත්වාගෙන යාම
86. බෝට්ටු ඔරු (තොටුපොළක්) සේවාවන් පවත්වාගෙන යාම
87. ජුකී මැෂින් පුහුණු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
88. සෙලියුලර් දුරකථන හා දුරකථන අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
89. පෞද්ගලික පාසලක් පවත්වාගෙන යාම
90. පරණ යකඩ බඩු, ප්ලාස්ටික් භාණ්ඩ, හිස් බෝතල්, පත්තර, ගෝනි ගබඩා කර තැබීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
91. පිඟන් භාණ්ඩ (පෝසිලේන්, සිල්වර් භාණ්ඩ ඇතුළු) ගබඩාකර තැබීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
92. මෝටර් රථ අමතර කොටස් විකිණීම
93. සුරතල් මසුන් ඇති කිරීම, විකිණීම හා මාලු ටැංකි සෑදීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
94. රේස් මුදල් ඔට්ටු එකතු කිරීමේ ස්ථානයක් (බුකී හා රේස් බයි ) පවත්වාගෙන යාම
95. ක්‍රීඩා භාණ්ඩ නිපදවීම හා විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම
96. ලොතරැයි අලෙවි කිරීමේ ස්ථානයක් (කුටියක්) පවත්වාගෙන යාම
97. දැන්වීම පුවරු ඇඳීම, ප්ලාස්ටික් අංක තහඩු සැකසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම/ ස්ටිකර් කැපීම/ අකුරු ඇලවීම
98. ලී බඩු හෝ වෙනත් ඕනෑම ජංගම අලෙවිපළක් (salecenter) පවත්වාගෙන යාම (දිනකට)
99. ස්ථාවර හා ජංගම දුරකථන සම්න්ධතා නිකුත් කිරීමේ තාවකාලික වෙළෙඳ කුටියක් පවත්වාගෙන යාම ( දින 01 සිට 07 දක්වා)
100. බැංකු වලින් උකස් කර බේරා නොගත් භාණ්ඩ වෙන්දේසි කිරීමේදී එක් දිනකට අය කිරීම.
101. පශු වෛද්‍ය ගිලන්හලක් හෝ ප්‍රතිකාර මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
102. ඇලුමිනියම් භාණ්ඩ විකිණීම ගබඩා කිරීම
103. සත්ව ආහාර ගබඩා කර තැබීම, විකිණීම
104. පාවහන් වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
105. මල් වෙළෙඳසැලක් පවත්වාගෙන යාම කෘතිම / ස්වභාවික
106. සිල්ලර කඩයක් පවත්වාගෙන යාම
107. තේ ගබඩා කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
108. රබර්/පොලිමර් සීල් කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
109. මැටි භාණ්ඩ හෝ මල් පෝච්චි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
110. වීදුරු කපන ස්ථානයක් හෝ අලෙවිසැලක් පවත්වාගෙන යාම

111. ගඩොල් හෝ උළු ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
112. දැව ගබඩාවක් පවත්වාගෙන යාම
113. පාවිච්චි කරන ලද ඇඳුම් විකිණීමේ හා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
114. තේ දළු මිලට ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
115. ඒජන්සි තැපැල්හලක් පවත්වාගෙන යාම
116. ඇස්බැස්ටෝස් ගබඩා කර තැබීම හෝ විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම
117. හිරු එළියෙන් ක්‍රියාකරන (සෝලා පවර්) උපකරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
118. ඇඟලුම් සඳහා ලේබල් නිෂ්පාදනය කිරීම
119. ආහාර ද්‍රව්‍ය තොග, සිල්ලරට විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම
120. තොග වශයෙන් විකිණීම සඳහා පිටි , ලුණු හොණ්ඩර 15 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
121. ආරෝග්‍ය ශාලාවේ සිටින ලෙඩුන් සඳහා උපස්ථායක සේවා සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
122. කැලි රෙදි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
123. සිමෙන්ති ගබඩා කිරීමේ හා විකිණිමේ ස්ථානයක් පවත්වාගෙන යාම
124. ටේලර් සාප්පුවක් පවත්වාගෙන යාම
125. සිසිල් බීම එජන්සියක් පවත්වාගෙන යාම
126. සිසීල් බීම ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
127. අන්තර්ජාල සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම
128. ග්‍රොසරියක් පවත්වාගෙන යාම
129. කෘෂි රසායන ද්‍රව්‍ය/ පොහොර විකිණීම
130. ත්‍රී රෝද රථ/ මෝටර් සයිකල් අළුත්වැඩියාව
131. මෝටර් රථ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් (ගරාජයක්) සේවා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
132. කූල් ස්පොට් එකක් හෝ කිරිහලක් හෝ ස්නැක් බාර් පවත්වාගෙන යාම
133. කුළු බඩු/ ධාන්‍ය තොග විකිණීමේ/ ආහාර පනතට ගැනෙන ඕනෑම ද්‍රව්‍යයක් නිපදවීම, ගබඩා කිරීම , ඇහිරීම, බෙදා හැරීම හා සිල්ලරට විකිණීම
134. එළවළු හා පළතුරු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
135. පුද්ගලික රථ ගාලක් පවත්වාගෙන යාම
136. බුලත්, පුවක්, කොහු, ඉදල්, කෙසෙල් කැන්, පලා වර්ග, මැටි භාණ්ඩ (සාමාන්‍ය වෙළඳාම)
137. බිත්තර සිල්ලරට හෝ තොග විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම
138. කුරුඳු තැලීම, කුරුඳු තෙල් මඩුවක් පැවැත්වීම හෝ කුරුඳු දර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
139. කුරියර් සේවාවක් පවත්වා ගෙන යාම (පෞද්ගලික තැපැල් භාණ්ඩ බෙදා හැරීමේ ස්ථානයක්)
140. අන්තර්ජාලය හරහා භාණ්ඩ හා සේවා සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
141. කායවර්ධන මධ්‍යස්ථානයක් පවත්වා ගෙන යාම
142. කල්බඳු සේවා සැපයීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම
143. කර්ටන් මැසීම හෝ මසා නිම කළ කර්ටන් (තිර රෙදි) විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම
144. සංචාරකයින් සඳහා මග පෙන්වීමේ ආයතනයක් (ගයිඩින් සේවාව) පවත්වා ගෙන යාම
145. චැනල් සේවා ස්ථානයක් පවත්වා ගෙන යාම (වෛද්‍යවරුන් හමු වීම)
146. තීන්ත වර්ග වෙළදාම් කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම
147. ඒජන්සියක් පවත්වා ගෙන යාම (රසායනික ද්‍රව්‍ය, බෙහෙත්, සබන් වර්ග හා සුවඳ විලවුන්)
148. ක්‍රීඩා පුහුණු කිරීමේ ස්ථානයක් (පෞද්ගලික) පවත්වා ගෙන යාම
149. විදේශ රටවලින් ගෙන්වන ලද ඇඳුම් විකිණීම හා බෙදාහැරීම
150. විදේශ රටවලින් ගෙන්වන ලද පාවහන් හා සෙරෙප්පු තොග / සිල්ලර වශයෙන් අලෙවි කිරීම
151. ඩිටර්ජන්ට් කුඩු හා දියර වර්ග නිපදවීම
152. කුරුඳු, තේ, රබර් යන සුළු අපනයන බෝග අපනයනය කිරීම.
153. ඖෂධ වර්ග ගබඩා කර බෙදාහැරීමේ නියෝජිතයෙකු වශයෙන් කටයුතු කිරීම. (ඉංග්‍රීසි බෙහෙත් විකුණන ස්ථානයක්)
154. ඇණ වර්ග වෙළදාම් කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම.

දෙවන කොටස

| **පළමු තීරුව** | | **දෙවන තීරුව** |
|---|---|---|
| | **වර්ෂය සඳහා ව්‍යාපාරයේ ආදායම** | **නියමිත බදු මුදල රු.ශත** |
| 1. | රු: 6000/- නොඉක්මවන අවස්ථාව | නැත |
| 2. | රු: 6000/- ඉක්මවන එහෙත් රු: 12000/- නොඉක්මවන අවස්ථාවක | 90.00 |
| 3. | රු: 12000/- ඉක්මවන එහෙත් රු: 18750/- නොඉක්මවන අවස්ථාවක | 180.00 |
| 4. | රු: 18750/- ඉක්මවන එහෙත් රු: 75000/- නොඉක්මවන අවස්ථාවක | 360.00 |
| 5. | රු: 75000/-ඉක්මවන එහෙත් රු: 150000/- නොඉක්මවන අවස්ථාවක | 1200.00 |
| 6. | රු: 150000/- ඉක්මවන අවස්ථාවක | 3000.00 |

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05.** 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 148 (1) වැනි වගන්තිය යටතේ පහත දැක්වෙන උප ලේඛනයේ සඳහන් අනු ප්‍රමාණ අනුව වාහන හා සතුන් පිළිබඳ බද්දක් 2021 වර්ෂය සඳහා නියම කිරීමටත් යෝජනා කරමි.

**උප ලේඛනය**

| | **රු:ශත** |
|---|---|
| 1. බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන වාහනයක් සඳහා | 25.00 |
| 2. පාපැදිය වෙළඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම් | 18.00 |
| 3. පාපැදිය වෙළඳ කාර්යයක් නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම් | 4.00 |
| 4. සෑම කරත්තයක් සඳහා | 20.00 |
| 5. සෑම අත්කරත්තයක් සඳහා | 10.00 |
| 6. සෑම ජින්රික්ෂෝවක් සඳහා | 7.50 |
| 7. සෑම අශ්වයකු, පෝනියකු හෝ කොටළුවකු සඳහා | 15.00 |
| 8. සෑම ඇතෙකු සඳහා | 50.00 |

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**06.** (176 වැනි අධිකාරිය) ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥා පනතේ 3 වැනි වගන්තිය ප්‍රකාර බලපත්‍ර ගාස්තු බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2021 වර්ෂයට පහත සඳහන් පරිදි අය කිරීමට යෝජනා කරමි.

**උප ලේඛනය**

| | **රු: ශත** |
|---|---|
| 1. චිත්‍රපට දර්ශන, සර්කස් සංදර්ශන, මැජික් සංදර්ශන, නාට්‍ය සංදර්ශන හෝ වෙනත් යම් සංදර්ශනයක් සඳහා | |
| එක් දිනකට බලපත්‍ර ගාස්තුව | 1000.00 |
| වැඩි වන සෑම දිනකටම | 200.00 |
| 2. සංගීත සංදර්ශන සඳහා එක් දිනකට | 2000.00 |

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**07.** 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 122(1) වැනි වගන්තියෙන් පැවරි ඇති බලතල අනුව 1988.08.23 වැනි දින අංක 520/7 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ IV (ආ) කොටසේ පළාත් පාලන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි කොටසේ ප්‍රචාරක/දෘෂ්‍ය පරිසර පිළිබඳ අතුරු ව්‍යවස්ථා විධිවිධාන ප්‍රකාර බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් වීදියකට, පාරකට, ඇළකට, වැවකට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැළැස්වීම වෙනුවෙන් පහත උප ලේඛනයේ සඳහන් ආකාරයේ බලපත්‍ර ගාස්තුවක් 2021 වර්ෂය සඳහා පනවා 2021.01.01 දින සිට අය කිරීමට යෝජනා කරමි.

### උප ලේඛනය

| | | රුː ශත |
|---|---|---|
| 1. | බිත්තියක හෝ ස්ථිර පුවරුවක ප්‍රදර්ශනය කරනු ලබන ඕනෑම ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග අඩි 01 කට | 100.00 |
| 2. | බැනර් හෝ කටවුට් ප්‍රදර්ශනට කිරීම වෙනුවෙන් වර්ග අඩියකට | 50.00 |

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**08.** මෙහි පහත උප ලේඛනයේ දැක්වෙන ගාස්තු 2021 වසර සඳහා පනවා 2021.01.01 සිට අය කිරීමට යෝජනා කරමි.

### උප ලේඛනය

| | | **රු. ශත** |
|---|---|---|
| 01. | අනතුරුදායක ගස් පිළිබඳ දැනුම් දීමේ අයදුම්පත්‍ර ගාස්තු | 500.00 |
| | වැඩිවන සෑම එක් ගසක් සඳහා රු. 100.00 බැගින් අය කෙරේ. | |
| 02. | වරිපනම් සහතික ගාස්තු (වීථි රේඛා සහ නොපවරා ගැනීමේ සහතික ගාස්තු) | |
| | වරිපනම් සහිත | 500.00 |
| | වරිපනම් රහිත | 750.00 |
| 03. | වීථි රේඛා සහතික නැවත නිකුත් කිරීම | 200.00 |
| 04. | ඒ.ටී. පෝරම (ඔප්පු සාරාංශ පෝරම) ගාස්තු | 500.00 |
| 05. | සංශෝධිත නම සහ අංකය වරිපනම් ලේඛනයේ ලියාපදිංචි කිරීමේ ගාස්තු (එක් නමක් සඳහා) | 200.00 |
| 06. | වරිපනම් ලේඛනයේ උධෘත පිටපත් නිකුත් කිරීම (එක් වර්ෂයකට) | 100.00 |
| 07. | කේ. පෝරම නැවත නිකුත් කිරීම | 100.00 |
| 08. | සහතික පිටපත් ගාස්තු (එක් වර්ෂයකට සෙවීමේ ගාස්තුව) | 100.00 |
| 09. | ජල සහතික ගාස්තු/ විදුලි / වෙනත් | 300.00 |
| 10. | රැස්වීම් ශාලාව බදු දීම (එක් දිනකට) | 2000.00 |
| 11. | ජල නල එළීම සඳහා පාරවල් පළුඳු කිරීමේ ගාස්තු | |
| | I. එක් පැත්තක 1(m) × 1(m) වළක් තැනීමේදී පමණක් | 1250.00 |
| | II. අවම 3(m) ක නලය එළිමේදී 0.3 (m)×3(m) | |
| | මාර්ග පළුඳු කිරීම (තාර සඳහා) | 1300.00 |
| | මාර්ග පළුඳු කිරීම (කොන්ක්‍රීට් සඳහා) | 2000.00 |
| | III. වැඩිවන සෑම දික් 1(m) ක් අය කිරීම (තාර) | 435.00 |
| | අය කිරීම (කොන්ක්‍රීට්) | 600.00 |
| | අය කිරීම (පස්) | 600.00 |
| 11. | ප්‍රසිද්ධ වෙන්දේසියක් පැවැත්වීමේදී අවසර ලබා දීමේ ගාස්තු දිනකට | 250.00 |
| 12. | පුස්තකාල සාමාජික අයදුම්පත්‍ර ගාස්තු | 50.00 |
| 13. | පුස්තකාල පොත් ප්‍රමාද ගාස්තු දිනකට | 1.00 |
| 14. | පුස්තකාල සාමාජිකත්වය අළුත් කිරීම | 25.00 |
| 15. | (i) සභාව සතු භූමි වල පවත්නා ප්‍රවර්ධන වැඩසටහන් සඳහා අයකිරීම (දිනකට) | 2000.00 |
| | (ii) ආපසු ගෙවන ආරක්ෂක ඇප තැන්පත් | 1000.00 |

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ඉඩම් අනුබෙදුම් /ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම**

**09.** නාගරික සංවර්ධන ප්‍රජා භූමි සංවර්ධන අමාත්‍යතුමා විසින් 2009.04.16 වන දින කොළඹදී රජයේ නිවේදන එල්.ඩී.බී.16/78 යටතේ ප්‍රකාශයට පත් කරන ලද අංක 1597/8 හා 2009 අප්‍රේල් 17 වන දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පස්වන (V වන) උපලේඛනයේ සඳහන් ගාස්තු 2021 වර්ෂයට බලපාන පරිදි බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ සීමාව තුළ පනවා 2021.01.01 දින සිට අය කිරීමට යෝජනා කරමි.

01. ගොඩනැගිලි අයදුම්පත්‍ර ගාස්තු

| | |
|---|---|
| නේවාසික | 600.00 |
| වානිජ | 1000.00 |

02. ඉඩම් අනුබෙදුම් අයදුම්පත් ගාස්තු

| | |
|---|---|
| නේවාසික | 500.00 |
| වානිජ | 1000.00 |

අනුමත ගොඩනැගිලි සැලසුම් කාලය දීර්ඝ කිරීම (උපරිම කාලය දීර්ඝ කිරීම අවුරුදු 05 කි)

| | |
|---|---|
| පළමු වැනි අවුරුද්ද සඳහා | 200.00 |
| දෙවැනි අවුරුද්ද සඳහා | 250.00 |
| තෙවැනි අවුරුද්ද සඳහා | 300.00 |
| සිවුවැනි අවුරුද්ද සඳහා | 350.00 |
| පස්වැනි අවුරුද්ද සඳහා | 400.00 |

03. ගොඩනැගිලි අයදුම්පත් සම්බන්ධ සහතික නිකුත් කිරීමේ ගාස්තු 500.00

04. 1990 ට පෙර ඉදිකරන ලද ගොඩනැගිලි වල සැලසුම්පත් අනුමත කිරීම අනවශ්‍ය බව සනාථ කරන ලිපිය සඳහා ගාස්තුව 1000.00

**වෙනත්**

01. වතුර බවුසරය කුළියට දීම (ජලය රහිතව) 2750.00

දිනක් රඳවා ගැනීම වෙනුවෙන් 500.00
(දිස්ත්‍රික් මිළ කමිටු තීරණය පරිදි වෙනස් විය හැක.)

| | | |
|---|---|---|
| සතියේ වැඩ කරන දවස් 05 තුළ ජලයට අය කරන ගාස්තුව | 500.00 | 08% VAT මුදලක් ද අය කෙරේ. |
| සෙනසුරාදා ඉරිදා ඇතුළු අනෙකුත් නිවාඩු දිනවල ජලයට අය කරන ගාස්තුව | 650.00 | |

<u>**ගාස්තුවෙන් 25% ක් අඩුකිරීම**</u>

I. ජලය බවුසරය ලබාගැනීම ලියාපදිංචි වී ප්‍රතික්ෂේප කළහොත් 25% අඩුකිරීම රු. 687.50/-
II. ජල බවුසරය යාමට ඒමට 20 km කට වඩා වැඩිවුවහොත් 1km ක් සඳහා රු. 55.00 බැගින් අයකරනු ලැබේ.

02. ප්ලේට් කම්පන යන්ත්‍රය (රෝලරය) කුලියට දීම

| | |
|---|---|
| පැය 8 ක් | රු. 4025.00 |
| වැඩි වන සෑම කි.මී. 1 සඳහා අයකිරීම | රු. 55.00 |

(දිස්ත්‍රික් මිළ කමිටු තීරණය පරිදි වෙනස් විය හැක.)

03. ඩබල්ඩ්‍රම් කම්පන තලනය කුලියට දීම (පැය 8 ක කාලයකට) රු. 4200.00
04. සමර්හට් 10'×10' එකක් දිනකට කුලියට දීම රු. 1500.00
05. ක්‍රීඩා භූමි බදු දීමේ ගාස්තු අය කිරිම

මුදල් අයකරන සංදර්ශන සඳහා

| | | |
|---|---|---|
| I. | දිනකට | රු. 2000.00 |
| II. | ආපසු ගෙවන ඇප තැන්පත් | රු. 1000.00 |

මුදල් අයකරන සංදර්ශන හැර අනෙකුත් සෑම කටයුත්තක් සඳහා

| | | |
|---|---|---|
| I. | දිනකට | රු. 1000.00 |
| II. | ආපසු ගෙවන ඇප තැන්පත් | රු. 1000.00 |

06. ඝාතන ගාස්තු අය කිරීම
තාවකාලික බල පත්‍රයක් මත කරනු ලබන ඝාතනයක් සඳහා අය කරනු ලබන ගාස්තු.

| | | |
|---|---|---|
| I. | ගවයෙකු මැරීම සඳහා | රු. 1000.00 |
| II. | එළුවකු මැරීම සඳහා | රු. 1000.00 |
| III. | ඌරකු මැරීම සඳහා | රු. 1000.00 |

**07.** කුළුණු සඳහා වාර්ෂික බදු මුදල (දුරකථන කණු) රු. 500.00

__පරිසර අංශය__

| | | |
|---|---|---|
| 01. | පාරිසරික ආරක්ෂණ බලපත්‍ර අයදුම්පත් ගාස්තු | රු. 200.00 |
| 02. | පරිසර ආරක්ෂණ බලපත්‍ර අලුත් කිරීමේ අයදුම්පත් ගාස්තු | රු. 200.00 |
| 03. | පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමේ ගාස්තු | රු. 4000.00 |

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**10.** 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමඟ කියවිය යුතු 267 වන අධිකාරය වූ 1946 අංක 12 දරණ විනෝද බදු ආඥා පනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ සීමාව ඇතුළත පවත්වනු ලබන එකී ආඥා පනතේ විස්තර කර ඇති යම් විනෝද කටයුත්තකට ඇතුළු වීම පිණිස කරනු ලබන ගෙවීමකින් සීයට පහළොවක් (15%) බද්දක් පනවා අය කිරිමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**11.** 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 127 වැනි වගන්තියේ හා (231 වැනි අධිකාරය) සුසාන භූමි ආඥා පනතේ 03 වැනි වගන්තියේ හා 17 සිට 22 වගන්තිය අනුව සඳහන් කාර්යයන් සඳහා එකී ආඥා පනතේ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මතු දැක්වෙන උප ලේඛනයේ පළමු කොටසේ සඳහන් සුසාන භූමි වල භූමදාන කිරීමක්, ආදාහනය කිරීම හා තැන්පත් කිරීමක් සඳහාද, ස්මාරකයක් ඉදිකිරීමක් සඳහාද උපලේඛනයේ දෙවන කොටසේ සඳහන් ගාස්තුවක් 2021 ජනවාරි මස 01 වැනි දින සිට පනවා අය කිරීමට යෝජනා කරමි.

**උප ලේඛනය**

**පළමු කොටස**

1. හපුගල පොදු සුසාන භූමිය
2. පෝද්දල පොදු සුසාන භූමිය
3. ලබුදූව පොදු සුසාන භූමිය
4. වැලිපිටිමෝදර පොදු සුසාන භූමිය
5. බෝපෙ පොදු සුසාන භූමිය

**දෙවන කොටස** රුඃ ශත

| | | |
|---|---|---|
| 1. | වයස් සීමාවකින් තොරව එක් භූමදාන කිරීමක් සඳහා අවසර පත්‍ර ගාස්තු | 500.00 |
| 2. | වයස් සීමාවකින් තොරව එක් ආදාහන කිරීමක් සඳහා ගාස්තු | 2000.00 |
| 3. | වයස් සීමාවකින් තොරව එක් තැන්පත් කිරීමක් සඳහා (උපරිම බිම් ප්‍රමාණය වර්ග අඩි 18) | 5000.00 |
| 4. | ස්මාරකයක් ඉදිකිරීම සඳහා ගාස්තුව වර්ග අඩියකට (උපරිම වර්ග අඩි 3 1/2 ×2) | 2000.00 |

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**12.** වසර දෙක ඉක්මවූ පහත දක්වා ඇති තැන්පත් සහා ආදායමට ගැනීමට යෝජනා කරමි.

I. ආරක්ෂක ඇප තැන්පත් - රු. 81,000.00
II. ටෙන්ඩර් තැන්පත් - රු. 16,000.00
III. සාමාන්‍ය තැන්පත් - රු. 494,200.00
IV. කර්මාන්ත තැන්පත් - රු. 377,798.50

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**13.** අප ප්‍රාදේශීය සභාවේ මේ දක්වා අයකර ගත නොහැකිව දීර්ඝකාලීන ණය ගැතියන් වශයෙන් ගිණුම්වල ඉදිරියට එන පහත සඳහන් ණයගැති ශේෂ සම්බන්ධව විස්තර මේ වනවිට සොයාගත නොහැකි වී ඇති අතර එම ශේෂ සභා ආදායමෙන් කපා හැරීමට යෝජනා කරමි.

I. හිඟ හිටි අක්කර බදු ගිණුම රු. 11,114.04
II. ණය ගැති ගිණුම රු. 3,143.63
III. වෙනත් ආයතන තැන්පත් රු. 6,000.00

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**14.** 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 170 වගන්තිය ප්‍රකාරව මහා සභාවේ ආවරණ අනුමැතියට යටත්ව 2020-07-01 වන දින පහත සඳහන් වැය ශීර්ෂයන් අතර මුදල් මාරුකර තිබීම අනුමත කරන මෙන් යෝජනා කරමි.

| අනු අංකය | අතිරික්ත වූ වැය විෂයන් | | | ඌනතා වූ වැය විෂයන් | | |
|---|---|---|---|---|---|---|
| | වැය සංකේතය | වැය විෂය | වටිනාකම | වැය සංකේතය | වැය විෂය | වටිනාකම |
| 01 | 308-9 | විශ්‍රාම වැටුප් | රු. 18,000.00 | 608-9 | විශ්‍රාම වැටුප් | රු. 18,000.00 |
| 02 | 605-9 | වෙනත් වියදම් | රු. 10,000.00 | 605-3-2 | වෙනත් ආවශ්‍යක සේවා (ජලය) | රු. 10,000.00 |

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**15.** 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 170 වගන්තිය ප්‍රකාරව මහා සභාවේ ආවරණ අනුමැතියට යටත්ව 2020-10-13 වන දින පහත සඳහන් වැය ශීර්ෂයන් අතර මුදල් මාරුකර තිබීම අනුමත කරන මෙන් යෝජනා කරමි.

| අනු අංකය | අතිරික්ත වූ වැය විෂයන් | | | ඌනතා වූ වැය විෂයන් | | |
|---|---|---|---|---|---|---|
| | වැය සංකේතය | වැය විෂය | වටිනාකම | වැය සංකේතය | වැය විෂය | වටිනාකම |
| **01** | 201-2 | අතිකාල හා නිවාඩු දින වැටුප් | රු. 450,000.00 | 101-2 | අතිකාල හා නිවාඩු දින වැටුප් | රු. 450,000.00 |

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**16.** කියවීමේ මාසය වෙනුවෙන් පුස්තකාල සමාජිකත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා 2020-10-20 දින සිට 2020-11-30 දින දක්වා පුස්තකාල සමාජිකත්වය නොමිලේ ලබා දීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**17.** අප ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය කම්කරු තනතුරේ සේවය කරන තනුජා සුජීවනි නාගහවත්ත මෙය පෙර පාසල් පාලිකා තනතුරට අන්තර්ග්‍රහනය කිරීම සඳහා නිර්දේශකර ගරු දකුණු පළාත් ආණ්ඩුකාරතුමාට යොමු කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**18.** 2021 වර්ෂය සඳහා අප ප්‍රාදේශීය සභාව සතු කලේගාන පොළ භූමිය බදු දීම, හපුගල ජන සභා ගොඩනැගිල්ලේ කඩ කාමර දෙක බදු දීම හා හපුගල, ගිංතොට වැලිපිටිමෝදර පිහිටි සූසාන භූමි දෙකේ එළදාව බදු දීම සඳහා ටෙන්ඩර් කිරීමට පුවත්පත් දැන්වීමක් පළ කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**19.** අප ප්‍රාදේශීය සභාව සතු කලේගාන පොළ පිහිටා ඇති භූමිය තුළ වෙළඳ සංකීර්ණයක් ඉදිකිරීමට දේශීය ණය සහ සංවර්ධන අරමුදලෙන් ණය මුදලක් ලබා ගැනීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**20.** බල ප්‍රදේශයේ පෙර පාසල් දරුවන් සඳහා සභා අරමුදල් යොදවා රාත්‍රී කඳවුරක් පැවැත්වීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක ස්ථිර කරලා තියමු පවතින තත්ත්වය මත තමයි මේක තියෙනවද, නැද්ද කියලා අපි තීන්දු කරන්නේ.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**21.** රොස්වුඩ්වත්ත ජල ටැංකියට යන මාර්ගයේ රොහාන් ප්‍රසන්න මහතාගේ නිවසට යන අතුරු මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**22.** මාම්පිටිය, ඉසුරු මාවතේ දයාරත්න මහතාගේ නිවස ඉදිරිපිට පෙට්ටි බෝක්කුවක් දමා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙතන ගැටලු සහගත තත්ත්වයක් තියෙනවා. කම්බි නෙට් එකක් දාන්න ඕන. උඩින් එන වතුර ටික සම්පූර්ණයෙන්ම යන්නේ අර ගෙවල් දෙකට. එතනට කම්බි නෙට් එකක් දාලා බෝක්කුවක් දාන්න තමයි යෝජනා කරේ. ඒක දීර්ඝ කාලයක ඉඳලා තියෙන ප්‍රශ්නයක්.

එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**23.** වී.සී පාරේ ලක්ෂ්මන් කරුණාරත්න මහතාගේ නිවස ඉදිරිපිට ප්‍රවේශ මාර්ගය හරහා යන කාණුව ඩබ්.පී චන්දන මහතාගේ හා අරෝෂ මහතාගේ ඉඩම අතරින් යන කාණුවට සම්බන්ධ කිරීමට හා ලක්ෂ්මන් මහතාගේ නිවස පිටුපසින් ඇළට සම්බන්ධ වනසේ කාණු දෙකක් කැපීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමනි, ඒ සම්බන්ධයෙන් පොඩි කාරණයක් කියන්න තියෙනවා. ඒක පැහැදිළිව දැක්කා. ඇත්තටම ලක්ෂ්මන් මහත්තයාලගේ නිවස ඉදිරිපිටින් තියෙන්නේ බෑවුමක්. ඒ බෑවුමෙන් වර්ෂා කාලයට විශාල වතුර ප්‍රමාණයක් කාන්දු වෙනවා. ඒක මිදුලේ ඉස්සරහ ප්‍රදේශයෙනුත් ගලා බහිනවා. ඔබතුමා දකිනවා ඇති පිටිපස්සේ කාණුව, එහා පැත්තේ වතුර බහින තැන දීර්ඝ කාලීනව වතුර පිරිලා මාළුත් ඉන්නවා, සත්තුත් බෝ වෙලා. මාළුත් ඉන්නවා දැන් පැටව් දාලා. ඒ වතුර පාර යවන්න වෙන ක්‍රමයක් නැහැ එතුමාට. මුලින්ම මට මතකයි සභාවේ යෝජනා කරපු වෙලාවේ ඔබතුමා බොහොම පැහැදිළිව ඒක දැකලා මාසයක් ඇතුලත අපි මේක ඉවර කරමු කිවුවා. අවුරුදු 10 ක් විතර පරණ සිද්ධියක් නිසා ඉක්මනින් මේක කරලා ඉවර කරමු කිවුවා. ඔබතුමා මේක දැකලා හොඳ තීන්දුවකට සහ හොඳ උත්සාහයකට එළඹුණා. ප්‍රශ්නය වුණේ ඔබතුමාම මේක ක්‍රියාවට නංවන්න අසමත් වීම. ඒක වෙන්න බලපාපු හේතු කාරණා ගොඩක් තියෙන්න ඇති. හැබැයි ඒක සාධාරණ නැහැ කියලා මම මේ අවස්ථාවේදී ඔබතුමාට මතක් කරනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි මේක හරි පැහැදිලියි.

(ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය, ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා සභාවට සහභාගි වීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක දෙකක්. මම දකින දේ තමයි අද වෙලා තියෙන්නේ මිනිස්සුන්ට තමන්ගේ අවශ්‍යතාවය ඉෂ්ඨ කර ගන්නවාට වැඩිය වෙනත් පරිබාහිර ප්‍රශ්න බේරන්න තියෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අනෙක් අයට රිද්දන්න තියෙන වුවමනාව තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක තමයි ඕන. තමන්ගේ වැඩේ කරගෙන අනිත් අයටත් රිද්දන්න ඕන. දැන් මේකේ යෝජනා කරේ, දෙපාර්ශවයම යෝජනා කරන දෙකක් තමයි. ලක්ෂ්මන් කරුණාරත්න මහත්තයාලගේ පැත්තේ වැඩෙත් කෙරෙනවා. අනෙක් පැත්තෙනුත් කාණුවක් කපන්න තමයි අපේ බලාපොරොත්තුව තියෙන්නේ. දැන් ලක්ෂ්මන් කරුණාරත්න මහතාගේ එකඟතාවය නැහැ අනෙක් පැත්තෙන් කපන කොට. තමන්ගේ වැඩේ කෙරෙනවානේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම එතුමාට කතා කරා. එහෙම විරෝධතාවයක් නෙමෙයි තියෙන්නේ. එතුමා කියන්නේ අවුරුදු දහයක් තිස්සේ තිබුණ ප්‍රධාන ප්‍රශ්නය, එක දිගට බලපාපු ප්‍රශ්නය එයාගේ කාණුවේ වතුර බහින්නේ නැතුව මුළු කුස්සියම යටවෙන එක. ඒක ඉක්මනින් කරලා දෙන්න කියන ඉල්ලීම තියෙන්නේ. ඒක වහාම කරලා දෙන්න. ඇත්තටම ඔබතුමා දැකපු නිසා මේකේ පැහැදිලි කරලා දෙන්න දෙයක් ඇත්තෙම නැහැ. ඔබතුමන්ගේ ඇස් දෙකෙන් දැකලා ඔබතුමා තීන්දුත් කරානේ මේක බොහොම පැහැදිලිව.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තිස්ස මන්ත්‍රීතුමත් මම තරම් ඔතනට යන්න නැතුව ඇති. මම අතේ ඇඟිලි ගාණට වැඩි ප්‍රමාණයක් ඔතනට ගිහිල්ලා ඇති.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම කියන්නේ මේ මුළු සභාවම ඒකමතිකව ඒ ස්ථාවරයේ සිටිය යුතුයි. කරුණාකරලා මේ වැඩේ හදිසි කටයුත්තක් සේ සලකලා කරන්න. මේ යෝජනාව ඉතාමත්ම හොඳයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක තමයි මේක සභාවට දැම්මේ විදිමත්ව කරන්න ඕන හින්දා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක බොහොම ඉක්මනින් පටන් ගන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. ගමේ මනුස්සයෙක් හැටියට ඒ මිනිස්සු මාත් එක්ක තරහ කිරීමේ දෙයක් තමයි මේක මෙතන නිතර නිතර මතක් කිරීමෙන් හට ගන්නේ. ඕක අවුරුදු 10 ක් විතර තිස්සේ ආපු ප්‍රශ්නයක්. ගමේ ඉන්නේ මම. ඒ හින්දා එක එක්කෙනා ගිහිල්ලා එක එක යෝජනා කරලා ලක්ෂ්මන් මහත්තයාවයි, මාවයි විරසක කරනවා. ගරු මන්ත්‍රීතුමා මම ඔබතුමාට කියන්නම්. මේක මගේ කොට්ඨාශයේ තියෙන දෙයක්නේ. ඒ කියන්නේ මම ඔබතුමාට මේවා කරනවා නෙමෙයි. දැන් කෙනෙක් අපේ ගරු ඇමතිතුමාට ගිහින් කියලා තිබුණා. හිරු ආයතනයට කියලා මේක රෙකෝඩින් කරලා ටී.වී. එකේ පෙන්වලා මේක අවුල් ජාලාවක් කරානේ. ඉතිං ඒක හින්දා මම ඒක දකිනවා. සභාපතිතුමා කිවුවා මම එතුමා තරම්වත් ගිහිල්ලා නැහැ කියලා. ඒක මම පිළිගන්නවා. ගරු ඇමතිතුමා උපදෙස් දුන්නා පාර ගාව කාණුව ඉස්සෙල්ලා කපලා ඒක හරි නොගියොතින් දෙවනුව මේක කරන්න කියලා. එහෙම තමයි ගරු ඇමතිතුමා කිවුවේ. ඒක හින්දා මම දකිනවා ඉස්සෙල්ලම මේකේ මොකක් හරි ක්‍රමවේදයකට යන්න ඕන. හැමදාම ගරු මන්ත්‍රීතුමත් කතා කරනවා. ලක්ෂ්මන් මහත්තයා සභාපතිතුමා එක්කයි, මාත් එක්කයි හිත් අමනාපත් වෙලා තියෙනවා මේකෙන්. ඒ හින්දා මම යෝජනා කරනවා, මම බලාපොරොත්තු වෙනවා ඉස්සෙල්ලම මේක කරන්න. මේක ගරු ඇමතිතුමා නිරීක්ෂණය කරා. ඊට පස්සේ කිවුවා මෙන්න මේ ක්‍රමවේදය අනුගමනය කරලා බලන්න එහෙම බැරි වුණොත් අපි වෙන විකල්පයකට යමු කිවුවා. ගරු සභාපතිතුමාගෙන් ගරු සභාවේදී කාරුණිකව ඉල්ලා සිටින්නේ ඉස්සෙල්ලා අපිට අවුරුදු 10 කට කර ගන්න බැරි වෙච්ච දේ අර චන්ද්‍රන මහතාගේ තියෙන කාණුව ඔස්සේ ඉස්සෙල්ලා වතුර ටික බස්සවන්න බලලා බැරි වුණොත් අපි අනෙක් ක්‍රමවේදයට යමු කියලා. ඒක කරන්න කියලා ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධව සභාපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව ඒකමතිකව සහා සම්මත කළ යුතුයි. මේක කරන්නම ඕන. හේතුව ඇත්තටම ඒකේදී උඩට වතුර ගලාගෙන යන්නේ නැහැ. කවුරු කොහොම කිවුවත් උඩට වතුර ගලාගෙන යන්නේ නැහැ. පහළට පමණයි වතුර ගලාගෙන යන්නේ. ගරු ඇමතිතුමාගේ නිර්දේශය මත එතුමා යෝජනා කරලා තියෙනවා ඒ දෙපාර්ශවයම සමථයකට පත්කිරීමක් හැටියට දෙපැත්තෙන්ම කාණු දෙකක් කපන්න කියලා. ඉතිං මේ යෝජනාව සභාපතිතුමා දාලා තියෙනවා. මම එදත් කියනවා, අදත් කියනවා, හෙටත් කියනවා ඇස් කන් තියෙන කෙනෙක් එතනට ගියානම් දකිනවා කාණුව කැපිය යුත්තේ පහළින් කියලා. පහළින් විතරයි කාණුව කපන්න පුලුවන්. වතුර බැස යන්නේ එතනින් විතරයි. නමුත් මේකේදී දෙපැත්තක් සමථයකට පත් කළ යුතු නිසා තව කාණුවක් උඩින් කැපුවට කමක් නැහැ. ඉතිං ඒකේදී පක්ෂ පාට බලන්න එපා. මිනිස්සුන්ගේ අවශ්‍යතාවය විතරක් බලන්න. ඒ නිසා අවුරුදු 10 ක් නෙමෙයි අවුරුදු 25 ක් ගියත් කරන්න ඕන වැඩේ දැන් කරන්න. සභාපතිතුමා ගනිපු මේ තීරණය ඒකමතිකව ස්ථිර කරනවා ඒකට කාණු දෙකක් කැපිය යුතුයි කියලා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** ඒකට ඇමතිතුමා කිවුවේ එහෙම කරන්න නෙමෙයි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු තිස්ස මන්ත්‍රීතුමා අපි මේක නිකං ප්‍රශ්නයක් කර ගන්න ඕන නැහැ. ඔබතුමත් එක්ක පෞද්ගලික විරසකයක් නැහැ ලක්ෂ්මන් මහත්තයාගේ. මම ඒක හොඳටම දන්නවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** මේක මගේ කොට්ඨාශයේ ප්‍රශ්නයක්. මම පිනට ඇවිල්ලා නැහැ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට අදාළ ගෞරවය දෙමින් මේ කතා කරන්නේ. අපි මේකේ ප්‍රශ්නයක් හදා ගන්න දෙයක් නෙමෙයි මම කියන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මට ඒක තේරුනේ නැහැ. පිනේ කතාව මොකක්ද,

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු මන්ත්‍රීතුමා ඔබතුමා සම්බන්ධයෙන් පෞද්ගලික විරසකයක් නැහැ ලක්ෂ්මන් මහත්තයාට. එතුමා ඉල්ලා සිටියේ දිගින් දිගටම ඒක කරන්න. ගරු සභාපතිතුමනි, ඔබතුමා ගියපු වෙලාවේ කතා කරන්න ඇතිනේ. ඒකේ එහෙම ප්‍රශ්නයක් නෙමෙයි තියෙන්නේ. ඒක හරි පැහැදිළිව තියෙනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** කවුරු කොහොම කිවුවත් මගේ කොට්ඨාශයේ එහෙම කරන්න බැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම සෙල්ලම් දාන්න බැහැ.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** ඒ තුලින් වෙන්නේ ඔබතුමාගේ පිරිහීම විතරයි. බුද්ධියක් තියෙන මිනිස්සු මේ කොට්ඨාශයේ ඉන්නවා. ඔබතුමා පිරිහීමට ලක් වෙනවා ඒකයි වෙන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අපි මේකේ ප්‍රශ්නයක් හදා ගන්න ඕන නැහැ ගරු සභාපතිතුමනි,

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක මට අවශ්‍ය විදියට කරන්නම්. ඇමතිතුමාටත් මේ වෙලාවේදී ස්තුතිවන්ත වෙන්න ඕන. මේකත් කියන්න ඕන මම මේ වෙලාවේදී. නමුත් ඔය ලක්ෂ්මන් කරුණාරත්න පාර්ශවය හැසිරිච්ච විදිය ඉතාමත්ම නරකයි. ඒක මම මේ වෙලාවේදී කියනවා. අනිත් පාර්ශවයට වැඩිය ඉතාමත්ම නරක විදියට හැසිරුනේ. ඇමතිවරයෙක් නෙමෙයි, නිකම්ම නිකම් සාමාන්‍ය මන්ත්‍රීවරයෙක් තරම්වත් ගරු කිරීමක් නැහැ. මම කියන්නේ ගරු කරන්න ඕන නැහැ. එතුමාගේ වෘත්තිය පවා ඇහුවා. ඔබතුමා වෛද්‍යවරයෙක්ද කියලා ඇහුවා. ඒ මට්ටමේ කතා කරේ. නමුත් ඇමතිතුමා බොහොම පැහැදිලිව කිවුවා දිල්රුක් සභාපතිතුමා කැමති තීන්දුවක් ගන්න කියන එක. ඒක බොහොම පැහැදිලිවම කිවුවා. එතුමා ඉල්ලීමක් කරා කාණුව දෙපැත්තටම යන්න පුලුවන්නම් හොඳයි කියලා. මේ පැත්ත ඉස්සෙල්ලා කරලා බලලා මේක කරමු කියලා කිවුවේ නැහැ. එතුමා කිවුවේ මේ දෙකම එකට කරන්න කියලා. පෙරේදද කොහේදත් ඇහුවා අර වැඩේ කරාද කියන එක එතුමා මගෙන්. එතුමාට ඒ මොනවා කිවුවත් එතනින් බැහැරව ගියා එතුමා. ඒ හැසිරිච්ච විදිය පිළිබඳව මම අනුමත කරන්නේ නැහැ. නමුත් අපි මේ කාරණාව මේ විදියට කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා අගතියට පත්වෙන පාර්ශවය වෙනුවෙන් තමයි සභාවක් විදියට තීන්දු ගන්න ඕන. එතකොට මම කලුද, සුදුද කියලා නෙමෙයි බලන්නේ. වෙන්න තියෙන දේ තාක්ෂණ නිලධාරීන් යොදවලා අවශ්‍ය විදියට කරන්න. අපි කියනවාට වඩා මෙතුමාටත් හානියක් නොවන විදියට අත්‍යාවශයෙන්ම කෙරෙන්න ඕන තැනක් මේක. මොකද අපි ඒක නිරීක්ෂණය කරලා තියෙනවා. ඔබතුමා ගනිපු තීන්දුව හරි. තිස්ස මන්ත්‍රීතුමාටත් හානියක් නොවන විදියට තාක්ෂණ නිලධාරීන්ගේ නිර්දේශය අරගෙන මේක විය යුතුයි. ඒක නිසා මේක දිගින් දිගටම තියෙන ප්‍රශ්නයක්. මේක ඔතනින් ඉවර කරන්න. මේ සභාවේ වැඩ කර ගෙන යන්න ඔබතුමා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක ස්ථිරයි. ඇත්තටම මන්ත්‍රීතුමා මේ වැඩේට ස්තුතිවන්ත වෙනවා. අවුරුදු 10 කට වැඩි කාලයක් තිස්සේ ඒ මනුස්සයා මානසිකව විඳවන ප්‍රශ්නයක් මේක. ඒ නිසා මේ ප්‍රශ්නය සාධාරණව විසඳන්න සහය දුන්න සියල්ලන්ටම ඒ ස්තුතිය හිමි වෙනවා. ඒක ගැටලුවක් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට ස්තුති කරන්න මේ වැඩේ කෙරුණට පස්සේ. අපි මේක යෝජනා කරලා ඉමුකෝ.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**24.** අධිකරණ තීන්දුව ලබා දී ඇති බැවින් නාවින්න අරලිය වත්ත මාර්ගයේ ඇති ගස් කපා මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒක ඉක්මනින්ම කරන්න සභාපතිතුමා.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මමත් ඔය යෝජනාව ඉදිරිපත් කරලා තිබුණා. ඔබතුමා ඒක කරපු එක හොඳයි ඇත්ත වශයෙන්ම. මම හිතන්නේ නිතරම සුමිත් උප සභාපතිතුමාට ස්තුති කරනවා වතුර අරන් දුන්නා කියලා. මටත් කියනවා සුමිත් උප සභාපතිතුමාට කියලා පාර හරි ගස්සවලා දෙන්න කියලා. වර්ෂාව වෙලාවට මහා වතුර පාරක් එනවා පාර හරහා. මේක කාලෝචිත යෝජනාවක්. ඒක නිසා මේක ස්ථිර කරනවා. මම හිතන්නේ ඒ පාර කොන්ක්‍රීට් කරන්න බැරිනම් මේ වෙලාවේදී පාර හරි ගස්සවලා වලවල් ටික වහලා කොරිපස් ටිකක් දාලා දෙන්න.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඒ අය සහාය දුන්නා මේ අය වතුර ගත්තා. සභාව කොයිතරම් මුදලක් වියදම් කරාද දන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒවට වන්දි ගන්න පුලුවන්. ඒ නඩුව පරාදයි. නඩුව විසිකරානේ.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** මම දන්නේ නැහැ. අපි ගියාම සුමිත් උප සභාපතිතුමාට ස්තුති කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ නඩුවට මොකද වුණේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** නඩුව වීසි කරා. නිදොස් කොට නිදහස් කරා අපිව.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතකොට ඉක්රම්ට මොකද වෙන්නේ. එයත් නිදහස්නේ මේ කියන විදියට.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඔක්කොම නිදොස්කොට නිදහස්.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** අපි ගියාම සුමිත් උප සභාපතිතුමාට හොඳ කියනවා. ගියාම මතක් කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා සභාවට සහභාගි වීම සිදුවිය.)

**25.** ගිංතොට, වැලිපිටිමෝදර, ශ්‍රී ථූපාරාම රජමහා විහාරයට අයිති භූමිය මැදින් ශ්‍රී භාරද්වාජ මාවතට පිවිසීමට ලබා දී ඇති අප ප්‍රාදේශීය සභාව විසින් නඩත්තු කිරීම පමණක් සිදුකරන ලද මාර්ග කොටස වෙනුවට විහාර භූමිය කෙළවරින් විකල්ප මාර්ග කොටසක් ලබා ගැනීමටත්, විහාරයට අයිති භූමිය මැදින් දිවෙන මාර්ගයේ බිම් කොටස විහාරස්ථානයට නිදහස්කර දීමටත්, විකල්ප මාර්ගයේ බිම් කොටසේ අයිතිය විහාරස්ථානයෙන් අප ප්‍රාදේශීය සභාව වෙත පවරා ගැනීමටත් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ අර ගිය සභාවට ආව ලියුම. ඒ යෝජනාව විදිමත්ව මේ සභාව වෙත ඉදිරිපත් කරලා තියෙනවා. මේක විහාරස්ථානය වෙත යවන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, අපේ ථූපාරාමයේ නායක හාමුදුරුවන්ගේ අවශ්‍යතාවය වන්නේ පන්සලේ ඉඩම් දෙකම එකට එකතු කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ උන්වහන්සේ ඉදිරිපත් කරපු එකම තමයි ඉදිරිපත් කරලා තියෙන්නේ. උන්වහන්සේ අපිට ලිපියකින් ඉදිරිපත් කරානේ. ඒකට තමයි මේ යෝජනාව දාලා තියෙන්නේ.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**26.** හපුගල, ගොඩළිඳවත්ත මාර්ගයේ පැති කාණු සඳහා කොන්ක්‍රීට් කවර් ස්ලැබ් යෙදීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකද ඒ පාර පටුයි. කාණුවත් මාර්ගය විදියට භාවිතා කරන්න අවශ්‍ය වෙලා තියෙනවා. ඒක නිසා ඒ ස්ලැබ් කෑලි යොදන්න කියලා යෝජනා කරනවා.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**27.** රුහුණු විශ්ව විද්‍යාලයේ, කරාපිටිය වෛද්‍ය පීඨය විසින් ස්ව උපකාර ශිෂ්‍යත්ව අරමුදලට අධාර පිණිස 2019-12-15 දින පවත්වන ලද "තුන් සිත් දැහැන" ප්‍රසංගය සඳහා අප ප්‍රාදේශීය සභාවට විනෝද බදු ලෙස ගෙවන ලද රු.43,500ක මුදලින් 50%ක් නිදහස් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**28.** අප ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ කාර්යයන් සඳහා වෙන් කරන ලද නිල වාහනයට රියදුරෙකු යොදවා ගැනීමට අපහසු අවස්ථාක දී සභාපතිවරයා විසින්ම එකී නිල රථය ධාවනය කිරීමටත්, නිල වාහනය රාජකාරි සඳහා යොදවා නොගන්නා අවස්ථාවල දී සභා පරිශ්‍රයේ හෝ සභාපතිවරයාගේ භාරයේ වෙනත් සුදුසු ස්ථානයක ගාල්කර තැබීමටත් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** නිල රථයට පමණයි නේද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔව් නිල රථයට තමයි. මේකට දකින්න ඇති පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලිපියක් එවලා තියෙනවා. ඒ එවපු ලිපිය හා සම්බන්ධව තමයි මේ යෝජනාව කරේ.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමාගේ යෝජනා**

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මගේ යෝජනා සභාවට ඉදිරිපත් කරන්න ප්‍රථමයෙන් සියලු දෙනාගෙන්ම අවසර පතනවා. විශේෂයෙන්ම අපේ ලියනගේ මන්ත්‍රීතුමාට පැන නගිපු ප්‍රශ්නයට උත්තරයක් දෙන්න ඕන. නැත්නම් ඒකට වැරදි මතයක් යන්න පුලුවන් ලියනගේ මන්ත්‍රීතුමා.

නාවින්න අරලිය වත්ත ප්‍රදේශයට  පානීය ජලය ලබා දීමේ යෝජනාව ගේන කොට ඔබතුමා මම හිතන්නේ සභාව නියෝජනය කරන්නේ නැහැ. 2011 අන්තිම කාර්තුවේදී තමයි හිටපු සභාපති මාදුගොඩ මැතිතුමාගේ කාලයේදී තමයි ඒක ආවේ. නමුත් ඒ මාර්ගයට යෝජනාව සම්මත කරලා අපි ඒ ස්ථානයට ගියා පරීක්ෂණයක් කරන්න. ඒ ගැන සාකච්ඡා කරන්න ගියේ. සාකච්ඡා කරන්න ආපු වෙලාවේදී තමයි ඔය ඉක්රම් කියන කෙනා උරණ වෙලා ඒ ආසන්නයේ වෙනත් කාර්යයකට ගිය බැකෝ එකට ගහලා ලොකු ගැටළුවක් ඇති කරේ. නමුත් සභාවෙන් කොපමණ මුදලක් ඒ නඩු කටයුතු වලට ගියත් අපි ඒ නඩුවෙන් නිදොස් කොට නිදහස් වෙලා තියෙනවා. 23 වෙනිදා ඉදිරි නඩු වාරය තියෙනවා. ඒකෙදිත් බොහොම පැහැදිලිව අපිට තේරෙන විදියට, නීතිඥයොන්ගෙන් ලැබෙන උපදෙස් අනුව අපි නිදොස් කොට නිදහස් වෙනවා. අපේ අබේසේකර මන්ත්‍රීතුමා ලොකු කාර්යයක් ඒ වෙනුවෙන් කරා. ඉන් පස්සේ අපි ඉදිරි නීතිමය කටයුතු කරමු සභාවට වෙච්ච පාඩුව සහ ඒ බැකෝ එකට සිදු වෙච්ච අලාභය වෙනුවෙන්. ඒකට කටයුතු කරනවා. මන්ත්‍රීතුමාගේ නොදැනුවත් වීම මත තමයි ඒ ප්‍රකාශය කරේ. ඔබතුමා සභාව නියෝජනය කරන්න පෙර අපි සභාව නියෝජනය කරේ. අවසාන කාලයේ ඔබතුමා පැමිණියේ. එතකොට අපි ඒ නඩුවේ අවසාන භාගය දක්වා ගිහිල්ලා තියෙනවා ලියනගේ මන්ත්‍රීතුමා. ඒක හින්දා ගැටළුවක් නැහැ. සභාවට පාඩුවක් වෙන්න ඇති අපි ඒකට නීතිමය කටයුතු ඉදිරියේදී කරනවා. කරලා ඒ අවශ්‍ය පාඩුව, සභාවට වෙච්ච අලාභය අය කර ගන්න කටයුතු කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඒක තමයි මමත් කිවුවේ. මේ මුදල අය කර ගන්න.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඔබතුමා ඒක සමච්චලයට කිවුවම හිතෙන්නේ නිකං අපි වැරදියට ගිහිල්ලා අපි කලබල වෙලා මේ දේ වුණා වගේනේ. ඒක ඔබතුමා නොදැනුවත්කම නිසා කියන්න ඇත්තේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** සමච්චලයට කාරණාවක් නෙමෙයි මම කිවුවේ. මම කිවුවේ දැන් ඒ වතුර ලැබුණා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඒ කටයුත්ත කරනවා. ඒක අපි ස්ථිර කරනවා දැන්. අවුරුදු 30 ක් 40 ක් වතුර නැතුව ඉන්න මිනිස්සුන්ට සභාවේ මැදිහත් වීමෙන් වතුර ලබා දුන්නා. ඒකේදී නීතිමය කටයුත්තකට ගිහිල්ලා පාඩුවක් සිදු වුණත් මේක සුභසාධන ආයතනයක් ප්‍රාදේශීය සභාව කියන්නේ. ඉතිං ඒ කටයුත්ත කරලා යම් වැරදි වැටහීමකට ගිහිල්ලා බැකෝ යන්ත්‍රයට පහර දුන්නා. ඒක වෙනත් කාරණයකට ගිය වාහනයක්. අපි ගියේ වෙනම දේකට සාකච්ඡා කරන්න. සාකච්ඡා කරලා සිදු වෙච්ච දේ ඒක. සභාවෙන් මුදලක් වැය වුණා උසාවි කටයුතු වලට. සභාවේ බැකෝ එක විනාශ වුණා. නමුත් ඒ කටයුත්ත ඉදිරියේදී නඩු කටයුත්තක් මගින්ම ඉෂ්ඨ කර ගන්නවා කියලා බොහොම පැහැදිලිව කිවුවනේ. ඒක හරි. බොහොම ස්තුතියි ඔබතුමාට.

**29.** තොටගොඩ සුගුණ මාවතේ පස්මාළුව කොටසෙහි පදිංචි නිවැසියන්ට පානීය ජලනල පද්ධතියක් ලබාදීමටත්, ජලනල එලීම සඳහා ප්‍රාදේශීය සභාවේ ජේ.සී.බී යන්ත්‍රය සහ කම්කරු මහතුන් යෙදවීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඒකට ඔබතුමාට අදහස් දක්වන්න තියෙනවාද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකේ යෝජනාව ස්ථිර කර ගන්න. නමුත් ඒකේ ගැටළුවක් තියෙනවා. අපි පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් විමසලා බැලුවා. අපේ සභාව එන්න කලින් ලේකම් පාලන කාලයේදී අනුමත කරපු ඉඩමක් මේක. ලේකම් කියන්නේ එතකොට නෛතික සභාව. සභාවේ සම්පූර්ණ බලය ලේකම්ට එතකොට දීලා තිබුණා. ඒ ලේකම්වරයාගේ කාලයේදී කෙරුන ඒවා. ඒක සභාව අනුමත කරලා දීපු ඉඩමක්. උදාහරණයක් කියන්නම්, මම මේ වෙලාවේ සභාපතිවරයා විදියට මම ඉඩමක් අනුමත කරලා දෙනවා. ඔය ජල පහසුකම නැත්නම්, මම ඒ අයගෙන් මුදලක් අරගෙන දෙනවා කියලා නිකම් මේකෙදි හිතන්න පුලුවන් දෙයක්. අධිභාර ගෙවන්න වෙන්නත් පුලුවන් දෙයක් මේ. අර්ථකථනය වෙන්නේ මම මුදලක් අතින් අරගෙන වතුර නොදී, ඒ අයගෙන් වතුර වලට වියදම් නොවී

තමන් සභාවේ මුදල් වලින් වතුර ලබා දෙනවා වගේ වැඩක් තමයි මේක. එහෙම දේවල් වෙන්න පුලුවන් හින්දා තමයි මේකේ ප්‍රශ්නය තියෙන්නේ.

(ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය සභාවට සහභාගී වීම සිදුවිය.)

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** කොතනින්ද ඒ අඩුපාඩුව සිදු වෙලා තියෙන්නේ. සභාවෙන් අඩුපාඩුවක් සිදු වෙලා නැද්ද එදා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සභාවෙන් අඩුපාඩුවක් සිද්ධ වෙලා තියෙනවා. ටැංකි ගහලා තමයි වතුර දීලා තියෙන්නේ. නමුත් ඒක අසාර්ථක ව්‍යාපෘතියක්. ඒකට කමිටුවේ වගකීමක් තියෙනවා. අදාළ කමිටුව ඒකට වගකියන්න ඕන.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** අවුරුදු පහ සම්පූර්ණ වෙලාද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අවුරුදු පහ සම්පූර්ණ වෙලා නැහැ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒ ආයතනයට කියන්න බැරිද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ ආයතනය නැහැ. හොයා ගන්නවත් නැහැ.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** ඒවා රෙජිස්ටර් වෙලා නැද්ද සභාවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අදාළ ආයතනය මහ පොළවේ නැත.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ලංකා භූමියේ නැත.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** ඒක අස්ථානගත වෙන්න බැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අස්ථානගත වෙනවා. වෙන දේවල් පේනවානේ ඉතිං.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මන්ත්‍රීවරුනි, කරුණාකරලා ඇහුම්කන් දෙන්න. මේක මගේ අදහස. සභාපතිතුමා මේ ප්‍රශ්නයේදී ඇත්තටම සුමිත් උප සභාපතිතුමා අපේ සහෝදර මන්ත්‍රීවරයෙක් හැමවෙලේම අපි ආණ්ඩු පක්ෂයේ, විපක්ෂයේ නැතුව එකට ඉන්න. කරුණාකරලා අපි මේ ප්‍රශ්නයට අවධානය යොමු කරමු. ගරු සභාපතිතුමනි, මම කිවුවා වගේ සුමිත් උප සභාපතිතුමා, අපි දේශපාලනයේදී දෙපැත්තේ හිටියත් ඒ සුහදත්වය කවදත් තියෙනවා. නමුත් ප්‍රතිපත්තිමය විදියට මම මේකට විරුද්ධයි. මම දිගින් දිගටම මේ ප්‍රශ්නය කියලා තියෙනවා. අද දවසේ කමිටුවේ වාර්තාව ඉදිරිපත් කරන කොට බොහොම පැහැදිළි වේවි. මම මුල ඉඳලම දරපු අදහසක් තමයි ටැංකි ගහලා වතුර දෙන්න එපා. ඒක වැරදියි. අඩු තරමින් ටැංකියක් ගහලා වතුර දෙනවානම්, සාමාන්‍යයෙන් යනවා කියලා හිතලා උප කල්පනයකට ගිහිල්ලා මෙච්චර මුදලක් යනවා කියලා හිතලා ඒ මුදල සභාවේ තැන්පත් කරලා ඉවර වෙලා තමයි අවසර දෙන්න ඕන. එහෙම නැත්නම් මේ තියෙන්නේ එක උදාහරණයක් නෙමෙයි. දැන් තව ඉස්සරහට තවත් මේ වගේ ප්‍රශ්න ගණනාවක්ම එනවා.

(ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම නම් ඇත්තටම අබේසේකර මන්ත්‍රීතුමා ඉතාමත්ම කණගාටු වෙනවා මේ කාරණය සම්බන්ධව. මොකද ඒ මිනිස්සු ඉඩම් ගන්නේ සභාව ගැන විශ්වාසය තියලා. ඕන කෙනෙක් ගන්නේ සභාව ගැන විශ්වාසය තියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සම්පූර්ණයෙන්ම විශ්වාසය තියලා ගන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතාමත්ම කණගාටු වෙනවා මේ ප්‍රශ්නයේදී ඔය මිනිස්සුන්ට සිදු වෙච්ච අසාධාරණය ගැන. අපි පුද්ගලිකවත් මේක ගිහිල්ලා බැලුවා. ඇත්තටම අසාධාරණයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමා මට විනාඩියක් දෙන්න. ඊළඟට මම බොහොම පැහැදිළිව මේවාට එදා ඉඳලම විරුද්ධයි. හෙට දවසේත් විරුද්ධයි. අපි කියනවා කරුණාකරලා මේ ටැංකි වලින් නම් වතුර දෙන්න එපා. අපිට බැරි වුණා තවම අර වතුර එක පරීක්ෂා කර ගන්න. තමුන්නාන්සේලා දැන් මෙතන අර වෝටර්බෝඩ් එක පාරේ තරංගා ලෑන්ඩ්ස් ආයතනය කරපු වෙන්දේසි ඉඩමට ගියාට පස්සේ එන්නේ අමු ජරා වතුරක්. ඒක බොහොම පැහැදිලිව පේනවා. ඉතිං ගරු සභාපතිතුමනි, ඒ ප්‍රශ්නයට අමතරව ඔබතුමා දන්නවා මේ බෝපෙ පෝද්දල තියෙනවා ඇත්තටම නාය යා හැකියි කියලා අනුමාන කරපු ස්ථාන තුනක්. මම මේක නැවත කියන්නේ මතක් කරන්න ඕන හින්දා. එකක් රොස්වුඩ් එක. අනිත් එක මවුන්ට්ප්ලසන්ට් එක. ඉස්සෙල්ලත් කතා කරලා තියෙනවා අනිත් එක කුරුන්ද කන්ද. කුරුන්ද කන්දට අපේ සුමිත් උප සභාපතිතුමා එක්තරා අවස්ථාවකදී අර කැලි ටික බෙදන්න හැදුවම ප්‍රේමලාල් අබේසේකර විරුද්ධ

වුණා. ඒක ඔබතුමා සද්භාවයෙන් කරපු දෙයක්. නරක හිතකින් නෙමෙයි කරේ. ඇත්තටම රමේෂ් පතිරණ මැතිතුමත් ඒක තේරුම් ගත්තා. ඒක නිසා ඒ දේ කරේ නැහැ. හැබැයි එකක් තියෙනවා මේක කරේ ඒ කන්දේ අනිත් පැත්ත කපලා මේවා කරපු එක. නාය යන්න පුලුවන් කන්දක් මේක. හෙන ගහන අපරාධයක් මේ. මේවා දීපුවට තමයි හෙන ගහන්න ඕන වැඩ කියන්නේ. අපි බොහොම පැහැදිළිව කියන්නේ මේක කොහොමද දුන්නේ. මෙන්න මේවාට විරුද්ධ වෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිත් ඕකේ ලිඛිතව අපේ විරෝධතාව දුන්නා. එවෙලේ අපි මන්ත්‍රීවරුනේ. ඕකේ අපි යන වෙලාවක පාරට පස් ඇවිල්ලා තිබිලා අපි ලිඛිතව අපේ විරෝධතාවය ප්‍රකාශ කරා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපි කට්ටිය ගිහිල්ලා පරීක්ෂා කරලා විරෝධතාවය දුන්නා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** වැරදිකාරයා කවුද මේකේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වැරදිකාරයා අදාළ කමිටුව. ඒ වෙනකොට ඒකට අනුකූලතා සහතිකය නිකුත් කරපු කමිටුව තමයි වැරදි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කමිටුව සම්පූර්ණයෙන්ම වැරදියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ වැරැද්ද මෙහෙමයි. ඒකට ඒ අය උපකල්පනය කරා මේ ටැංකිය ගහලා කරාවි කියලා. නමුත් ඒක අසාර්ථක ව්‍යාපෘතියක්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** උපකල්පනය නෙමෙයි. ටැංකියක් ගහලා අපිට තියෙනවානේ සාමාන්‍ය අත්දැකීම්. විශේෂඥ දැනුම ඕන නැහැ. දැන් පුලුවන්ද ටැංකියක් ගහලා පායන කාලයට නෙමෙයි වහින කාලයටවත් පුලුවන්ද ගෙවල් 10 කට විතර වතුර දෙන්න. බැහැනේ සභාපතිතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හැබැයි අබේසේකර මන්ත්‍රීතුමා මට ගැටළුවක් තියෙන තැනක් තියෙනවා. දැන් මම දන්නේ නැහැ ජල සම්පාදන මණ්ඩලයත් තමන් කැමති ඒවාට දෙනවා. ඒක බොහොම නරක තැනක්. තමන් කැමති ෆිනෑන්ස් වලට ජල සම්බන්ධතාවය දෙනවා. මම පෙරේදා ගියා අපේ මල්ලීගේ වැඩකට අක්මීමන සභාවෙන් කරන එකකට. ඒකට නල ජලය දීලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් එකක් තියෙනවා මම විශ්වාස කරනවා අපිට මේ දැන් ප්‍රශ්නය විසඳගන්න හරි ලේසියි. මොකද දන්නවාද, මේක පොදු දෙයක්නේ. මිනිස්සුන්ට ඉඩම් ඕන. හැබැයි දෙනකොට ඒ පහසුකම් තියෙන්න ඕන. අනිත් ඇමතිවරුන්ට වැඩිය වාසුදේව ඇමතිතුමා සංවේදියි. ඒක හින්දා මම හිතනවා එතුමා මේකට ඇහුම්කන් දේවි කියලා. මේ ප්‍රශ්නය බොහොම පැහැදිළිව එතුමා එක්ක සාකච්ඡා කරමු කණ්ඩායමක් විදියට ගිහිල්ලා හරි. මේක අනිවාර්යයෙන්ම මේවාට දෙන්න ඕන. ඔබතුමා කියන එක ඉතාම නිවැරදියි. අපි දන්නවා මේ දෙන්න බැහැයි කියන වතුර සමහර තැන්වලට දෙනවා. ඉතිං මම ඒකට තමයි ගරු සභාපතිතුමනි කියන්නේ. ඇත්තටම මේ ආයතන තුන මම ඉතාම පහළට දාලා කතා කරන්නේ. යූ. ඩී. එක, මධ්‍යම පරිසර අධිකාරිය, එන්.බී.ආර්.ඕ. එක. මුන්ට නැහැ කිසිම තැකීමක්. අන්තිමට අමාරුවේ වැටෙන්නේ, ගහගන්නේ, බැණ ගන්නේ, අපහාස කර ගන්නේ සභාවේ අපි. ඒ කියන්නේ මොකක්වත් හින්දා නෙමෙයි. පැහැදිලිව කියනවා නම් එන්.බී.ආර්.ඕ. එක මේක දෙන්න බැහැ කියලා, පරිසරය අනුව මේක දුන්නොත් මෙතන විනාශයක් වෙනවා කියලා කියනවා නම් හරි. නාගරික සංවර්ධන අධිකාරියට තියෙනවා විශේෂ වගකීමක්. එතන ඉන්නේ හොරු රැළක්. මේක බය නැතුව කියනවා. හොරු රැළක් ඉන්නේ. තමුන්නාන්සේලා දැන ගන්න ඕන ගරු මන්ත්‍රීවරුනි, මන්ත්‍රීවරියනි, ඒකේ හැමදාම කරලා තියෙන්නේ ලොකුවට චෝදනා ගිහිල්ලා යනකොට මොකක්ද කරේ. මේ සභාපතිතුමන්ලා අපි පන යනකම් හැප්පුණා. සුගත් මන්ත්‍රීතුමන්ලා, අපි කට්ටිය හැප්පෙනකොට අන්තිමට මොකක්ද කරන්නේ ට්‍රාන්සර් එකක් කරනවා. මේකේ හිටියා කිසිම ධර්මයක් නැති දහම් කියලා මනුස්සයෙක්. මම බය නැහැ නම් කියන්න. මොකද හේතුව ඒ අය නිර්මාණය කරලා ගියපු දේවල් තමයි මේකේ තියෙන්නේ. අදත් ප්‍රශ්න විදියට ඇවිල්ලා තියෙන්නේ ඒවා. කරන එකම දේ ට්‍රාන්සර් එක විතරයි. ඉතිං මේක මේ හොර ගුහාවක්. ඇත්තටම මේකේ ලොකු වගකීමක් තියෙනවා ජනාධිපතිතුමාට. ජනාධිපතිතුමා බොහොම කෙලින් ඉන්නවා. අපි දන්නවා නාගරික සංවර්ධන අධිකාරියේ ඒ වැඩ කරන කාලයේදී. අපි මේ ප්‍රශ්න ඇත්තටම බොහොම පැහැදිළිව එතුමන්ලාට ඉදිරිපත් කරන්න ඕන මෙන්න මේ වෙච්ච හානිය, මේ අය වැඩ කරන්නේ මෙහෙමයි කියලා. මොකද මෙතන දැන් අද දවසේ කෙරෙන්නෙත් එහෙම ඒවා. මේ නාගරික සංවර්ධන අධිකාරියෙන් අපි තොරතුරු පනත යටතේ ඇහුවා. මේකේ නැවතත් කියනවා ඔබතුමන්ලාට. එක තැනක කියනවා එන්.බී.ආර්.ඕ. රිපෝට් එක දෙන්න බැහැ කියලා ඒ අය දීපු එකට. තුන්වෙනි පාර්ශවයක් නිසා දෙන්න බැහැ කියනවා. මේ මේ තැන්වල ඇති ගන්න කියනවා. හැබැයි තව එකකට මම ඉල්ලලා යැවුවම ඒක දෙනවා. අර හොර වැඩේ කරපු තැනට දෙන්න බැහැ. නමුත් අනිත් තැනට එවනවා. මේක තමයි තත්ත්වය. ඒක හින්දා අපි රණ්ඩු වෙන්න ඕන නැහැ. අපේ මත කිහිපයක් තියෙන්න ඕන නැහැ. ඒ නිසා මම දන්නේ නැහැ කියන්න මේකට තීන්දුවක් ගන්නවාද, නැද්ද කියලා. ඇත්තටම ගරු සභාපතිතුමනි, තීන්දුවක් ගන්නවා නම්

මේ අසරණ මිනිස්සු වෙනුවෙන් ගන්න ඕන පූර්වාදර්ශයක් වෙන්න නෙමෙයි. කිසිම තැනකට මේක බලපාන්නේ නැහැ. මේක කෙලින්ම පැහැදිලිවම වෙන්දේසි නොකල යුතු තැනක්. ඊළඟට එකක් තියෙනවා ඒ කාලයේදී කෙලින්ම මේ චෝදනාව අපිට දාන්න පුලුවන්. අපි ඉස්සරහට ගන්න ක්‍රියාමාර්ග වලදී කමිටුවක් විදියටත් තීන්දු කරලා අපි ඒ වැඩ ටික කරමු. ඒ පූර්වාදර්ශයක් නොවෙන්න තීන්දුවක් ගන්නවානම් මම දන්නේ නැහැ කියන්න. නැත්නම් ප්‍රතිපත්තියක් විදියට මම නම් මේකට විරුද්ධයි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේ කාරණය සම්බන්ධයෙන් අපේ සභාව පැත්තෙනුත් කරුණු කියන්න ඕන. මම කියන්නේ දැන් මේ මොහොතේ මේ මිනිස්සු වින්දිතයෝනේ. දැන් මේ පදිංචිකරුවෝ වින්දිතයෝ වෙලා. ඇත්ත ප්‍රශ්නය තියෙන්නේ වෙන තැනක. ප්‍රශ්නයට මුහුණ දීලා ඉන්නේ අහිංසක ඉඩම්හිමි පදිංචිකාරයෝ. ඒ නිසා අපි මේ තීන්දුවේදී කරන්න ඕන කාරණයක් තියෙනවා. අදාළ වැරදිකරුවන්ට නීතිය ක්‍රියාත්මක කරන එක, එක කාරණයක්. හැබැයි වැරදිකරුවන්ට නීතිය ක්‍රියාත්මක කරනකම් මිනිස්සුන්ට දඬුවම් විඳින්න බැහැ. ඒ නිසා ඒකට නිවැරදි ක්‍රියාමාර්ගයක් අරගනිමින් ජනතාවට සහන දෙන්න මේක ක්‍රියාත්මක කරන්න. මේකට අපේ එකඟතාවය ප්‍රකාශ කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක අපි ස්ථිර කරලා කියන්නම්. ඔබතුමා ඒ නීත්‍යානුකූලභාවය බලලා පුලුවන්නම් ක්‍රියාත්මක කරන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේකට නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගමු අපි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ- 30.** තොටගොඩ හේනවත්ත හා කපුහෙම්පල දොස්තරදූව මාර්ගයන්හි පළල අඩි 14කි. වෙල්යාය මැදින් පිහිටා ඇති මෙම මාර්ගය දෙපස සෝදා පාළුවට ලක්වී ඇති බැවින් කොන්ක්‍රීට් මාර්ගයට හානිවීමේ අවධානමක් මතුවී ඇත. එබැවින් සභාවේ ජේ.සී.බී යන්ත්‍රය, ට්‍රැක්ටර් රථය සහ කම්කරු මහතුන් යොදා මාර්ගය දෙපස පස් දමා තලා පිළිසකර කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** මොකද මේක කිලෝමීටරයක් පමණ තියෙන්නේ වෙල්යාය මැදින් පාර. සෑහෙන්න මුදලක් වැය කරලා තමයි ඒ පාර හැදුවේ. දැනට ඉරි තැලීම් තියෙනවා. ඒ මාර්ගය ඉක්මනට ප්‍රතිසංස්කරණය කළ යුතුයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ගරු මන්ත්‍රිනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය සභාවට සහභාගි වීම සිදුවිය.)

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ- 31.** බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පර්චස් 6 සහ 7 ලෙස කුඩා ඉඩම්වල පදිංචි නිවැසියන්හට වැසිකිළි තැනීමේදී දැඩි දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදුවේ. ඒ පිළිබඳව කරුණු විමසීමේදී ප්‍රාදේශීය සභාවෙන් තාක්ෂණික උපදෙස් එම නිවැසියන්ට ලබා ගන්නා ලෙස මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා වෙතින් උපදෙස් ලැබිණි. එබැවින් එම නිවැසියන්ට ආරක්ෂිත හා ප්‍රමිතියෙන් යුතු වැසිකිළි වලක් තනා ගැනීමට තාක්ෂණික උපදෙස් හා අවශ්‍ය සැලසුමක් ලබා දෙන ලෙසට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිට ඒකට නිර්දේශ කරන්න පුලුවන් සෙප්ටික් ටැන්ක් එකක ප්ලෑන් එකක් ඇඳලා වෙබ් අඩවියේ දැම්මා නම් හරි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, අදාළ බිම් කඩේ ඉදිකරන්න තමයි ඒ අවසරය ඉල්ලන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සීල් ටැංකියකුයි, බඳින ටැංකියකුයි දෙකක් යෝජනා කරන්න පුලුවන්නේ.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඒ කටයුත්ත කරන්න කොයිතරම් කාලයක් යාවිද දන්නේ නැහැ. මිනිස්සුන්ට තදබල අවශ්‍යතාවයක් තියෙනවා. මම ගිය සභාවට ඉස්සෙල්ලා සභාවකදීත් මේක කතා කරා. මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්වරු කියන්නේ සභාවේ ඒ අදාළ නිලධාරීන්ගේ උපදෙස් අනුව ඉදිකිරීම කරන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ- 32.** කපුහෙම්පල ප්‍රාදේශීය සෞඛ්‍ය මධ්‍යස්ථානයේ ඉහල මහල සඳහා සභා අරමුදලින් විදුලිය ලබාදීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** වයිරින් කරලා ඔක්කොම සකස් කරලා තියෙන්නේ. විදුලි පංකා හයිකරලා තියෙන්නේ. ඒක සභාව සතු ප්‍රජා ශාලාව සහ අදාළ සෞඛ්‍ය දේශන පවත්වන ශාලාව. විදුලි පංකා සවි කරලා සියලු වැඩ අවසන් කරලා තියෙනවා. ඒකට වෙනම විදුලි සම්බන්ධතාවයක් ඉල්ලන්නේ. ඒක කරන්න පුලුවන් නේද අපේ සභා අරමුදල් වලින්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, අපේ සුමිත් උප සභාපතිතුමාගේ යෝජනාවල පළවෙනි යෝජනාවේ මට ගැටළුවක් නැහැ වතුර දුන්නට. හැබැයි මම ඔබතුමාගෙන් ඇහුවම කාසල්වත්තේ මට වතුර ලබා දෙන්න මුදල් දෙන්න පුලුවන්ද කියලා, ඒකට මට මුදල් දෙන්න බැහැ කියලා කිවුවා. ජලය ලබා දෙන්න බටය දික් කරන්න සල්ලි සභාවෙන් දාන්න පුලුවන්ද ඇහුවම ඔබතුමා මට බැහැ කිවුවා ඒකට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේකත් බැහැ ඉතිං. කෙරෙන්නේ නැහැ.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** චනක මන්ත්‍රීතුමා මේ යෝජනාව දැම්මට උපදෙස් ගන්න කොට ඒක දෙන්න විදියක් නැහැ. සභාවට යෝජනාව දාපු නිසා ස්ථිර කරේ. සභා අරමුදල් සත පහක්වත් මේකට වියදම් වෙන්නේ නැහැ.

**(තේ පානය සඳහා සභාව කල් තබන ලදී.)**

(ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා සභාවට සහභාගි වීම සිදුවිය.)

<u>ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමාලගෙන් සහ මන්ත්‍රීතුමියන්ලාගෙන් අවසරයි.

**33.** ප්‍රයිම් ෆැමිලියන්, මාතර ගෙවත්ත මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේ යෝජනාව කළාට මේකත් ඇත්තටම වෙන්දේසි ඉඩමක්. හැබැයි දැන් අද වෙනකොට යන්න බැහැ. ඒ ඉඩමේ ඉන්න අය ඉල්ලීමක් කරලා තියෙනවා අපේ සභාවෙන්. ඒ ඉල්ලීම අනුව තමයි මේ යෝජනාව එන්නේ.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** අවුරුදු කීයක් වෙනවාද.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** අවුරුදු හතරහමාරක් පහක් විතර ඇති. යන්න බැහැ. මගේ වුවමනාවට නෙමෙයි ඇත්තටම මේ යෝජනාව දාන්නේ. ප්‍රදේශයේ පාර පාවිච්චි කරන අයගේ ඉල්ලීම පරිදි තමයි දාන්නේ. මම හිතන්නේ ඒ ලියුම ඇති සභාවේ. දැන් අපි හැමදාම කියන කතාව තමයි ඉඩම් වෙන්දේසි කරන ආයතන වලින් ඉඩම් වෙන්දේසි කරනවා. අන්තිමට අපිට එනවා පාරවල් හදන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකෙ කාලය බලන්න කොච්චර කල්ද කරලා තියෙන්නේ කියලා.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ- 34.** බෝපෙ පාලම අසළින් උතුරු දෙසට වැටී ඇති මාර්ගයේ ආරම්භයට බෝක්කුවක් යොදා සංවර්ධනය කරන ලෙස යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :- 35.** ගිංතොට බටහිර, මලකඩවත්ත මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා :-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :- 36.** පියදිගම, පරණවත්ත පාර නොහොත් ගොරකගහවත්ත මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :-** මේ යෝජනා සියල්ල ජනතාවගේ ඉල්ලීම පරිදි එන යෝජනාවල්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :- 37.** ගිංතොට භාරද්වාජ මාවතේ ඉතුරු කොටස සහ අතුරු මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා :-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :- 38.** වටරක බටහිර, දරගොඩ, බොරළුගොඩැල්ල මාවත "ග්‍රීන් මවුන්ට් ගාර්ඩන්ස් මාවත" ලෙස නම් කිරීමට යෝජනා කරමි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා :-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඒක අදාළ ක්‍රමවේදයට කරන්නම්.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :-** මේක අදාළ ක්‍රමවේදයට ඉතාම ඉක්මනින් කරන්න. අපි කලින් සභාවල යවපුවා ආවද දන්නේ නැහැ. සාමාන්‍යයෙන් සභාවක තියෙන්නේ මේක පළාත් පාලන දෙපාර්තමේන්තුවට යැව්වට පස්සේ මාස තුනක් වගේ කාලයකදී මේකට විරෝධතා ඇවිල්ලද බලලා මේක ක්‍රියාත්මක කිරීමට හැකියාව ලැබෙනවා. මම දන්නේ නැහැ ඒක මේ සභාවේ යෝජනා කරපුවා කොතෙක් කල් සිදු වුණාද කියලා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා :-** අවුරුදු 10 ටම එක පාරක් කරන්න වුණේ නැහැ. 2011 දී මම යෝජනාවක් කරා පාරවල් දෙකක් නම් කරන්න. තව වෙනතුරු නැහැ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :-** එතනදී මම සඳහන් කරන්න ඕන ගරු සභාපතිතුමනි, මම 1997 දී සභාවට පත් වුණාට පස්සේ ශ්‍රී ගුණසිරි මාවත නමින්, ඒ වගේම ශ්‍රී සෝභිත මාවත නමින් යෝජනා දෙකක් කරා. ඒවායේ ලිපි ලේඛන හරියාකාරව ඇවිල්ලා ඒ පාරවල් නම් කරා. ඒක ක්‍රමානුකූලව සිද්ධ කරන්න ඕන. නැත්නම් අපි මේ ඉල්ලීම් කරපු අයට කරන අගෞරවයක් ඒක. මම කියන එකට නීත්‍යානුකූලව ගිහිල්ලා ඒ කටයුත්ත ඉෂ්ඨ කරන්න කියන ඉල්ලීම මම මේ ගරු සභාවෙන් සහ ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඒකට මම ලේකම්තුමාට කියනවා කවුරුහරි නිලධාරියෙක් යොදවන්න ඒකට. මේ දක්වා සභාවේ කරපු යෝජනා, පාරවල් සියලු දේවල් වලට. මේක මෙහෙම දානවා. ඊට පස්සේ මොකක්ද වුණේ කියලාවත් දන්නේ නැහැ. මෙච්චරම තමයි. ඒ ක්‍රමවේදයට වෙන කෙනෙකුට භාර දෙන්න ඒක.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :-** ඒකට රමේෂ් මහත්තයාව හොඳයි කියලා මම යෝජනා කරනවා. මොකද එතුමා මේකේ වැඩ ටිකක් හොයලා බලලා කරනවා. එතුමා විතරක් නෙමෙයි අනිත් අයත් වැඩ කරනවා හොඳද.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා :-** වැඩ ටික හොයලා බලලා කරනවා හෙට අනිද්දාට ස්ථාන මාරුවක් යන්න ඉන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :- 39.** වටරක, පනහවත්ත මාර්ගයේ බෝක්කුව කාණු පද්ධතිය සමග සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ- 40.** ගිංතොට, ඇළබඩ, පොල්කොරටුව වත්ත මාර්ගයේ ඉතුරු කොටස සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ- 41.** වටරැක නැගෙනහිර ප්‍රජා ශාලාවේ පහත දක්වා ඇති ප්‍රතිසංස්කරණයන් සිදුකිරීමට යෝජනා කරමි.

I. ජල සැපයුම ලබාදීම.
II. ප්‍රධාන දොර අළුත්වැඩියාකොට ජනේල සඳහා ග්‍රිල් ගැසීම
III. වහල ප්‍රතිසංස්කරණය
IV. ළමා උයනේ පවතින සෙල්ලම් උපකරණ ප්‍රතිසංස්කරණය සහ ඒ වටා වැටක් ඉදිකිරීම.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එම ප්‍රජාශාලාව සම්පත් මහත්තයා බදු පදනම මත ලබාගෙන තියෙනවා. ඒක එතුමා තමයි පවත්වාගෙන යන්නේ. ඒ අතරතුර අපේ ප්‍රදේශයේ ජනතාවගේ අවශ්‍යතාවයන් වලටත් ඒක ලබා දෙනවා. තිස්ස මන්ත්‍රීතුමාගේ කොට්ඨාශයේ දෙයක් මේක මගෙන් ඉල්ලීම් කරාට. මම මේක සභාවට ඉදිරිපත් කරා. තිස්ස මන්ත්‍රීතුමාගේ කොට්ඨාශයේ මගේ ගෙවල්ගාවනේ මේක තියෙන්නේ. මගේ ඡන්ද හයකුත් තිස්ස මන්ත්‍රීතුමාට තමයි දුන්නේ. ඒක ඉතිං පැහැදිළිව කියන්න එපැයි. ඔන්න හරියටම දැනුවත් කරා තිස්ස මන්ත්‍රීතුමා. එතකොට හරිනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ- 42.** වැලිපිටිමෝදර, පහළගොඩ ගම්මානයේ මාර්ගයේ කොටසක් ජලයෙන් යටවන බැවින් එම මාර්ගය ජලයෙන් යට නොවන පරිදි සුදුසු ලෙස සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මේ සඳහා අපේ තාක්ෂණ නිලධාරිතුමා එක්ක ගිහින් බලන්න ඕන. ඒක මමත් ගිහිල්ලා බැලුවා. ටිකක් අපහසුතාවයකුත් තියෙන එකක්. ලෙවල් කරන එක කොහොම කරන්නද කියලා හිතා ගන්න බැහැ. ඒ නිසා මම ඒ අවස්ථාව ලබා දෙන්න කියලා ඉල්ලීම කරනවා. අපේ තාක්ෂණ නිලධාරි එක්ක ගිහින් ඒක පරීක්ෂා කරන්න අවස්ථාව දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ- 43.** ගිංතොට, වටරැක බටහිර, දඩල්ලගේ රසිකා සංජීවනි මහත්මියගේ නිවසට යන මාර්ගය සුදුසු පරිදි සංවර්ධනය කරන ලෙස යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මේක රේල්පාර අයිනේ තියෙන්නේ. අපිට ඉල්ලීමක් කරහම බැහැයි කියන්න බැහැ. නමුත් මේක පරීක්ෂා කරලා බලන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ගෙවල් කීයක් තියෙනවාද.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ගෙවල් දෙකක් වගේ තමයි තියෙන්නේ. ඒ වුණාට මෙහෙමයි. සභාපතිතුමා, අපේ තාක්ෂණ නිලධාරිතුමාගේ සහයෝගය අපිට ලබා දෙන්න කියලා ඉල්ලීමක් කරනවා. මොකද ගිහිල්ලා බලලා ඒ අය දැනුවත් කරන්න හරි අපිට අවශ්‍යතාවය තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ- 44.** බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඇති ත්‍රීරෝද රථ ඇතුළු කුලී රථ අප ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒ යෝජනාව එන්නේ මෙහෙම. දැන් නිකං අපි කිවුවොත් කහදූව වත්ත, කිතුලම්පිටිය, කලේගාන, හපුගල, වක්වැල්ල, ගිංතොට, පියදිගම පැතිවලට ගියාම ඒ අයගේ ඉල්ලීමක් තියෙනවා මේක අපිට විදිමත් ලෙස කරලා දෙන්න කියලා. ලියාපදිංචි කිරීම කරලා දෙන්න කියන්නේ. එම ඉල්ලීම නිසා තමයි මම මේ ඉල්ලීම කරන්නේ. නැත්නම් මගේම අදහසක් නිසා නෙමෙයි. එම නිසා මම මේක යෝජනා කරේ ජනතාවගේ ඉල්ලීමක් විදියට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට දැනට හදාගෙන යනවා අතුරු ව්‍යවස්ථාවක්. මම කලින් ඒක කිවුවා.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ- 45.** පහත දක්වා ඇති ඉඩම්වල අයිතිය පිළිබඳව විස්තර ලබා දෙන ලෙස යෝජනා කරමි.

I. පියදිගම, උක්වත්ත පාරේ (වම) , 65/30 පොදු ළිඳ
II. පියදිගම, උක්වත්ත පාරේ (දකුණ) 70/ඒ ඉඩම
III. කලේගාන, ගිංතොට පාර (දකුණ) 120 - ඉඩම
IV. කලේගාන, ගිංතොට පාර (දකුණ) 220/5 - ඉඩම
V. පියදිගම, උක්වත්ත (වම) 65/61 පොදු ළිඳ

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මම මුල් වරට මගේ කොට්ඨාශයේ හඳුනාගතිපු තැන් කිහිපයක් ඉදිරිපත් කරනවා. ඒ වගේම ඉදිරිපත් කරන කොට මම කියන්න කැමතියි මේ කාරණයටත් කවුරු හරි පත් කරන්න. මොකද හේතුව මේක අපිට අවශ්‍යතාවයක් තියෙන එකක්. අපේ ඉඩම් අයාලේ යනවා. අපතේ යනවා. කවුරුහරි පවරාගෙන තියෙනවා. ඒ තත්ත්වයට පත් වෙලා. මේවා ගැන විස්තරත් එක්ක අපිට තියෙනවා. මේ ප්‍රාදේශීය සභාවේ අපේ වරිපනම් පොත්වල තියෙනවා මේ ඉඩම්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම ඉල්ලා සිටිනවා ගරු සභාපතිතුමා ගැමුණු මාවතේ ළිඳත් මේකට ඇතුල් කරන්න කියලා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඕකට යෝජනාව දාලා ගොඩක් කල්.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** සභාවක් විදියට ගරු මන්ත්‍රීතුමන්ලා තමන්ගේ කොට්ඨාවල තියෙන ඒවා ගැන මම හිතන්නේ ඒ ඉල්ලීම කරන්න ඕන කියලා පොදුවේ සඳහන් කරනවා. මොකද මේ ඉඩම්වල විශාල වටිනාකමක් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිට තියෙන සියලුම වත්කම් ටික මේ ලබා දීපු පොතේ තියෙනවා. අයවැය ලේඛනයේ තියෙනවා. ඉතිං ඉස්සෙල්ලා බලන්න ඒකේ තියෙනවද කියලා. ඒකේ ඔය කියන ගොඩක් ඒවා තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔය සියල්ලටම ගේන්න එහෙමනම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නැති ඒවා කියන්න අපි ඒක වෙනම බලමු.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඔතන බලලා මේවා කරන්න. මම මේ විස්තර ටික ගත්තේ වරිපනම් පොතෙන්. එතකොට ඉඩම් කොමසාරිස්තුමා ගාව මේකේ විස්තර ටික තියෙනවා. අපි කිවුවොත් පියදිගම, උක්වත්ත පාරේ (වම) 65/30 පොදු ළිඳේ ප්‍රමාණය තක්සේරු එකේ තියෙනවා. අපිට තියෙන ප්‍රශ්නය ඒක තමයි. අපි මේ ඉල්ලීම කරහම අපිට අයිතිය නැහැ කියයි. තක්සේරු දෙපාර්තමේන්තුවට ලිපියක් යවලා විස්තර ගන්න. තොරතුරු දැනගැනීමේ පනතෙන් හරි ඉල්ලීමක් කරලා අපිට මේ විස්තර ටික ලබා දෙන්න මේ ඉඩම් අපිට කොච්චර ප්‍රමාණයක් තියෙනවාද කියලා. එතකොට මේක මතුවෙලා එනවා. ඒකට විශේෂ අවධානයක් යොමු කරලා මේ සඳහා අපේ නිලධාරි මහත්මයෙක්ව පත් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. මේකට මම ඉන්ද්‍රජිත් මහත්තයා සුදුසු යැයි යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එයාටම මේ වැඩ ටිකත් භාර දුන්නා නම් ඉවරයිනේ සභාපතිතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ කිහිපයයිනේ. මේක ගැන බලන්න කියමු. අවුලක් නැහැ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම මේක අවංකවම කියන්නේ වෙන හේතුවක් නිසා නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් මේ බෝපෙ පන්සල ඉස්සරහ තියෙන ඉඩමේ අද වෙනකොට මොකද තත්ත්වය. බෝපෙ පන්සලේ හාමුදුරුවෝ හම්බවෙන්න එතනට යන්න බැහැ අහනවා. හොඳටම පේනවා ඒක. අඩුම තරමේ අපේ සභාවට බැරිවුණානේ අනවසර ඉදිකිරීමක් කියන එකට නඩු දාන්න.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** අපිට යන්න බැහැ. ගමේ ඇවිදින්න බැහැ අපිට. අපිට නිකං මන්ත්‍රීවරු විදියට නෙමෙයි නරි, බල්ලෝ ගාණට දාලා කතා කරන්නේ මිනිස්සු. අපිව දාලා තියෙන්නේ බල්ලාගේ ගාණට. මුන්ට මන්ත්‍රීකම් වැඩක් නැහැ, දෙයක් කර ගන්න බැහැ කියලා කියනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක එකක්. අනෙක් එක අපි ලැජ්ජ වෙන්න ඕන. අපි කතා කරන එක විතරයි කරන්නේ. අර සෙන්ට්‍රිටාස් එකේ සභාවට තිබුණ ඉඩම, පොදු කටයුතුවලට තිබුණ ඉඩම, අල්ලපු ඉඩමේ මිනිහා හොර ඔප්පුවක් ලියා ගෙන, ප්‍රකාශන ඔප්පුවක් ලියා ගෙන.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඔන්න ඕක තමයි ප්‍රශ්නය. ඒකෙන් සභාව හැල්ලුවට පත් වෙනවා. සත පහකට ගනන් ගන්නේ නැහැ. සභාපතිතුමා, මන්ත්‍රීවරු, සභාව ගණන් ගන්නේ නැහැ. එහෙම එකක් වෙලා තියෙන්නේ අපිට. ගෞරවයක් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පොදු කටයුතු වලට නෙමෙයි එතන පර්චස් 2 යි ගාණක් ඉතුරු කලා. මනිද්දී ඉතුරු වෙලා තියෙනවා. ඒක " ද ෆිනෑන්ස් " ආයතනයට අයිති. අපිට භාර දීලා නැහැ. " ද ෆිනෑන්ස් " ආයතනය කියනවා ඒක ලියලා දුන්නේ නැහැ කියලා. අර මනුස්සයා ප්‍රකාශන ඔප්පුවක් ලියාගෙන ඒකට. ඉතිං ඇයි අපිට ඒක බැරි. මම දැන් කීප පාරක්ම කිව්වා. ඇයි බැරි අපිට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් පරීක්ෂණයක් ඉල්ලන්න. මම දන්නේ නැහැ ඉතිං.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මුලින් පටන් ගන්න සභාපතිතුමා මම මේක ඉදිරිපත් කරේ. මොකද යම් දෙයක් අපේ ඔලුවෙත් තියෙනවා. අපිත් දන්නවා මෙහෙම කරන්න පුලුවන් දේවල්. මේක හොරුන්ට, මංකොල්ලාකාරයන්ට අත්පත් කර ගන්න දෙන්න බැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කිවුවේ මට මතක් වෙච්ච කාරණා දෙක. ඕකට මම කියලා ඇති. මට මතක් වෙන්න, මතක් වෙන්න, කියන්න ඕන. මම කියලා ඇති දහපාරක් විතර ඔය බෝපෙ පන්සල ඉස්සරහ තියෙන ඉඩම ගැන. හොඳටම දන්නවා අර මිල්රෝයි කියන මිනිහා ඕකට හොර ඔප්පුවක් ලියාගෙන තියෙනවා කියන එක. හොඳටම ඒක දන්නවා. නමුත් මෙහෙන් මුකුත් ක්‍රියාමාර්ගයක් අරගෙන නැහැ. ළිඳ තිබුණ ඉඩම ඒක.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** ඒකම තමයි ගරු සභාපතිතුමා පර්චස් 90 ක ඉඩමටත් වෙන්නේ පෝද්දල.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඕවට අපි ක්‍රියාමාර්ග නොගන්න නොගන්න අනිත් මිනිහා කරන්නෙත් ඕකම තමයි.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** තව අවුරුදු 10 ක් ගියාම පෝද්දල ඉඩමටත් වෙන්නේ ඕක තමයි ගරු සභාපතිතුමා. මම දන්නේ නැහැ. මේකට වෙන්නේ ඒකමනේ. මේ එකක්වත් අඩුම ගාණේ බලන්න ලේකම්තුමා. බෝපෙ පන්සල ඉස්සරහ එකත් මේකෙ තියෙනවාද.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** තියෙනවා කලේගාන ගිංතොට පාරේ (දකුණ) 120 ඉඩම.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ ටිකටයි අර සෙන්ට්‍රිටාස් එකේ එකටයි දාන්න ගුණසේකර මහත්තයා. ඒ ඉදිකිරීම් වලට නඩු දාන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඉදිකරලා ඉවර නැත්නම් තහනම් නියෝගයක් ගන්න අපි නඩු දාන්න යන්න එපා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතකොට ඒ අය ඉදිරිපත් කරන්න එපැයි. ඒ අයට තහනම් නියෝගයක් හරි නඩුවක් හරි දැම්මට පස්සේ ඒ අය ඉදිරිපත් කරන්න එපැයි ලේඛන. ඒක අරගෙන දාන්න ඇහැකිනේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, අපිට කොට්ඨාශයකින් ඡන්ද 1500 ක් 2000 ක් අපිට හම්බ වෙනවා සාමාන්‍යයෙන් ජයග්‍රහණය කරන්න. අපිට ඊට පස්සේ මේ අතරතුර අපි සම්බන්ධ වෙච්ච මිනිස්සු නෙමෙයි මේ. අපේ ඡන්ද දායකයෝ නෙමෙයි. එහෙම නම් මන්ත්‍රීවරු විදියට අපිත් කියන්න ඕන ඔන්න ඕක අල්ලාගෙන හදාගනින් කියලා. ඇත්ත කතාව ඒක. අපි එහෙම කරලා නැහැ. අපි එහෙම කරන්නේ නැහැ. අපිට එහෙම කරන්න බැරි නිසා තමයි මේ හොරකම් කරපුවා හොයලා නිවැරදි කරන්න හදන්නේ. වෙන කිසි දෙයක් හින්දා නෙමෙයි. මේකෙ අපි දේශපාලනය ඉස්සරහට කරා හෝ නොකරා හෝ ඒක වෙනම දෙයක්. සත්‍ය, සත්‍යය විදයට වෙන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේකේ කවුරුත් නොදන්න කාරණාවක් තියෙනවා. එක්කෙනෙක් ඉන්නවා වැඩ තහනම් කරපු හිටපු කෝට් සාජන් කෙනෙක්. එයා මේ පැත්තේ තියෙන ඉඩම් මංකොල්ලාකනවා. සම්පූර්ණයෙන්ම හොර ඔප්පු. ඒවා අපි දැනුවත් කරනවා. හොර ඔප්පු හදලා දීලා මංකොල්ලාකනවා. වටරැක පැත්තෙන් ඉඩමක් මෙහෙට ආවොත් ඒ මිනිහා ගෙනල්ලා දෙනවා විරෝධතාවයක් මේක මගේ කියලා. මොන ඉඩමද එන්නේ මෙහේට අනුමැතියට ඒ මිනිහා ගෙනත් දෙනවා විරෝධතාවයක් මේක එයාගේ ඉඩමක් ඒකට පරීක්ෂණයක් කරන්න කියලා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ගහක් කැපුවොත් ගහට අයිතිය කියනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක මාර වැඩක් ඉතිං.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** වටරැක හෙට්ටිආරච්චි ඉඩමටත් අයිතිවාසිකම් කියනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔව් හැම එකටම අයිතිවාසිකම් කියනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මම කරුණාවෙන් ඉල්ලීම කරනවා මේ ටික අපිට හොයලා දෙන්න ඉස්සෙල්ලා. ඊට පස්සේ අනෙක් මන්ත්‍රීවරුන්ටත් තේරුම් ගන්න පුලුවන් වේවි ඒ ප්‍රදේශ වල තියෙන දේවල් ගන්න පුලුවන් බව. තක්සේරු එකටත් ලියුමක් දාන්න. මේවා අපිට තියෙන ඉඩම්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 46.** පරනගෙදරවත්ත චන්දන මහතාගේ නිවස අසළ පැති කාණුව ඉදිකිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**47.** ගොඩකන්ද, උළුවිටිකේ මාර්ගයේ රාමනායක කඩය අසළ සහ සමන් මහතාගේ නිවස අසළ අධික වේගයෙන් වාහන ගමන් කිරීම නිසා අනතුරු බහුලව සිදුවේ. එය වැළැක්වීම සඳහා වේගය අඩු කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට දන්වා යැවීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ඒ වගේම ගරු සභාපතිතුමනි, අවස්ථාව ගනිපු නිසා මම යෝජනා කරනවා. අර ගිංතොට ඉඩම සම්බන්ධව අපිට එවලා තියෙන මේවා එකේදී දැන් පහුගිය දවසක පොඩි සාකච්ඡාවක් කරා. ඉතිං දැන් ලබන සතියේ ඔබතුමාට කතා කරලා රමේෂ් පතිරණ ඇමතිතුමාට කියලා දිනයක් ගන්න කිවුවානේ. ඒකටත් සියලු මන්ත්‍රීවරු සම්බන්ධ කරලා හදන ඒ වැඩපිළිවෙල මොකක්ද කියලා කතා කරන්න. අපිට දිනය දැනුම් දෙන්න. ඒ ගැන දැනුවත් කිරීමක් කරන්න කියලා කියනවා සභාවට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට අපේ පහුගිය දවසක සාකච්ඡාවක් තිබුණා. ඒකෙදී ආව ප්‍රශ්නය ඒකට මොකක්ද කරන්නේ කියන එක. ඉතිං එතනදී මගේ යෝජනාවට එතන ඉඳපු සියලු දෙනාගේ එකඟතාවය ලැබුණා. මගේ යෝජනාව වුණේ ඒක සංචාරක කලාපයක් බවට පත් කරන්න. කැප්පු ඇළ එතන මායිම දිගේ යන්නේ. විශේෂයෙන් අපිටම ආවේණික කැටයම් කර්මාන්තය තියෙනවා. එතන ස්වාභාවිකවම අපිට පුලුවන් බත්තරමුල්ලේ තියෙන අපේ ගම වගේ දෙයක් කරන්න. එවෙලේ කැවිලි එහෙම හදනවා. කැටයම් නිර්මාණ ටික ඒ ස්ථානයේදී කරනවා. ඊට පස්සේ බතික් කර්මාන්තය, රේන්ද කර්මාන්තය, වෙස් මුහුණු කර්මාන්තය ඒ වගේ සියලු කර්මාන්ත විශාල ප්‍රමාණයක් තියෙනවා. විශාල භූමියක් තියෙනවා එතන. ඉතිං එතනදී අපිට පුලුවන් සාප්පු සංකීර්ණයක් හදන්න ඕනෑම විදේශිකයෙකුට භාණ්ඩ මිලදී ගන්න පුලුවන් වෙන විදියට. ඊට පස්සේ කබානා ගහලා ඉවර වෙලා ඒ ආකාරයෙන් හදන්න ඕන. ඒක සංචාරක කලාපයක් බවට පත් කරන්න සුදුසුම ස්ථානයක්. තියෙන්නේ හික්කඩුවයි, ගාල්ලයි අතර. ඒ යෝජනාව අපි නිකං දළ වශයෙන් සාකච්ඡා කරා. ඒකට තවත් යෝජනා අපිට ඉදිරිපත් කරන්න පුලුවන්. ඉතිං ඒක තමයි දැනට අපි යෝජනාවක් විදියට කරන්න ඉන්නේ. සුදුසු කෙනෙක් යොදවලා අපි ඒකට උත්සාහ දරනවා යම් තරමක් දුරට මේක කරන්න. නිශ්චිත වැඩපිළිවෙලක් නැතුව අපිට මේක පවරා ගන්න ඉල්ලන්න හේතුවක් නැහැ. ඒක හින්දා අපි මොකක් හරි සාර්ථක ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කරන්න ඕන ඉතිං. ඕක තමයි අපි දැනට සාකච්ඡාමය මට්ටමේ අරගෙන යන්නේ. අපි ගරු රමේෂ් පතිරණ ඇමතිතුමාගෙන් දිනයක් හා වෙලාවක් ඉල්ලලා තියෙනවා. එතුමාත් සමඟ සාකච්ඡාවක් කරලා අපි මේ යෝජනාව එතුමාට ඉදිරිපත් කරලා එතුමා හරහා ජනාධිපතිතුමාව දැනුවත් කරලා මේ ඉඩම නැවත පවරා ගැනීමට කටයුතු කරන්න ඉන්නේ. එතනදී ඔබ සියලුදෙනාගේම සහාය ඕන. එතනදී අපිට හැකියාව තියේවි අපිට එන්න තියෙන මුද්දර සල්ලි යොදවලා හරි, සභාව විසින් නැවත මේක මිලදී ගෙන සභාවේ දේපලක් විදියට සභාව හරහා නැවත මේක කලින් සඳහන් කරපු කාරණයට යොදවා ගන්න. ඉතිං ඕකේ තත්ත්වය ඔය මට්ටමේ තියෙන්නේ. ඒකෙදී ඔබතුමන්ලාට එවලා ඇති අපිට එවපු ලියුම. අපිට ලියුමක් එවලා තියෙනවා ජනාධිපති ලේකම් කාර්යාලයෙන්. ඒක ඔබතුමන්ලාට ලැබෙන්න සලස්වලා ඇති. "ගාල්ල, ගිංතොට ප්ලයිවුඩ් ආයතනය සතු භූමිය රජයට අත්පත් කර ගැනීම සම්බන්ධව" කියලා ලිපියක් එවලා තියෙනවා. ඒක අනුව තමයි අපි අර ව්‍යාපෘතිය යෝජනා කරගෙන යන්නේ. ඉතිං ඒකෙදී මන්ත්‍රීවරු විදියට ඔබ සියලු දෙනාගේම සහයෝගය අවශ්‍යයයි.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒකට සභාපතිතුමා මේකත් ඇතුළත් කරන්න. ඔබතුමාගේ යෝජනාව හොඳයි. සංචාරක කලාපයක් එතනට හොඳයි. මොකද මැණික් වෙළඳපොළක් එතන තියෙනවා. මැණික් වෙළඳපොළ කරන්නෙත් පාරේ. එතකොට ඒ අයට මැණික් වෙළඳපොළ දාලා මැණික් කර්මාන්තයත් දියුණු කරන්න පුලුවන්. ඒකත් අපි ඇතුළත් කරමු. මේක හොඳ යෝජනාවක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මීළඟ සභාවට අපි ඕක විදිමත්ව දාමු සභා යෝජනාවක් විදියට. මෙන්න මේ කාරණයට සභාව විසින් පවරා ගෙන සභාව මුදල් ගෙවලා ලබා ගෙන මේ කාරණා සඳහා මේක යොදවා ගන්න විශේෂඥ දැනුම තියෙන කෙනෙක් ලවා මේ ව්‍යාපෘති යෝජනාව හදන්න කියන යෝජනාව කරන්නම්.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම ඒකට එකතු කිරීමක් කරනවා. ඕකේ අපිට පුලුවන් ඇත්තටම නිවාස සංකීර්ණයකටත් යන්න. ඒක අපිට බදු දෙන්න පුලුවන්. නිවාස සංකීර්ණයක් එක්ක වෙළඳ සංකීර්ණයකුත් එන්න ඕන. එතකොට අපිට ලොකු ආයෝජනයක් කරන්න පුලුවන් තත්ත්වයක් තියෙනවා. අපිට මේ බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවට ලොකු ආදායම් තත්ත්වයක් එනවා මේ යෝජනාව ක්‍රියාත්මක කරහම. අනෙක් කාරණය තමයි මේක රුපියල් ලක්ෂ අසූවක් වගේ සුලු ගාණකට තමයි දීලා තියෙන්නේ. ඒ ලක්ෂ අසූව අපි ගෙවලා හරි කමක් නැහැ මේක අපි ලබා ගන්න ඕන. ලබා ගෙන ඉවර වෙලා මේකට ඒ විදියේ වැඩපිළිවෙලකට යන්න කියලා මම ඒකට එකතු කිරීමක් කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා ඇතුලු සියලු දෙනාගෙන්ම අවසරයි. අර තුනී ලැලි සංයුක්ත මණ්ඩලයේ තිබුණ ඉඩම සම්බන්ධව කතා කරපු නිසා මමත් පොඩි වචන දෙක තුනක් ඒකට කියන්න ඕන මුල ඉඳන්ම ඒ විරෝධතා වලට සහභාගි වුණ මන්ත්‍රීවරයෙක් විදියට. බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ තිබෙන වාණිජ වටිනාකමින් ඉතාමත්ම ඉහළ තැනක් එතන. දැන් මෙතනදී කියවුණා අපි දන්න විදියට රුපියල් ලක්ෂ අසූවක් වගේ ඉතාමත්ම අඩු මුදලකට තමයි මේක එයාලා අරගෙන තියෙන්නේ. නමුත් ඔබතුමා දැන් සංවර්ධන යෝජනා ඉදිරිපත් කරනවා කෝටියක, කෝටි දෙකක වගේ. ඒවා නවත්වලා ඒ මුදල දීලා සභාව මැදිහත් වෙලා අපි මේක ගත්තොත් ඒ සියල්ල අපිට කර ගන්න පුලුවන්. සභාපතිතුමාට ලොකු ජයග්‍රහණයක් ඒක ලබා ගත්තොත්. එතකොට අපිට කුණු ප්‍රතිචක්‍රීකරණය කරන්න පුලුවන්. අක්කර 17 ක ඉඩමක්නේ. එහෙම දේකටත් යොදවාගන්න පුලුවන්. අපේ කියාස් මන්ත්‍රීතුමා කියපු එක හරි. ඒ මැණික් කර්මාන්තයේ නියැලෙන මුස්ලිම් ජනතාව ඇතුළු පිරිස ඔතන

ඉන්නවා. ඔබතුමා ඉදිරිපත් කරපු ඒ යෝජනාවට මන්ත්‍රීවරයෙක් විදියට හැමදාම, හරිදේට, නීතියට ගරු කරලා වැඩ කරන කෙනෙක් විදියට ඔබතුමා ගන්න ඒ තීන්දුවේදී මම අනිවාර්යයෙන්ම ඉන්නවා. ඒ වගේම ඒකෙදී ලොකු උත්සාහයක් දැරුවා ලියනගේ මන්ත්‍රීතුමා සහ සුගත් මන්ත්‍රීතුමා. ඒ දෙපළ නායකත්වය අරගෙන ඒ උද්ඝෝෂණ ව්‍යාපාරයේ දිගටම හිටියා. මමත් අච්ච නොතකා අඛණ්ඩව හිටියා. ඒ හොඳ දේට අපි ඉන්නවා. ඒක නිසා මම කියනවා කෝටියක් හරි දීලා ඒක ගත්තොත් ඉතාමත්ම වටිනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි උපරිම උත්සාහය ඒකට දරන්න ඕන. මගේ නම් හැඟීම ගනිපු ගාණටම දෙන්නේ නැහැ. රජයේ තක්සේරුව අනුව ගාණ ඔය වගේ කිහිප ගුණයක් වැඩි වේවි. අපි කීයට ගියත් උත්සාහයක් දරමු.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** වැඩි වෙන එක හරි.

<u>ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ- 48.** මොල්ලිගොඩ වත්තේ කේ.ඩී. ශිරෝමි මහත්මියගේ නිවස අසළින් පහළට යන මාර්ගය කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඒකෙදී සභාපතිතුමා අපේ හිටපු දකුණු පළාත් කෘෂිකර්ම අමාත්‍ය ආරියතිලක මැතිතුමාගේ ප්‍රතිපාදන වලින් වෙන්කරපු පොඩි පාරක්. ඒ මුදලක් තියෙනවා සභාවේ. ඉතිං ඒක කාලයක් තිස්සේ ඇදි ඇදී යනවා. මේක කරන්න කියලා මම යෝජනා කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ- 49.** උක්වත්ත විහාරස්ථානයට යන පඩිපෙළට සම්බන්ධ මාර්ගයේ ඒ.ඒ. සිරිමලී මහත්මියගේ ඉඩමේ පාරට මායිම්ව පිහිටා ඇති පැති බැම්ම දමා මාර්ගයේ ආරක්ෂාව තහවුරු කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඒක ලොකු විශාල එකක් නෙමෙයි. පොඩි බැම් කෑල්ලක් තියෙන්නේ. පාර කැඩී ගෙන යනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ- 50.** හපුගල ඉංජිනේරු පීඨය මොල්ලිගොඩ වත්ත ග්‍රාමයට අයත් මාර්ගයක් අත්පත් කරගෙන ඇත. එම මාර්ගය සඳහා පර්චස් 34ක බිම් ප්‍රමාණයක් ඇති බව තහවුරු කරගෙන ඇත. එම ප්‍රමාණයට සරිලන බිම් කොටසක් ඔවුන් මිලදී ගත් ඉඩමෙන් ලබා ගැනීමට කටයුතු කරන ලෙසත් එම ඉඩමේ අයිතිය සභාව සතු කරගෙන ප්‍රදේශයේ ජනතාවගේ පොදු කටයුතු සඳහා ලබාදෙන ලෙස යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** මේක ගොඩක් කැපවෙලා, මහන්සි වෙලා වෙන් කර ගෙන තියෙනවා. නමුත් ඒකේ අයිතිය තාම සභාවට ලැබුණද, නැද්ද, කියන එක දන්නේ නැහැ. ඒකෙ ප්‍රධානියෙක් විදියට කටයුතු කරේ මම.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක අපිට භාර දීලා තියෙන්නේ මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** තාම ඒක නිල වශයෙන් භාර දීලා නැහැ නේද සභාවට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔප්පුවකින් ලබා දුන්නා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** එහෙමනම් ඒක ප්‍රදේශයේ මහජනතාවට ලබා දෙන්න පොදු කටයුතු වලට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි මාතර ගිහින් විශ්ව විද්‍යාලයට ගිහිල්ලා ලියව ගත්තා ඒක.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** දැනට ඒක මිනිස්සු අනවශ්‍ය දේවල් වලට යොදා ගන්නවා. ඒක නිසා ඔබතුමා සභාවේ නිලධාරීන් යවලා ඒක තහවුරු කරගෙන, ආරක්ෂා කර ගෙන ප්‍රයෝජනවත් කටයුත්තකට යොදවන්න සුදානම් කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කම්බි ගැහුවා නම් හරි ඒකේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** වැට කඩලා තියෙනවා ඒකයි. ඉතිං මම සතුටු වෙනවා ඒක අත්පත් කරගෙන පවරා ගැනීම සම්බන්ධව.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

<u>ගරු මන්ත්‍රීනි ඩී.පී. වාසනා උදයංගනී මැතිණියගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රීනි ඩී.පී. වාසනා උදයංගනී මැතිණිය ඃ- 51.** ටිකිරිප්පුදූව වත්ත ශ්‍යාමලී මහත්මියගේ නිවස ඉදිරිපිටින් ඇති මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු මන්ත්‍රීනි ඩී.පී. වාසනා උදයංගනී මැතිණිය ඃ- 52.** සන්සයිඩ් වත්තේ සචිත්‍ර මහතාගේ නිවස ඉදිරිපිටින් ඇති මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී ඒ. ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ඒ. ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ- 53.** හපුගල ජන සභා ගොඩනැගිල්ල හා වැසිකිළි පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීමට යෝජනා කරමි.

I. වැසිකිලියේ භූගත නළ පද්ධතිය උතුරායාම වැළැක්වීම සඳහා පියවර ගැනීම.
II. විදුලි මණුව වැස්සට තෙමෙමින්, අව්වට වේලෙමින් ඉතාම අවධානම් තත්ත්වයේ පැවතීම නිසා එහි ආරක්ෂිත බව තහවුරු කිරීම.
III. ගේට්ටුවේ තීන්ත ආලේප කර එය ආරක්ෂා කර ගැනීම.
IV. මෙම භූමිය අවට නිවෙස්වල වහලයන්හි වැසි ජලය මෙම ඉඩමට ගලා යන ලෙස කටයුතු කර තිබීම පිළිබඳව අවධානය යොමු කිරීම. (ඉදිරියේදී මෙම ගොඩනැගිල්ල ගිලා බැසීමට පවා ඉඩ ඇත.)

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඒ. ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** මේක මම තුන් හතර වතාවක්ම මතක් කරා. මම ලිඛිතවත් කිහිපසැරයක්ම දැනුම් දීම කරා. ඒකෙ වැසිකිලිය උතුරනවා. දැන් මට තේරෙන විදියට නම් වැසිකිලියේ ඉඳලා ටැංකියට යන නළ මාර්ගය ගම් ගාලා අලවන්නේ නැතුව නිකම්ම පයිප්ප ගහලා තියෙන නිසා තමයි ඒ නළ මාර්ගය උතුරන්නේ. මට හිතෙන විදියට මේකට සුදුසුම ක්‍රියාමාර්ගය තමයි බෞලෝ ටැංකියක් වගේ දාලා මොකක් හරි වැඩපිළිවෙලක් කරන එක. හරි කැතයි ඒක. මොකද මාධ්‍යයට එහෙම ගියෝතින් ඒක හොඳත් නැහැ. අර කාණු දිගේ උතුර උතුර වතුර බහිනවා. ඉතිං ඒක නිසා අන්න ඒක ප්‍රතිසංස්කරණය කරලා දෙන්න තමයි ඉල්ලීම කරන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක වැසි දිනයක පොඩ්ඩක් ගිහිල්ලා බලන්න. මමත් ගියා දැන් දවස් කිහිපයක්ම. වැසි දිනයක නම් යන්නම බැහැ ඇත්තටම.

**ගරු මන්ත්‍රී ඒ. ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** පිටිපස්සට යන්නම බැහැ. සෙවල බැඳිලා. පේමන්ට් එකේ ඉඳලම සෙවල. අරක උතුර උතුර යනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකේ අනිත් ටික අපිට බැරිද හදන්න. ඕක හදලා අවුරුදු 13 ක් හෝ 14 ක් වෙනවා. අපිට උඩ තට්ටුව හදන්න බැරිද, නැත්නම් මීටර් බෝඩ් ඔක්කොම ස්ලැබ් එකෙන් එන වතුර වලින් තමයි තෙමෙන්නේ. ස්ලැබ් එකත් දැන් දිරන මට්ටමට ඇවිල්ලා ඇති.

**ගරු මන්ත්‍රී ඒ. ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** ඊළඟ කාරණය තමයි මීටර් බෝඩ් එක තෙමෙනවා. වේලෙනවා. වතුර බේරෙනවා ඒක ඇතුළට. බොහොම අවධානම් තත්ත්වයක තමයි ඒක තියෙන්නේ. ඒකට අවධානය යොමු කරලා මොකක් හරි පිළියමක් යොදන්න. ඊළඟට ගේට්ටුවේ තීන්ද ආලේප කරානම් හරි ගේට්ටුව ආරක්ෂා කර ගන්න. ජනසභා ගොඩනැගිල්ලේ ගේට්ටුවේ ඇන්ටිකොරොස් මොනවාහරි ආලේප කරලා ඒක ආරක්ෂා කර ගන්න. ඊළඟ කාරණය තමයි අහල පහළ ගෙවල්වල වහළවල් වලින් එන වතුර පාරවල් සේරම හරවලා තියෙන්නේ ජනසභා ගොඩනැගිල්ලේ භූමියට. අර ජන සභා ගොඩනැගිල්ලේ ඉස්සරහ පොළව අඟල් හතරක්, පහක් විතර එරෙනවා වහින කොට. ඒක ඇතුලේ වතුර පිරෙනවා. ඒක පොඩ්ඩක් හොයලා බලන්න ඕන. එහෙම වතුර පාරවල් හරවන්න බැහැ වෙන ඉඩම් වලට. එතන එහෙම ගැටළුවක් තියෙනවා. ඒක ගොඩනැගිල්ලටත් හොඳ නැහැ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, පැලවත්ත ජන සභා ගොඩනැගිල්ල පිළිබඳව මේ විස්තරය සම්පූර්ණයෙන්ම නිවැරදියි. ඩඩ්ලි මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු විස්තරය නිවැරදියි. මේක මගේ කොට්ඨාශයේ පිහිටලා තියෙන්නේ. අවස්ථා තුනකදී විතර මේ ස්ථානයට මමත් ගිහින් බැලුවා. මම ඔබතුමාව දැනුවත් කරා ඇවිල්ලා මේ පිළිබඳව. මේකේ මට හිතෙන්නේ ඉක්මනට විසඳගත යුතු ප්‍රශ්නය තියෙන්නේ මේ විදුලි මීටරයට වැසි ජලය කාන්දු වෙලා එතන අනතුරක් වෙන එක. එහෙම වුණොතින් අනතුරක් වෙලා බිල්ඩින් එකත් ගිනි ගනීවි. ඒ වගේම ඔබතුමා ප්‍රකාශ කරපු පරිදි ඒ ගොඩනැගිල්ලේ ඉදිකිරීම් තත්ත්වය අනුව ඉහළ මහලක් ඉදිකිරීම සුදුසුද කියන එක වෙනම බලන්න වෙනවා සභාපතිතුමා. ඒක එච්චර ශක්තිමත් ගොඩනැගිල්ලක් නෙමෙයි මට හිතෙන්නේ තව තට්ටුවක් යන්න තරම්. එහෙම පේනවා ඇත්ත තත්ත්වය. ඒ පිළිබඳව නිපුණතා ඇති නිලධාරියෙකුගෙන් උපදෙසක් අරගෙන ඒක කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ඊළඟට ගරු සභාපතිතුමනි, මේ වැසිකිලිවලේ ජල කාන්දුව ගැන මට හිතෙන්නේ අපි ඒක හිස් කරත් නැවත ඒක ඉක්මනින් පිරෙනවා. මේක වලක්වන්න අමාරුයි වගේ. එහෙම පේනවා එතන. ඒ නිසා ඒකට ඉදිරිපිටින් මිදුලේ නැවත වලක් හාරලා ඒ වලට සිලින්ඩර් බස්සවලා පතුලත් කොන්ක්‍රීට් කරලා බටයක් මගින් ඒකට යන්න වෙයි. බෆලෝ ටැංකියක් තියෙන්නේ මට හිතෙන්නේ ඒකේ. ඒකෙ ඒ වගේ ක්‍රමයකට යන්න වේවි.

ඇත්තටම මෙතන තව ගැටළුවක් තියෙනවා. ඇත්තටම ප්‍රකාශ කළ යුතු දෙයක් තියෙනවා සභාපතිතුමා. මම ගිය අවස්ථා තුනේදීම එතන ඉන්න දේශීය වෛද්‍යතුමිය මහා නරක විදියට ඔබතුමාටත් දෝෂාරෝපණය කරනවා. අපිටත් දෝෂාරෝපණය කරනවා. සභාවටත් දෝෂාරෝපණය කරනවා. එතුමිය ඒක ඉතාමත් නරක විදියට එන මිනිස්සු එක්කත් පෙන්න පෙන්න කියනවා. ඒක හොඳ දෙයක් නෙමෙයි. අපේ සභාවේ සේවය කරන කෙනෙක් විදියට ඒ කරන ක්‍රියාවලිය වැරදියි. එතුමිය තමයි පිටිපස්සට ගිහිල්ලා බෙහෙත් ගන්න එන ලෙඩ්ඩුන්ටයි, අර හැමෝටමයි පෙන්වන්නේ. එදා මම ඔබතුමාටත් කිවුවා. ඒ පිළිබඳවත් ඔබතුමා යම් කිසි ක්‍රියාමාර්ගයක් ගන්න. ගැටළුවක් තියෙනවා නම් අපි කතා කරලා විසඳගන්න ඕන දෙයක්. ඒකට එහෙම කෑගහන්න එයාට අයිතියක් නැහැනේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ඒ චෝදනාවේදී එතුමිය පහුගිය කාලය තුළ මෙහෙන් ඉල්ලීමක් කරලා තියෙනවාද මේ අඩු පාඩු ටික සපුරා දෙන්න කියලා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ඉල්ලීමක් කරලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් සති දෙකකට විතර කලින් ඉල්ලුවා. මම හිගිල්ලා බැලුවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** සති දෙකකට කලින්ද ඉල්ලීම කරලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔව්. ලිඛිතව ඉල්ලීමක් කරේ සති දෙකකට කලින්.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** මාස 06 ක් වෙනවා මම ඉල්ලලා එහෙම කියන්නේ එතුමිය.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඒ විදියට දෝෂාරෝපණය කරන්න බැහැ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එහෙම කියන්න බැහැ නරක විදියට. එහෙම යන්න බැහැ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** එහෙම චෝදනා කරනවානම් මෙහෙන් ඉල්ලීමක් කරලා තියෙන්න එපැයි ඉස්සෙල්ලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ වැසිකිලි වළ සඳහා මොකක්ද තියෙන විසඳුම.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ඉස්සරහින් අරගෙන සීල් කරපු වළක් හදන්න වෙනවා උඩින් බටයක් දාලා.

**ගරු මන්ත්‍රී ඒ. ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** බෞලෝ ටැංකි සීල්නේ. වතුර තියෙන ඒවගේ තැන්වල දාන්නේ බෞලෝ ටැංකිනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට මොකක් හරි හොඳ දෙයක් කරන්න බලන්න.

ඒ මොනවා නැතත් බෝඩ් එකක් ගහන්න. බෝඩ් එක ඉවරයි. බෝඩ් එක පේන්නේ නැහැ දැන්. මෙතනත් ගහලා තියෙනවා එකක් මම මේ කියන්න ඉන්නේ. මෙතන බෝඩ් එකක් තියෙනවා පේන්නෙම නැහැ. බෝඩ් එක විතරයි පේන්නේ.

අනිත් ප්‍රධාන කාරණය මේ මතක් වෙච්ච නිසා කියන්නේ. අර උප කාර්යාලයේ බෝඩ් එක ගහලා තියෙන්නේ කවුද, උප කාර්යාලයේ බෝඩ් එක බලන්න හැරිලා ඇතුළට යන්න ඕන. බෝඩ් එක පේන්නේ ඒ පාරෙන් ඇතුළට හැරුණම. අච්චර වියදම් කරලා බෝඩ් එක ගහලා තියෙන්නේ ඇතුලේ. පාරෙන් හැරුණට පස්සේ තමයි බෝඩ් එක පේන්නේ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** සභාපතිතුමා, අර පාර පළල් වෙන නිසා ඉඩ තියලා බෝඩ් එක ගහලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පාර පළල් වෙනකොට බෝඩ් එක අයින් කරන්න පුලුවන්නේ. ඒ අර කිතුල්ගහට ගියාම දෙන උත්තරනේ. බෝඩ් එකක් කියන්නේ ස්ථිර ඉදිකිරීමක්ද, ඕක පාර පළල් වෙන කාලයට එහාට කරලා හිටවන්න පුලුවන්නේ.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** දැන් සභාපතිතුමාට තියෙන්නේ බෝඩ් එක අතන කියලා තව බෝඩ් එකක් ගහන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක දැන් කරුණාකරලා ගලවලා ගහන්න. විහිළුවක් ඒක ඇත්තටම.

**ගරු මන්ත්‍රී ඒ. ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** කොන්ක්‍රීට් ටිකක් දාලා හයි කරහම ඉවරයිනේ.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ඒවා අධීක්ෂණය කරන්න කවුරුවත් දාන්නේ නැද්ද, ඒවා තනියම කරන්නේ නැහැනේ සභාපතිතුමා.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ඒ මිනිස්සු තනියම හයිකරන්නේ නැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ බෝඩ් එක වැඩක් නැත්නම් ගලවලා දාන්න. ඒ බෝඩ් එක වැඩක් නැහැනේ. අපි බෝඩ් එක ගහන්න ඕන සභාව අතන තියෙනවා කියලා පේන්න. ඒක ගහන්නකෝ. මම බලා ගන්නම් මොන ආයතනයෙන් කිවුවත්. ගහන්නකෝ ඔයගොල්ලෝ. ඇතුල්වෙලා මීටර් ගාණක් හැරෙන්න ඕන බෝඩ් එක පේන්න. එක්කෝ පහුකරගෙන ගියාට පස්සේ තමයි බෝඩ් එක පේන්නේ.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** ඒක පාර පුළුල් කිරීමේදී යන ඉඩ ප්‍රමාණය ඇරලා හයි කරලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතකොට පාර පුළුල් කරන කාලෙට කර ගන්න පුලුවන්. ඒ පුළුල් කරන කාලයකදීනේ කරන්න ඕන. දිනූෂ මහත්මයා ඒ බෝඩ් එක ගලවලා මෙහායින් ගහන්න. කොහෙන් හරි ප්‍රශ්නයක් ආවොත් මම කිවුවා කියන්න. මාත් එක්ක කතා කරන්න කියන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඒ. ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ- 54.** මාම්පිටිය, මහවත්ත පාර ඉසුරු පෙදෙස දෙසට මීටර් 300ක් පමණ කාපට් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඒ. ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** ඒක දැන් කාපට් කර ගන්න තුන් හතර පාරක් උත්සාහ කරා. මට ඒක කරගන්න බැරි වුණා. ඒක නිසා තමුන්නාන්සේලාගේ ව්‍යාපෘතියකින් කරන්න. මීටර් 250 ක් වෙයි බොහෝ දුරට. ඒක කාපට් කරන්න කටයුතු කරලා දෙන්න. මම කරනවා කියලා කරන්න ඕන නැහැ. තිස්ස වේවැල්වල මන්ත්‍රීතුමා වුණත් කමක් නැහැ මැදිහත් වෙලා මේ වැඩේ කරලා දෙන්න. දැන් අර සේරියගොඩ පාර ගත්තට පස්සේ ඒක සංවර්ධනය කරන්න ලක්ෂ 20 ක් වියදම් කරපු පාරක්. දැන් අන්න කාපට් කරනවා ඒක. මම පහුගිය දවසක යනකොට ඒක කාපට් කරන්න වැඩ පටන් අරගෙන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක වැරදි වැටහීමක් මන්ත්‍රීතුමා. ලක්ෂ 20 යනවා බේස් එකට. ඒක වියදම් වෙන එක අඩු වෙනවා. කැඩිච්ච පාරක් කාපට් කරන්න යන වියදමට වඩා සංවර්ධනය කරලා තියෙන පාරක් කාපට් කරන්න යන වියදම අඩුයි. ඒකට ලක්ෂ 20 ක් වියදම් කරපු එක පාඩුවක් නැහැ.

**ගරු මන්ත්‍රී ඒ. ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** කොහොම හරි කමක් නැහැ මෙතන මීටර් 250 ක් ඇති. හොඳටම ඕන නම් මිලියන 2.5 ක් විතර යාවි. ඒක තිස්ස වේවැල්වල මන්ත්‍රීතුමාගේ යෝජනාවක් විදියට දාලා හරි කමක් නැහැ පාර හදා ගන්නයි ඕන. මොකක් හරි වැඩපිළිවෙලක් කරලා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ගරු මන්ත්‍රිනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

<u>ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ- 55.** සන්සයිඩ් ගාර්ඩන්හි අංක 01 සහ 02 පටුමගේ ඇති කාණුව සංවර්ධනය කරන ලෙස යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** මේ වෙන්දේසි ඉඩම් සම්බන්ධව යෝජනා කිරීමේදී ඇත්තටම මේවායේ තත්ත්වය කොහොමද කියලා අපි දන්නේ නැහැ. ඒවා හොයලා බලලා මේ සංවර්ධන යෝජනාව කරන්න කියලා මම යෝජනා කරනවා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** සන්සයිඩ් වත්ත කිවුවේ කපුහෙම්පල පැරමවුන්ට් පාර්ක් එකටද.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** නෑ, නෑ. කරාපිටියේ එක.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ඒ පිළිබඳව කාණු හදන්න කලින් මම ගිය සභාවේදී යෝජනාවක් දැම්මා මේකෙ මැනුම් කටයුතු කරන්න කියලා. ඒකෙ තත්ත්වය මොකද දන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මනින්න හේතුව මොකක්ද ඒකේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** අඩි 20 මාර්ගයක් මම හිතන්නේ තියෙන්නේ. එක තැනක අඩි 08 ක් වත් නැහැ. දීර්ඝකාලීනව එන්නේ මේ ගැටළුව. එක මහත්තයෙකුගේ නිවසකට වතුර එනවා කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ෆිනෑන්ස් ඉඩම්වල අඩි 20 ලකුණු කරන්න බැරිද, අපිට මනින්න ඕන නැහැනේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** දැන් මම ඒ එක පාර්ශවයකට තාප්පය බඳින්න ඉඩ දෙන්නේ නැහැ මේ පාරේ පළල සනිටුහන් කරනවා කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ෆිනෑන්ස් ඉඩම්වල මායිම් පැහැදිළියිනේ. අපි මොකටද මනින්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** මැනුම් කටයුතු සිදු කරත් නොකරත් කමක් නැහැ. අර නිතරම එන්නේ, මමත් ඔබතුමාගේ ගාවටත් එක්ක ගෙන ආවේ අන්න ඒ ප්‍රශ්නයට විසඳුමක් දෙන්න. සම්පූර්ණයෙන්ම ගෙදර බාත්රූම්වල වතුරයි, ඔක්කොම වතුරයි පාර හරහා යන්නේ. ගෙදරකටත් යනවා ඒ වතුර. අන්න ඒ ගැටළුවට විසඳුමක් ලබා දෙන්න. කාණුව ඉදිකරන්න කලින් එතන ඒ ගැටළුවට විසඳුමක්

ලබා දෙමු. දැන් දීර්ඝ කාලයක්නේ. ඊයෙත් දිගටම ඒ මිනිස්සු කතා කරා. ඒක හින්දා මොකක් හරි විසඳුමක් ඒකට දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ- 56.** කරාපිටිය ලබුදූව මාර්ගයේ මොඩර්න් හාඩ්වෙයාර් එක අසලින් ගලා බසින කාණුවේ දෙපැත්තේ පැති බැම් දෙක කොන්ක්‍රීට් කර දෙන ලෙස යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** සභාපතිතුමනි, දැන් ඔය මොඩර්න් හාඩ්වෙයාර් එක ගාව ප්‍රශ්නයේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා ලක්ෂ 05 ක මුදලක් වෙන් කරලා තියෙනවා. මේ මොහොත වන විටත් ඒ ලක්ෂ පහ තියෙනවා. නමුත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් කියනවා මෙම කාණුව වාරිමාර්ග දෙපාර්තමේන්තුවට පවරලා කියලා. ඇළ මාර්ගයක් කියලා එහෙන් කියනවා. ඇත්තටම කාණුවක් තියෙන්නේ. වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් අධීක්ෂණය වෙන නිසා ඒ අය කියනවා කාණුව කොන්ක්‍රීට් කිරීමට නොහැකියි ඒ නිසා සුද්ධ කිරීමක් කරන්නම් කියලා. අන්න ඒ තත්ත්වය තුළ මේ ගැටළුව හිරවෙලා තියෙනවා. කොහොම හරි නිවසකට හානියක් වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ ආපු ලක්ෂ පහෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් වැඩ කරහම ඉවරයිනේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් කරන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ අය කොයිවෙලාවෙත් බලන්නේ නොකර ඉන්න. වැඩක් දුන්නොත් ඇත්නම් මොකක් හරි බලන්නේ නොකර ඉන්න.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඒක ඇළක්ද, කාණුවක්ද කියලා හොයා ගන්න බැරුව ඉන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** මම තාක්ෂණ නිලධාරීගෙන් ඇහුවම කිවුවා කාණුවක් කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං ඕකට අපෙන් ලියුමක් යවන්න මේක කාණුවක් කියලා. එතකොට ඉවරයිනේ. එතකොට යන්න පුලුවන්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ඒ එක්කම මම දැන් පහුගිය සභාවට යෝජනාවක් ඉදිරිපත් කරා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිට මේකට ලියුමක් දෙන්න පුලුවන් අපේ සභාවට අයිති කාණුවක් කියලා. ඒක දෙන්න ප්‍රාදේශීය ලේකම් එකට. අපරාදේ සල්ලි යවන්න එපා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** මට මතකයි පහුගිය සභාවක ලියුමක් ඉදිරිපත් වුණා ගාමිණී මාඉටිපේ මහතාගෙන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හෙට ලියුමක් හදාගෙන යන්න මේක සභාව සතු කාණු පද්ධතියක් කියලා. එතකොට කරන්න කියන්න. ඒ අය නොකරන්නම තමයි ඉන්නේ වැඩක්. ඒ ලියුම ගෙනිහිල්ලා දෙන්නකෝ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ඒ ලියුමේ කාණුවේ ප්‍රමාණය සටහන් කරලා දුන්නා නම් හරි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කාණුව මෙන්න මෙච්චර ප්‍රමාණයක් කියලා ලකුණු කරලා දෙන්න. හෙටම ඔබතුමා ඒ ලියුම හදාගෙන යන්න.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඒක වෙලා තියෙන්නේ මෙහෙමයි. ඒ ඇළ මාර්ගය තියෙන්නේ අබේසේකර එක පිටිපස්සේ. තොටගොඩ පැත්තේ ඉඳලා එන වතුර ටික ලබුදූව හරහා ඇවිල්ලා ඒ ඇළ මාර්ගයට වැටෙන්න තමයි අතුරු කාණුවක් විදියට ඒ කාණුව දාලා තියෙන්නේ. ප්‍රාදේශීය ලේකම් එකේ තාක්ෂණ නිලධාරිණී ඇවිල්ලා කියලා තියෙනවා මේක ඇළ මාර්ගයක් කියලා. ඇළ මාර්ග සංවර්ධනය කරන්න කියලා නැහැ කියලා කියනවා. ඉතිං ඒකට විසඳුම තියෙන්නේ මේක ඇළ මාර්ගයක් නෙමෙයි ප්‍රාදේශීය සභාව සතු කාණු පද්ධතියක් කියලා ලියුමක් දෙන එක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ගරු මන්ත්‍රිනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය සභාවට සහභාගි වීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ- 57.** කපුහෙම්පල ඊරියගස් දූවට යන මාර්ගය සංවර්ධනය කර දෙන ලෙස යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක සභාපතිතුමා වෙන්දේසි ඉඩමක පාරක්. වෙන්දේසි සමාගමකින් ඒක කරේ. වෙන්දේසි ඉඩම්වල අවුරුදු පහට අඩු ඒවා ප්‍රතිසංස්කරණය කරන්න කියලා දෙනවානේ. එතකොට ප්‍රශ්නය විසඳෙනවා. අපි අවුරුදු පහ යන්න ඉස්සෙල්ලා කරන්න ඕන නැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ- 58.** කපුහෙම්පල නන්දිමිත්‍ර විද්‍යාල භූමිය අවසතු කිරීම සම්බන්ධව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කරන ලද පරීක්ෂණ නිසියාකාරව සිදුවී නැති බවත් නැවත ඒ සඳහා පරීක්ෂණයක් කරන ලෙස යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඇත්තටම මේ යෝජනාව දාන්නේ අර පරීක්ෂණ වාර්තාව නොලැබුණු නිසා. මම දැන් යෝජනා කරේ, මේකේ තියෙන්නේ මෙතෙක් සභාවට මේ සම්බන්ධව ලැබුණ ලිපිලේඛන තියෙනවා නම් ඒකේ පිටපතක් අපිට ලබා දෙන්න ඊළඟ ක්‍රියාමාර්ගය සඳහා යන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මෙතුමාගේ යෝජනාව හරි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම එව්වට පස්සේ අපි නැවත දාන්නේ මොන පදනම යටතේද, අපිට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ලියුමක් එවුවට පස්සේ යවන්නේ කොහොමද, මේක මම අයින් කරේ නැහැ. අයින් කරන්නත් හදලා අද කතා කරන්න තිබ්බා. නැත්නම් වෙන කතාවක් කියයි. මේක දැම්මේ කතා කරන්න ඕන හන්දා. දැන් මම අහන්නේ සභාවෙන්. දැන් අපිට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ලියුමක් එවනවා ඒ අය විතරක් නෙමෙයි නීතිපතිටත් යොමු කරයි ඒක පවත්වා ගෙන යාමට නඩු නිමිත්තක් නැහැ කියලා. එහෙම ලියුමක් එවුවට පස්සේ මට පුලුවන්ද මගේ සීල් එක ගහලා ලියුමක් යවලා ඒ අයගෙන් පරීක්ෂණයක් ඉල්ලන්න. මම නිකං විහිළුකාරයෙක් බවට පත් වෙනවානේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඒක හරි. අපි කියන්නේ මෙහෙමයි. දැන් අපි ගාව තියෙන තොරතුරු ටික අපි ඔබතුමාට දෙන්නම් ලිපි ගොනුවක් විදියට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක සභාවෙන් යවන්න ඕන නැහැ. ඒක ඔබතුමන්ලාට පුලුවන්. අපි ලියුම් දෙන්නම්. අපේ තියෙන ඒවත් දෙන්නම්.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** මම කියන්නේ ඒකයි. සභාවට මේ සම්බන්ධව ලැබිච්ච තොරතුරු තියෙනවානේ. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් හරි, නීතිපති එකෙන් හරි, ප්‍රාදේශීය ලේකම් එකෙන් හරි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ලේකම්තුමාගෙන් ඔය සම්බන්ධව ඕන දෙයක් ගන්න දෙන්නම්.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඒ සම්බන්ධව තියෙන සියලු තොරතුරු ටික අපිට දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දෙන්නම්.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** අපි ඊට පස්සේ තියෙන ක්‍රියාමාර්ග ටික ගන්නම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දෙන්නම්. මටත් ඕන මේක කොහෙන් හරි නවත්වන්න. කිසි ප්‍රශ්නයක් නැහැ දෙන්නම්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා මම හිතන්නේ මේ යෝජනාවේ ඕන නම් පොඩි කෑල්ලක් විතරක් වෙනස් කරන්න. පරීක්ෂණය නිසියාකාරව සිදු වී නැති බව කිවුවම පොඩි මදි පුංචිකමක් වෙනවා. මේක සභාවෙන් යන එකේ වටිනාකමක් තියෙනවා. මොකද ඇත්තටම මේ දේ වංචාවක්නේ වෙලා තියෙන්නේ. මේක දැන් කවුරුත් ගොඩනගන්න හදන දේ පවරා ගන්න ඒවා මේවා නෙමෙයි. මේ වෙලා තියෙන්නේ මේ කතාව තේරුම් නොගන්න එකක් ඇත්තේ. ඒ නිසා නැවතත් මේකේ

පරීක්ෂණය කරන්න කියලා ඉල්ලුවම සභාවක් විදියට ඒකේ හයියක් තියෙනවා. අපි පුද්ගලිකවත් ඒක දාමු. ගරු සභාපතිතුමා මම හිතන්නේ අපි දාන එකේ සභා තීන්දුවක් අරගෙන දාන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් අබේසේකර මන්ත්‍රීතුමා සභාවට විරුද්ධව නඩුවක් දාලා තියෙනවා. මේක පුද්ගලික මට්ටමට යන්නේ ඒපාර. මේක හිතාමතාම කරා කියලා හිතනවා. මේක නවත්වගෙන හිටියෙත් මේකට. හිතාමතා මේ දේ කරනවා කියලා හිතනවා. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් උත්තර එවනකම්නේ එක පාරක් නැවැත්තුවේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා දැන් මේ ප්‍රශ්නයේදී බලන පැත්ත වැරදියි කිවුවනේ. දැන් මේක නැවත පවර ගන්න කියන කතාව වැරදියි. මේකේ ඇත්තටම වෙලා තියෙන්නේ සුදිරුක්කු ජයවික්‍රමට අයිති නැති එකක්, එයා ලියනවා පුද්ගලයෙකුට. ආණ්ඩුවට තියෙන එක, පාසලට තියෙන ඉඩම මේක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාට ඔය නම වැටෙනවා ඔහොම යද්දි. සුදිරුක්කු කිය කියා හිනාවෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සුදිරුක්කු ජයවික්‍රම දොස්තර මහත්තයාට අයිති නැති ඉඩමක් මේක ඒ වෙන කොට. එයා ලියනවා අශෝක කුලරත්නට. එයාට අයිතියක් නැහැ. ඉතිං ඒ නිසා අපි මේක දාන්න ඕන. මේක සභා යෝජනාවක් මේ. ඔබතුමාගේ නෙමෙයි සභාවෙන් ආවම මේක දාන්න ඕනනේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** සභාපතිතුමා මීට කලින් පරීක්ෂණයට යොමු කරපු දත්තයන් වලදී, අපි ගාව තියෙන ඒවත් ඔබතුමන්ලා ඉදිරිපත් කරාද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට. එහෙම නැත්නම් අපි ගාව තියෙන සියලු දත්තයන් දෙන්නම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ නෑ. මමත් ඕන නම් ඔයගොල්ලන්ගේ එකට අත්සන් කරන්නම්. මම කියන එක තේරුම් ගන්න. සභාවට එව්වට පස්සේ ඒක පවත්වා ගෙන යන්න විදියක් නැහැ කියලා මම විහිළුකාරයෙක් වෙනවා නැවත මගේ සීල් එක ගහලා ලියුමක් යවන කොට.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ඔබතුමා නෙමෙයි අපි මේ මන්ත්‍රී කණ්ඩායම අත්සන් කරලා යවමු.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** විනාඩියක් දෙන්න. මේක පටලවා ගන්න ඕන නැහැ. දැන් අපි කියන්නේ මොකක් හරි පරීක්ෂණයක් කරහම, එහෙම නැත්නම් අධිකරණ තීන්දුවක් දුන්නම ඒක නිවැරදියි කියලා එහෙම එකක් නැහැ. අධිකරණය තීන්දුවක් දුන්නම ඒක නිවැරදියි කියලා එකක් නැහැ. වැරදි වෙන්න පුලුවන්. එහෙම අභියාචනා කරලා නිදහස් වෙනවා මිනිස්සු. අභියාචනයේදිත් අච්චු කරනවා. අපි සභාවක් විදියට යැව්වම ඒකෙ හයියක් තියෙනවා. ඒක ඔබතුමාට හානියක් වෙන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** අපි සියලු දෙනාම අත්සන් කරමු.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා අපිට තියෙන හොඳම යෝජනාව මේක. ඒකට එක උත්තරයක් ඔය. අපිට දෙන්න පුලුවන් හොඳම උත්තරයක් තමයි ඔය. මම මොකද කරන්නේ. මේ සභාවේ යෝජනාවක් ගෙනාවා. ඒ යෝජනාව වැඩි ඡන්දයෙන් සම්මත වෙනවා. ඊට පස්සේ මම මොකද කරන්නේ කියලා කියන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සභා තීන්දුව ඉදිරිපත් කරලා තමයි දැන් අපි නඩුව යන්නේ. සභාවෙන් තීන්දු කරපු නිසා තමයි මේක නැවැත්තුවේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාවෙන් අවශ්‍ය දත්තයන් ඉදිරිපත් කරලා තියෙනවා. ඒ හින්දා අපි සහභාගි කර ගන්න ඕන මෙන්න මේවා පෙන්වලා දෙන්න අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන්න ඕන අපි ළඟ තියෙන කරුණු. ඒ කරුණු ඒ අය නඩුව නිදහස් කරන්න කොහෙන් හොයා ගත්තද කියලා එකක් නැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මට තියෙන ප්‍රශ්නය මෙච්චරයි. මේක අපිට නඩුවට ප්‍රශ්නයක් වේවිද දන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** නැහැ. නඩුවට ප්‍රශ්නයක් වෙන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** චුට්ටක් ඉන්නකෝ කියනකම්. අබේසේකර මන්ත්‍රීතුමා හැමවෙලේම කතා කරන්නේ මේ විදියටනේ. අපි ඒවායිනුත් බේරෙන්න එපැයි. මෙතන නඩුවකුත් හිර කරලා තියෙනවා. නඩුව යන්නේ පුද්ගලිකව, ද්වේශ සහගත විදියට අපි මේක හිරකරනවා කියලා. දැන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ආවට පස්සේ මෙතනින් එහාට ගෙනියන්න විදියක් නැහැ කියලා, අපි නැවත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් මේක ඉල්ලනවා කියන්නේ එතකොට නඩුවක් යන අතරේ විශේෂයෙන්ම. එතකොට ඒකට අපි උත්තර ඉල්ලනවා කියන්නේ හොඳටම තේරෙනවා හිතාමතා මේක මේවා කරන්න හදනවා කියලා. ඒක තහවුරු වෙනවා මම දන්න විදියට.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, ඔබතුමා මෙහෙම කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ සභාවෙන් බැහැ. මට නීතිඥ උපදෙස් අරගෙන තමයි ඒක කරන්න වෙන්නේ. දැන් මේ නඩුවකුත් යනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එකක් තියෙනවා ගරු සභාපතිතුමා. ඔබතුමා විරුද්ධව දෙන්න. අපි යෝජනාව ගේනවා. ඒ කියන්නේ අපි යෝජනාව ගෙනාවම දිනුවා හරි පැරදුනා හරි අපි මේවා කරමු සභාවෙන්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** පැහැදිළි සාක්ෂි තියෙනවානේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** වැඩි ඡන්දයකින් සම්මත වුණාම ඔබතුමා කළ යුතුයි. මම නම් මේකට විරුද්ධයි කියලා කියන්න ඕන නම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අනිත් එක මෙහෙමනේ. මේ පවරා ගැනීමකින් හරි, මොකකින් හරි මේ ඉඩම අත්පත් වෙන්නේ අපිට නෙමෙයිනේ. අපිට තියෙන්නේ මේවාට ගිහිල්ලා අන්තිමට සභාවෙන් වියදම් කරන්න. ඒක බොහොම නරකයි. මේ රටේ ඉන්න ප්‍රමුඛ නීතිඥ කෙනෙක් මේ නඩුවට ඇල්ලුවේ. නඩුව ගෙනියන්න හේතුවක් නැහැ. අලි සබ්‍රිගේ දෙවැනියාව අල්ලලා තියෙන්නේ. අපිට ඇගේ පතේ හයියට කතා කරන්න පුලුවන් මේක මෙහෙමයි කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමයි මමයි, යථාර්ථයේ ඉන්නවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි සභාව ඕන නැහැ. මන්ත්‍රීවරු ඔක්කොම අත්සන් කරලා දාන්නකෝ. ඉවරයිනේ. මමත් අත්සන් කරන්නම්. ඔක්කොම අත්සන් කරලා දාමුකෝ. අත්සන් ලේඛනයක් හදලා දාමු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට, සභාව විදියට නෙමෙයි අපි මන්ත්‍රීවරු විදියට.

**ගරු මන්ත්‍රී ඒ. ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, මේ කාරණය සම්බන්ධව මම කතා කරා අර හෙජින් ගිවිසුම පිළිබඳව නඩු කියලා නඩුව දිනපු සුදර්ශන ගුණවර්ධන මහත්තයත් එක්ක. එයා කිවුවා උදවු කරන්නම් කියලා මේ නඩුවට. මම කිවුවා නඩු කියන්න සල්ලි නැහැ කියලා පාසල් සංවර්ධන සමිතියට. ඔබ සියලු දෙනාගෙන් ගනිපු තොරතුරු එක්ක තමයි මම කතා කරේ. දැන් එතුමා කිවුවේ මේකට වන්දි මුදලක් ගෙවලා පවරා ගනිපු ඉඩමක් නම් දැන් අරයා හොර උප්පැන්නයක් හරි, මොකක් හරි හදලා එයාට උරුමයක් තියෙන විදියක් පෙන්වලා සුදිරුක්කු ජයවික්‍රම හරහා අරගෙන, මේකෙන් ප්‍රයෝජනයක් නැහැ කියලා විදුහලෙනුත් කියනවා නම්, ප්‍රයෝජනයක් ගන්නෙත් නැත්නම් අනිත් පැත්තට දෙන්න පුලුවන් කිවුවා. ඒ කියන්නේ උරුමක්කාරයෙකුට. ඒ ඉඩම පවරපු උරුමක්කාරයෙකුට. නමුත් එහෙම දෙන්න බැරි හැකියාවක් තියෙනවා කිවුවා වන්දි මුදලක් ගනිපු නිසා. මේක නිසා මෙතන හොයා ගන්න ඕන අන්න ඒක කියලා කිවුවා. මේක කොහොමද පැවරුනේ. ඒ පැවරීම තියෙන තැන තමයි කිවුවා ප්‍රශ්නය තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිට තියෙන ප්‍රශ්නය ඒක නෙමෙයි. දැන් අපේ නඩුවට ඒක සම්බන්ධ කාරණයක් නෙමෙයි තියෙන්නේ. නඩුව දාලා තියෙන්නේ අදාළ ලියකියවිලි වලට අපිට අභියෝග කරන්න බැහැනේ. අදාළ ලියකියවිලි අනුව සංවර්ධන බලපත්‍රය අත්හිටුවීමට විරුද්ධව තමයි ඒක දෙන්න කියලා නඩුව දාලා තියෙන්නේ. ඔබතුමාලා ඔය කියන එක යන්න ඕන අධිකරණයක් මාර්ගයෙන් වෙනම විදියට. අපේ නඩුවට ඒක සම්බන්ධ කරන්න බැහැ. අපේ නඩුවේදී අහන්නේ මෙච්චරයි. ඇයි සභාව මේක මේ විදියට තියාගෙන ඉන්නේ. එච්චරයි අහන්නේ. මොකක්ද පදනම මේ සියලු ලිපි ලේඛන තියෙද්දි, සංවර්ධන බලපත්‍රයක් දීලා තියෙද්දි ඒකත් අවලංගු කරන්න හේතුව මොකක්ද කියලා අහන්නේ. අපි පළමුවෙන්ම ඉදිරිපත් කරා නඩුව. ඒක අයින් කරා. ඊට පස්සේ මම දුන්නා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නීතිපතිට දාලා තියෙනවා කියන එක. ඒකත් එවලා තියෙනවා පවත්වා ගෙන යන්න නඩු නිමිත්තක් නැහැ කියලා. අපෙන් අහන්නේ අධිකරණයේදී ඇයි ඔයගොල්ලෝ මේක නොදෙන්නේ කියලා. අපිට දැන් ඒකට උත්තර දෙන්න බැහැ මේක හොර ඔප්පුවක්, මේක මෙහෙමයි කියලා. ඒක බේර ගන්න ඕන වෙන කාරණාවකින්. මේකයි තේරුම් ගන්න ඕන කාරණාව මේකෙදි. දැන්

අපිට තියෙන එකම දේ උත්තර දෙන්න ඕන ඇයි මේක නොදී ඉන්නේ කියලා. එච්චරයි වෙන මුකුත් නැහැ. මේකේ කෙටි කාරණය එච්චරයි. අපිට සභාව විදියට දෙන්න ඕන උත්තරය ඇයි මේක නොදී ඉන්නේ කියලා. අන්න ඒකට සාධාරණ හේතු පෙන්වන්න ඕන.

**ගරු මන්ත්‍රී ඒ. ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** පැහැදිලිව පැමිණිල්ල පැත්තෙන් සභාපතිතුමා මේකට යම් දෙයක් ලබා ගන්න බලාපොරොත්තුව තියෙනවා. ඒක තමයි මේක යට ගහන්නේ, ඒක නිසා තමයි මේක නොදී ඉන්නේ කියන කාරණාව මතු කරයි කියලා කිවුවා. නමුත් ලබන මාසයේ විසි වෙනිදා වෙනකොට මේකට උත්තර බඳිනකොට හරියට මේකේ විස්තර හොයලා උත්තර නොබැන්දොත් සභාපතිතුමාට අධිභාර ගෙවන්න වෙනවා කිවුවා. ඒ අවස්ථාව තියෙනවා කිවුවා සභාපතිතුමාට.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම කියන්නේ මෙහෙම. එතනදී අපිට මේ තියෙන තොරතුරු ප්‍රමාණයක් තියෙනවානේ. අපි නැවත මේක අරගෙන සමාලෝචනය කරලා වහාම මේක ඇත්තටම ගෙනියන්න පුලුවන්නම් ගෙනියන්නම ඕන. බැරිනම් බොරුවට එල්ලෙන එකේ තේරුමක් නැහැ. මේ දෙකෙන් එකකට තීන්දුව ගන්න අපි හරියට යන්න ඕන. ඒ නිසා මේ තොරතුරු ටික පදනම් කර ගනිමින් යන්න ඕන.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** සභාපතිතුමා, මේක මෙතුමා කියන විදියට සභාවේ දේපලක් නම් සභාවට පුලුවන් ඒකට නඩුවක් ගෙනියන්න. මන්ත්‍රීවරු ඔක්කොම අත්සන් කරලා මේක කරොත් කර ගන්න පුලුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සභාවට මුකුත් අයිතියක් නැතුව අපි මොකක්ද ගෙනියන නඩු නිමිත්ත.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** රජයේ දේපලක්නේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මේක සභාවේ දේපලකුත් නෙමෙයි, සභාවට අයිති වෙන්නෙත් නැහැ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමන්ලාගේ ඒ තර්කය එහෙම කියන කොට මේක අපේ පෞද්ගලික දේකුත් නෙමෙයිනේ. අපි කොහොමද යන්නේ. මෙහෙම හිතන්නකෝ. ඔය තර්කය ඔය විදියට ගේනවා නම් සභාව සතු දේපලක් නොවෙනවා කියලා එහෙමනම් අපි කොහොමද පොදු දේපලකට පෞද්ගලිකව ඉදිරිපත් වෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිට ඕක කියන්න බැහැ මන්ත්‍රීතුමා. අපි නැවැත්තුවේ මහජන විරෝධතාවය මත. ඒක එකක්. අනිත් එක නඩුව. අපි නවත්වපු හේතු තියෙනවානේ. ඒ හේතු ඉවරනම් අපි මොකද කරන්නේ. ඕනම දේකට නවත්වන්න හේතු තියෙනවා. අපි සභාවේදී ඔලුව වනයි, මෙහෙම කියයි. නමුත් අපි අධිකරණය ඉස්සරහදි උත්තර දෙන්න ඕන. අපි නවත්වපු හේතුව මොකක්ද කියලා සභා තීන්දුව බලන්න. සභා තීන්දුව ගත්තේ අහවල් අංක දරණ නඩුවක් තියෙනවා ඒ නඩුවේ තීන්දුව එනකම් අපි මේක නවත්වනවා කියලා. ඒකටනේ නැවැත්තුවේ. ඊට පස්සේ ඒ තීන්දුව ආවානේ. ඒ පාර නැවත අපි ගන්නවා. ඇත්ත කතාව මෙහෙමනේ. මේ අපි කරන්නේ මොකක්ද කියලා ඕන බබෙකුට තේරෙනවා. අශ්වයා ගියාට පස්සේ ඉස්තාලය වැහීමක්නේ කරන්නේ. ඔක්කොම වෙලා ඉවර වෙලා දැන් අන්තිමට අපි කර මුලට හිර වෙනවා. මේකෙදී සභාවේ කවුද වගකියන්නේ මිලියන ගාණක් ඒකට ගෙවන්න ආවොත්. එතකොට කියයි අනිත් පැත්තට ඔන්න සභාපති දිල්රුක් ආවයි කියාවි සභාවත් විනාශ කරලා ගියා කියාවි මේ කොහේවත් ඉන්න මිනිහෙකුට ගෙවලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඒ නිසා තමයි මේ කියන්නේ. මේකේ මැදින් හරි කොනෙන් හරි අල්ල ගන්න එපා. දැන් මේකේ මුලයි වැරැද්ද තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි. ඔබතුමා කියන්නකෝ කරන්න ඕන දේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේකේ ආරම්භයනේ වරද්දලා තියෙන්නේ. අපි ඒ වරද්දපු තැන ඕන අල්ල ගන්න හරියටම. ඒක නීතිය ඉස්සරහ පෙන්වා දීලා ඒකට ඕන අභියෝග කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ කියන එක තේරෙන්නේ නැහැ. දැන් අපිට එකම දෙයයි තියෙන්නේ. නඩුවේදී තියෙන ප්‍රශ්නය ඇයි මේක නොදෙන්නේ. එච්චරයි. අපි නොදී ඉඳලා තියෙන්නේ නඩුවක් තිබුණ නිසා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ප්‍රදේශයේ මහජන විරෝධතාවය මත තමයි ඒක වුණේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මේක සභාවට ආවේ මන්ත්‍රීතුමා ඒ අය අනුමැතිය ඉල්ලපු නිසා. අනුමැතිය ඉල්ලන්න ආවේ නැත්නම් මේක සභාව දන්නෙත් නැහැ. මේ වගේ තමයි තුනී ලෑලි සංස්ථාවේ එකත්. ඒකත් අනුමැතියට දාපු නිසා තමයි අපි දන්නේ. එතකොට අපි ඒක සභාවට පවරා ගන්න කිවුවා. එතකොට මේ ඉඩම සභාවට පවරා ගන්න නෙමෙයිනේ ඉල්ලන්නේ. තුනී ලෑලි සංස්ථාවේ ඉඩම ඉල්ලන්නේ සභාවට.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේක මහජන දේපලක්නේ. මේක අවභාවිතා කිරීම සම්බන්ධයෙන් ප්‍රශ්නයක්නේ අපිට තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිට ඔතන අදාළතාවය මෙච්චරයි. අපිට අදාළතාවය ඒ අය අපෙන් ඉල්ලලා තියෙනවා ඉඩම වෙන්දේසි කරන්න කලින් ඉඩම සංවර්ධනය කරන්න කොන්දේසි. අපිට තියෙන්නේ එච්චරමයි. ඒක දීපු එකනේ නැවැත්තුවේ. මේක තේරුම් ගන්න. දැන් නඩුව දාලා තියෙන්නේ වෙන මුකුත් කාරණාවකට නෙමෙයි. අපි ඔලුවෙන් හිටන් කතා කරත් මේක දීපු විදිය වැරදියි. ඕවා ප්‍රාදේශීය ලේකම් කියලා තමයි නීතිපතිවරයා එවුවේ ඔබතුමාට ගෙවන්න ඕනද, ඔබතුමාට පුද්ගලිකව ගෙවන්න වෙනවා මේකට. ඒක හින්දා වහාම මේ කාලය තුළ භුක්තිය භාර දෙන්න කියලා. කෙලින්ම නීතිපති එවුවේ. මේ සෙල්ලම් කාරණයක්ද, එතනට නීතිපති එහෙම එවුවා. අපි ඉල්ලපු එකට වෙනම එව්වා. ප්‍රාදේශීය ලේකම් කොච්චර කාලයක් නොදී හිටියද, එතුමාට පුද්ගලිකව එවුවානේ. එතුමාට පුද්ගලිකව එවුවේ නැද්ද.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එතනින් ගලවා ගත්තේ එහෙම බල කරලා තමයි.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** දැන් ඉන්න වර්තමාන විදුහල්පතිතුමාට තමයි අයිතිය තියෙන්නේ මේ ඉඩම විදුහලේ නම් මැදිහත් වෙන්න. එතකොට පාසල් සංවර්ධන සමිතිය, දෙමව්පියෝ, වැඩිහිටියෝ එකතු වෙලා දැන් මේ තීන්දුවට එරෙහිව නඩුවක් ගොනු කරන්න ඕන. එතකොට අයිතිය තියෙන්නේ පාසලට, අධ්‍යාපන අමාත්‍යාංශයට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමයි. කිසි ප්‍රශ්නයක් නැහැ. අපි දැන් නීතිඥයෝ අල්ලලා තියෙන්නේ. ඔබතුමන්ලා යමු. නඩුව දිහා එතුමා බලන්නේ අපි බලන කෝණයෙන් නෙමෙයි. එතුමා බලන්නේ මේ දාපු නඩුවට හේතු මොනවද කියලා. ඒක හින්දා ඔබතුමන්ලා යන්න. මම වාහනය දෙන්නම්. නීතිඥතුමාගෙන් වෙලාව අරගෙන දෙන්නම්. ඔබතුමන්ලාට තියෙන ඒවත් දෙන්න. මගේ කිසි ප්‍රශ්නයක් නැහැ. මේ අපි දෙගොල්ලොම තර්ක කරන්නේ එක කාරණයක් හින්දා. මම දකින්නේ නම් අද අපිට වෙන මුකුත් නෙමෙයි තියෙන්නේ නඩුවට අදාළ කාරණාව පමණයි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒ යෝජනාව හොඳයි. අපි අනිවාර්යයෙන්ම මේකේ තියෙන තොරතුරු මත පදනම්ව වහාම සාකච්ඡා කරලා අපි අදාළ නීතිඥතුමාව හම්බ වෙමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම සෙනසුරාදා හරි, ඉරිදා හරි වෙලාවක් අරගෙන දෙන්නම්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** හම්බ වෙලා කතා කරමු. එතකොට මේකේ තියෙනවද නැද්ද කියන එක හරි පැහැදිළි කර ගන්න පුලුවන්. අපි මෙහෙම තැනින් තැනින් අල්ල අල්ල දඟලලා වැඩක් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම ලබන සෙනසුරාදා හරි, ඉරිදා හරි දවස් දෙකෙන් එකක වෙලාවක් අරගෙන දෙන්නම්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අනිවාර්යයෙන්ම.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් වෙලා තියෙන්නේ මෙහෙමයි ඇත්ත කතාව. දැන් වෙලා තියෙන්නේ ඒ අය කරන චෝදනා වලට අපිට උත්තර බඳින්න. දැන් අපි වගඋත්තරකාරයෝ වෙලා තියෙනවා මේ නඩුවේදී. ඉතිං මේක තේරුම් ගන්න ඕන. දැන් අපි බේරෙන්න උපක්‍රමයක් බලන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ එකක්. ඒක හරි. ඒක නිවැරදියි. ඒකට උත්තර දෙන්න ඕන ඒ ආපුවට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නැත්නම් මේ ලේසි කාරණයක් නෙමෙයි. මිලියන 200 ක් එකපාරක් ඉල්ලලා තියෙනවා. මිලියන 500 ක් තව පාරක් ඉල්ලලා තියෙනවා. ඔය දෙකත් එක්ක යන්නේ. ඒකෙදි අපි වැරදිකරුවෝ වෙනවා කියන්නේ ඒ ගෙවීමුත් කරන්න වෙනවා කියන එක.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, මේකට ඇහුම්කන් දෙන්න. විරෝධාකල්පයක් නෙමෙයි තියෙන්නේ. අර වැඩේ කරමු. හැබැයි එකක් තියෙනවා. උපකල්පනයක නම් ඉන්න එපා මේ නීතිපති දීපු එක හරි, මේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කරපු පරීක්ෂණය හරි කියලා. මම මේ කියන දේට පොඩ්ඩක් ඇහුම්කන් දෙන්න. ඒ ඇති මට. ඒක නිවැරදියි කියන මතයේ ඉන්න එපා. මොකද හේතුව ඉතාම පැහැදිළිව තියෙනවා මේ කරපු පරීක්ෂණය වැරදියි. අභියාචනා වලදී දිනනවා, මේවා වෙනවා. ඒ විතරක් නෙමෙයි දැන් මේකට, මේ කරපු පරීක්ෂණයට ඔබතුමාගෙන් ගත්තද කටඋත්තරයක්. නැහැ. එතකොට කාගෙන්ද කටඋත්තර අරගෙන තියෙන්නේ. දැන් අපෙන් ඇහුවා නම් අපි මේක තෝරලා කියනවා මෙන්න මේකයි වෙලා තියෙන්නේ කියලා කතාව කියනවා. ඉතිං ඒක නිසා දැන් මේ ඔබතුමා එක පැත්තකින් දරන මතය තමයි අපි කට්ටියම එක්කහු කරලා ලියුමක් යවමු කියලා. සභාවේ වෙන දෙයක් බැරිනම් අපි ඒක යවමු. හැබැයි එකක් තියෙනවා අපි මේ සභාවේ යෝජනාවක් ගෙනාවම ඒක ස්ථිර වෙනවානම්, ඒකට විරුද්ධ වෙනවා නම් කට්ටිය ඒක සඳහන් කරනවා. ඔබතුමාට උනත් ඉන්න ඇහැකි මම මේකට විරුද්ධයි කියලා. නමුත් සභාව යෝජනා කරන නිසා මම නැවතත් කියනවා මේ පරීක්ෂණය නැවත කරන්න. මේ පරීක්ෂණයේ අඩුපාඩු තියෙනවා. අර ප්‍රශ්න නොකියා කියන්න. දැන් අපි ට්‍රාන්ස්පෙරන්සි ඉන්ටර්නැෂනල් එකත් එක්ක කතා කරා. ඉතිං මේ ආයතන කිහිපයක් එක්ක කතා කරහම ඒ අය බොහොම පැහැදිළිව මේ කතාව දකිනවා ඒක තියෙනවා කියලා. ඔබතුමා කැමති දෙයක් ගන්න. අරගෙන කරන්න. මම මේ කිවුවේ අපි කාගෙත් වුවමනාව ඒකයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් අබේසේකර මන්ත්‍රීතුමා මෙහෙමනේ. මට දැන් නීතිපති කියන එකත් පිළිගන්න බැරිනම්, අධිකරණයේ දාන නඩුත් නිෂ්ප්‍රභා කරනවා නම් එතකොට මම ඔබතුමා කියන එක විතරක් පිළිඅරගෙන මොකටද, මම පිළිඅරගෙන මොකටද, දැන් ඔබතුමාලා ඔක්කොම කියන එක මට පිළිගන්නද කියන්නේ. මම ඉන්නෙත් ඔය තැන. ඉතිං මම පිළිඅරන් මොකටද, එතකොට දැන් මේ කියන විදියට නීතිපති කියන එකට අභියෝග කරන්නේ කොහොමද. නීතිපති දීපු තීන්දුවකට අභියෝග කරන්න පුලුවන්ද.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, එහෙම නෙමෙයි මේ කියන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙමනම් මොකක්ද කියන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, කවුරුවත් කියන එක මත පදනම්ව තීන්දු ගන්න ඕන නැහැ. බුදුහාමුදුරුවොත් කියලා තියෙනවා බුදුහාමුදුරුවෝ කියන එකත් අවබෝධයෙන් පිළිගන්න කියලා. මම කියන්නේ අපි කවුරුත් කියන එකට යන්න නෙමෙයි. ඔබතුමාට විරුද්ධව දැන් නඩුවක් දාලා තියෙනවා. මේ කාරණය තේරුම් ගන්නකෝ. මේ සිද්ධියේදී එයාගේ නඩු නිමිත්ත වෙලා තියෙන්නේ එයා නිවැරදි දේකට ඉදිරිපත් කරලා තියෙනවා. එහෙම තියෙද්දි ඔබතුමා මේක වළක්වනවා කියලා. ඕකනේ දැන් පදනම එයාගේ. දැන් ඔය නඩුව දාලා තියෙන්නේ අශෝක මහත්තයා එයා නිවැරදි ලේඛන ඉදිරිපත් කරලා තියෙනවා. අපි ඒක එහෙම තියෙද්දී, අවසර නොදී මග හැරියා කියලා. ඒකනේ වැරද්ද. එතකොට අපි එයා දීපු ලේඛන නිවැරදියි කියන ස්ථාවරයේ ඉඳගෙන උත්තර බලාපොරොත්තු වන්නේ. අපි දැන් අභියෝග කරන්න ඕන මේ ලේඛන නිවැරදි නැහැ කියන එකට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි එහෙම කරන්න තිබුණේ ඉස්සෙල්ලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එයා දාපු නඩුවට අපි ඉදිරිපත් කරන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට බැහැ. ඒකට කොහොමද ඕවා ඉදිරිපත් කරන්නේ. ඒක දැම්මොත් තව විහිළුවක් වෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එහෙමනම් කූට ලේඛන සකස් කිරීමයි වැරදි. ලේඛනය වැරදිනම් ඒ වැරද්ද මත පදනම්ව අපි යන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඕක මන්ත්‍රීතුමා මේ නඩුවට අදාළ කාරණයක් නෙමෙයි. මේ නඩුවට ඉදිරිපත් කරන්න පුලුවන් මෙච්චරයි. මේ නඩුවට අදාළ කාරණා විතරයි. සභාව විදියට මමයි, ලේකම්තුමයි, නාගරික සංවර්ධන අධිකාරියයි ඇයි මේක නොදී ඉන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි මේ අහන්නකෝ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතකොට ගැසට් එකත් බොරුද ඔබතුමා කියන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** බොරු.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා** ඃ- එහෙම වැරදි වෙන්න පුලුවන්. එහෙම වැරදි වෙන්න බැරිද,

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඒ කියන්නේ ගැසට් එක හොර.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- හොරයි ඒක දන්නවානේ. හොර දත්තයන් උඩ ගනිපු තීන්දුවකින් තමයි ගැසට් එක තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එහෙමනම් අභියෝග කරන්න ඕන වෙනම නඩුවකින් ඒකට. මේක අහන්න.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා** ඃ- මේකට ලංකාවේ නඩුවක් දාන්න බැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- මන්ත්‍රීතුමා මෙන්න මේක තේරුම් ගන්න අඩුම තරමේ. කතා කරන්න පුලුවන් පැය ගණන්, වරු ගණන්, දවස් ගණන් තේරුණාද, මේක තේරුම් ගන්න. දැන් ඒ අය දාලා තියෙන්නේ. අපි දාන එකක් නෙමෙයි මේ. මේක ඒගොල්ලෝ දාපු නඩුවක්. අපිට තියෙන උත්තරය වළක්වාගැනීමට හේතුව. අපිට කිතුල් ගසට යන උත්තර දෙන්න බැහැ. අපිට දැන් කියන්න බැහැ ගැසට් එක විශ්වාස නැහැ කියලා. මේක එහෙම නැහැ. අපිට ඒවා කියන්න බැහැ. අපි පදනම් කර ගෙන දාපු ලිපිලේඛන වල වැරදි තියෙනවා නම් ඒක වෙන කතාවක්. මම අවලංගු කරේ ඒ ලිපිලේඛන වල වැරදි කතාවකට නෙමෙයිනේ. මේක තේරුම් ගන්න. මම අවලංගු කරේ ගැසට් එක විශ්වාස නැහැ කියලා නෙමෙයි. ඒක දීපු විදිය විශ්වාස නැහැ, ඔය දීපු කෙනාට නෙමෙයි යන්න ඕන, ඒක හින්දා නෙමෙයිනේ මම අවලංගු කරේ නඩුවක් තිබුණ හින්දා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා** ඃ- ඒ කාරණය පැහැදිලියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- දැන් අපි උත්තර දෙන්න ඕන ඒ කාරණාවට මන්ත්‍රීතුමා. මේක නොදෙන්න මොකක්ද හේතුව කියන්න ඕන ඒකට. ඒකට කිතුල්ගසට ගියාම දෙන උත්තර දීලා හරියන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා** ඃ- මම අහන්නේ ගරු සභාපතිතුමනි, ඒ නඩුවට ඉදිරිපත් කරලා තියෙන කාරණා මත පදනම්ව. ඒක නිවැරදියි කියන එක පදනම්ව උත්තර දෙන්න ගියාමනේ අපිට ප්‍රශ්නය තියෙන්නේ දැන්. දැන් ඒ ඉදිරිපත් කරපු ලේඛන නිවැරදිද කියන්න ඒක පදනම්ව අපිට තීන්දු ගන්න බැරිද කියලා අහන්නේ මේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- මම කිවුවානේ හතර පස් දෙනෙක් ගිහින් නීතිඥතුමාව හම්බවෙන්නකෝ. මම නීතිඥතුමා නෙමෙයිනේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා** ඃ- ඔව් ඒක අහමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- නීතිඥතුමාව හම්බ වෙන්න. මට උත්තර දෙන්න බැහැනේ. හතර පස් දෙනෙක් යන්න. ඔක්කොටම යන්න ඕන නම් මම බස් එකක් ලේස්ති කරලා දෙන්නම් යන්න.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා** ඃ- ගරු සභාපතිතුමනි, මේක සම්බන්ධව මේ සභාවේ අපි ඉන්න කාලයේදී කතා කරපු ප්‍රශ්නයක්. අපිත් කියන්නේ මේක වැරදියි තමයි. නමුත් පාසලේ ඉඩම අයිති ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට. එතකොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ඔක්කොම කරලා අන්තිමට මේ සභාවට ආවේ ඒ අය අනුබෙදුමක් ඉල්ලලා දාපු නිසා. සංවර්ධන බලපත්‍රයක් ඉල්ලපු නිසා. සංවර්ධන බලපත්‍රය ඉල්ලුවම පාසල් සංවර්ධන සමිතියෙන් ඉල්ලීමක් කරා මේක වැරදියි කියලා. ඉතිං දැන් අපි මේක නවත්වාගෙන මෙතෙක් කාලයක් ඉන්නවා. දැන් මේ දක්වා නවත්වාගෙන ඉන්නවා. ඔබතුමා තාම දීලා නැහැනේ. දැන් මෙතුමන්ලා යවලා තියෙන නීතිපති හෝ ගැසට් කරලා තියෙන විදිය වැරදිනම් පාසල් සංවර්ධන සමිතියට තියෙන්නේ නැවත මේක සම්බන්ධව කරුණු ඉදිරිපත් කරන්න. අපේ අය තාම දීලා නැහැනේ මෙහෙන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- අගතියට පත් පාර්ශවය තමයි මේකට යන්න ඕන.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා** ඃ- සභාවෙන් මේ ඉඩම ඉල්ලලා නඩුවක් දාන්න බැහැ. සභාවට අයිති වෙන්නේ නැහැනේ නඩුවෙන් ඉඩම. දැන් අපි තුනී ලැලි සංස්ථාවේ ඉඩමට වියදම් කරොත් ඒක සභාවට අයිති වෙනවා. අපි ඒක සභාවට ගන්න හදනවා. ඒක අපිට අයිති වෙනවා. අපි වියදම් කරත් කමක් නැහැ. දැන් මේක සභාවට අයිති වෙන්නේ නැහැනේ. පාසල් සංවර්ධන සමිතියට කියන්න මේකට

අදාළ ලියකියවිලි දාලා, විස්තර දාලා නැවත පරීක්ෂණය ඉල්ලන්න කියලා. අපි සභාවෙන් දෙන්නම් සහයෝගය. අපි දෙන්නම් සහයෝගය. අපි හැමදාම මේක මෙතන කතා කරාට වැඩක් නැහැනේ. ඇත්ත කතාව මේක. සභාවේ නිකං කතා කරලා කාලය නාස්ති වෙන එක විතරයි වෙන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** සභාපතිතුමනි, දැන් හැමදාම කපුහෙම්පල ඉඩම ගැන කතා කරනවා. මම විරුද්ධ මතයක් නෙමෙයි කපුහෙම්පල ඉඩම සම්බන්ධව කරන්නේ. මේක දැන් අපි හැමදාම මෙතන තර්ක කරලා වැඩක් නැහැ. මම කියන්නේ අපිත් එන්නම්. සියලු දෙනා එකතු වෙලා විදුහල්පතිතුමාගේ මූලිකත්වයෙන් ඔතන කමිටුවක් හරි මොකක් හරි පත් කරන්න. පත් කරලා ඒකෙන් මුදල් හොයා ගෙන අපි උසාවියට යමු. සභාව හැටියට ඒකට අවශ්‍ය පහසුකම් ටික අපිට දෙන්න පුලුවන්. මොකද හේතුව අපි කොච්චර කතා කරත් සියල්ල එක තැන. ඒ කියන්නේ අපිට කිසිම අයිතියක් නැහැ ගිහිල්ලා ඒක ඉල්ලන්න. ඒ හින්දා විදුහල්පතිවරයා තමයි යන්න ඕන. වගඋත්තරකරුවෝ හැටියට හිටපු විදුහල්පතිතුමා ඇතුළු සියලු කණ්ඩායම් මේවා කරන්න වෙනවා. විදුහල්පතිවරයාගේ ලියුම දාලා තියෙනවානම් ඒ සියලු දෙනා වගඋත්තරකරුවන් කරලා අපි ඒ කමිටුවෙන් නඩු දාමු. දේපල සුරැකීම විදියට එතන කමිටුවක් හදා ගමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හැබැයි ඉතිං මෙහෙම දෙයක් තියෙනවා. දැන් මේ නඩුව මම හිතන්නේ නැහැ ගොඩක් කල් යයි කියලා. යන එකක් ඉක්මන් වෙන්න වෙයි. මෙහෙන් දුන්නොත් නඩු තීන්දුව අවලංගු කරපු එක අහෝසි කරන්න කියලා දෙන්න වෙනවා. එතකොට ඒක වෙන්දේසියේ යනවා. ඒක වෙනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** මාසයක් ඇතුලත කරන්න ඕන. ලබන සභාවට කලින් අපි අරගෙන. ඒ නඩුව පාදක කර ගෙන මෙතනින් නැවත තහනමක් ගමු. ලබන සභාවට කලින් අපි නඩුවක් ගොනු කරමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තහනම ඉවත් කරන්න කිවුවොත් අපිට තහනම ඉවත් කරන්න වෙනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** අද හෙටම ඒ කමිටුවක් කැඳවලා ඉවර වෙලා අපි නඩුවක් දාමු. ඒ නඩුව පාදක කර ගෙන අපිට තහනමක් ගන්න පුලුවන්. ඒ නැතුව මෙතන තර්ක කරලා වැඩක් නැහැ. අද හෙටම ඒක කරන්න. අපිත් ඒකට සම්බන්ධ වෙන්නම්. කතා කරලා විදුහල්පතිතුමාගේ හරි ඒ කෙනෙක්ගේ නායකත්වයෙන් අපි යමු උසාවියට. ඒක අද හෙටම කරන්න. මේක අද මෙතන කතා කරලා හෙට නිදා ගෙන ලබන සභාවේ ආයෙමත් ඔය දේ කතා කරාට වැඩක් නැහැ. ඒක හින්දා අද හෙටම කමිටුවක් කැඳවන්න අපි ඒකට සම්බන්ධ වෙන්නම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක හොඳ යෝජනාවක්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, ඔබතුමාට කියපු යෝජනාවට මම දැන් කියනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් තව එකක් යනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා ගම් පුළුල් කිරීම යටතේ අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියක් දැන් ආරම්භ කරලා තියෙනවා. ඒකට මගේ එකඟතාවයත් ඉල්ලලා තිබුණා. ඒක දීලා තියෙනවා. දැන් ඒ ක්‍රියාවලියත් යනවා. ඒකත් යනවා. මම කියන්නේ මොන ක්‍රමයෙන් හරි ගිහිල්ලා අරකට කලින් මේ පැත්ත ඉක්මන් වෙන්න ඕන. නැත්නම් අරකේ වාරණය අයින් කරන්න දීපු ගමන් එතනින් නිදහස් වෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමන්ලා එක දෙයක් කරන්න. දැන් ඒක යන්න අරින්න. ඔය කරන්නේ හොරාට තව සල්ලි ටිකක් දෙන එක. ඒක තුළ ගරු සභාපතිතුමා, ඔබතුමන්ලා අපි කතා කරලා තියෙනවා. හොරාට තව සල්ලි ටිකක් දෙනවා කියන එක තමයි පවරා ගන්නවා කියන එකෙන් කියන්නේ. දැන් මම කියන්නම්. මෙන්න මේ ටික අපිට කරලා දෙන්න. දැන් ඔබතුමාට කියපු දේ කරන්න. දැන් මේ විසි දෙදෙනා එක්කහු කරලා අත්සන් ගන්න මේවා කරනවා කියන්නේ දිග කතාවක්. දැන් හදන්න ලියුමක් උපදෙස් දීලා. දැන් හදලා අපි සියලුදෙනාම මේවා කරමු. පරීක්ෂණයේ අඩුපාඩු තියෙනවා. වැරදි කියන්න යන්න ඕන නැහැ. අඩුපාඩු තියෙනවා අපිව සම්බන්ධ කර ගනිමින් මේ පරීක්ෂණය නැවත කරන්න කියන එක පෞද්ගලිකව අපි දෙමු සභාවෙන් දාන්න බැරිනම්. දැන් හදන්න කියන්න කවුරුහරි නිලධාරියෙකුට ඒ ලියුම. එතකොට හැදුවට පස්සේ දැන් අත්සන් ගන්න පුලුවන් ඔක්කොගෙම. අරගෙන අපි යවමු. පාසල් සංවර්ධන සමිතියෙනුත් යවමු. ඊට පස්සේ අපි ඒ වැඩේ එහෙම පටන් ගමු. ගරු සභාපතිතුමා, කාට හරි ඒ වැඩේ දැන් භාර දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක් හරි ලියලා දෙන්න. අවශ්‍ය දේ ලියලා දෙන්නකෝ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ලේකම්තුමා ඔබතුමා මෙන්න මේ ලියුම හදලා දෙන්න දැන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක් හරි ඒකට ලියන්නකෝ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කාටහරි වගකීම ගන්න කියන්න. කියන්නම් ඕන ටික.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** මෙතන මෙහෙම දෙයක් පේනවා. අපි මේ රටේ පුරවැසියන් හැටියට මේ රටේ අධිකරණයක් මගින් දුන්න තීන්දුවක් පිළිගන්න ඕන. විශේෂයෙන්ම අපිට මහජන නියෝජිතයන් හැටියට අධිකරණයෙන් දුන්න තීන්දුවක් සභාවේදී හෝ වෙන තැනකදී විවේචනය කිරීමේ අයිතියක් නැහැ. ඒක ඉතාම පැහැදිලියි නීතියේදී. ඉතිං අධිකරණයෙන් ලියකියවිලි සලකා බලලා තමයි මේකේදී තීන්දුවක් දෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේකේ ලේකම්නේ ඉන්නේ. ඔබතුමාගේ මොළේ කන්නේ ලේකම්තුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අබේසේකර මන්ත්‍රීතුමා මෙහෙමයි. ඒක නෙමෙයි මෙතන ප්‍රශ්නයක් වුණා. ඒක හින්දා මම කිවුවා ලිපිගොනුව කිසිසේත්ම අරින්න එපා කියලා. මොකද දන්නවද හේතුව, හේතුවත් මම කියන්නම්. අපිට නඩු ලේඛනයේ ආපු ලේඛනයක තියෙනවා අපේ දින මුද්‍රාව තියපු ලියුමක්. ඒක ගහලා තියෙන්නේ දුරකථනයකින්. නඩුව ගොනු කරලා ආපු එකේ තියෙනවා. එහෙන් එවන්නේ අශෝක කුලරත්නනේ. ඒ එවපු එකේ තියෙනවා අපේ සභාවේ දින මුද්‍රාව තියපු ලියුමක්. ඒකේ අකුරු එක සමාන නැහැ. ඇඹරිලා ගිහිල්ලා තියෙන්නේ. ඒක හින්දා මම කිවුවා කිසිසේත්ම මේ ලිපි ගොනුව කාටවත් දෙන්න එපා කියලා. ඡායා පිටපත් ඕන නම් ඡායා පිටපත් කරලා ඉල්ල ගන්න. ඕන ප්‍රමාණයක් දෙන්නම්. ඒක මම කියපු දෙයක්. නැත්නම් මේක කරන්න බැහැ ඇත්තටම. තියෙන ලියුම් ඔක්කොම දුරකථනයකින් ගහලා යවනවා. කවුද කියන එක දන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේක මෙහෙමයි. අපි මේ රටේ පුරවැසියන් හැටියට ගරු අධිකරණයෙන් දීපු තීන්දු පිළිගන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක මාර කුණක්. ඔක්කොම ඔලුවේ තියන් ඉන්නවට ගාණක් දෙන්න ඕන. ලියුමක් පෙන්වන්න බැහැ දුරකථනයෙන් හරි ගහගෙන යවනවා. ඒ ගමන් නැවත අරගල කරනවා මේක නැවත දියවු කිය කිය. එහෙම තත්ත්වයක් තියෙන්නේ. ඒ වගේ වැඩක් මේක.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, අපිට මහජන නියෝජිතයන් හැටියට කිසිසේත්ම අධිකරණ තීන්දුව මේ විදියට විවේචනය කරන්න බැහැ. නීතිපති තීන්දු දීපුවා අපිට පිළිගන්න බැහැ, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව දීපු තීන්දු අපිට පිළිගන්න බැහැ, උසාවිය දීපු තීන්දු පිළිගන්න බැහැ, බොරු ලියවිලි උඩ මේ තීන්දු දුන්නා, මේ කියන ඒවා අපිට මෙතනදී ප්‍රකාශ කරන්න බැහැ. ඒකට තමයි අධිකරණය තියෙන්නේ. මේක අධිකරණයේ ඩොකියුමන්ටරි කේස් එකක් විදියටනේ යන්නේ. මේක යන්නේ ලියවිලි, ඔප්පු තිරප්පු, ගිවිසුම්, ගැසට් පත්‍ර මත. මේක ගියාම අධිකරණයෙන් දුන්නා තීන්දුවක් මේ ඉඩමේ හිමිකාරීත්වය තියෙන්නේ පාසලට නෙමෙයි පුද්ගලයෙකුට කියලා. ඒකනේ වුණේ. ඊට පස්සේ ඒ සම්බන්ධව අපිට පුලුවන් අභියාචනයක් ඉදිරිපත් කරන්න. ඒ අභියාචනය ඉදිරිපත් කරපු වෙලාවේ අභියාචනාධිකරණය විසින් ඒකත් ප්‍රතික්ෂේප වුණා. ඊට පස්සේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කරන ලද පරීක්ෂණයේ ප්‍රගතියක් නැහැ. ඒකත් අසාර්ථක වුණා. නීතිපති තීන්දුවක් දුන්නා මේ අයට මේකේ අයිතිය සම්පූර්ණයෙන්ම පැහැදිලියි කියන එක. එතකොට ඒකට අපිට ඊට එහාට යන්න අමාරුයි. එතකොට අපිට යනවා නම් නැවත අභියාචනයක් දාන්න ඕන පුලුවන්නම්. මම දන්නේ නැහැ ඒකට අභියාචනා කරන විදියක් තියෙනවද කියලා. අභියාචනයක් නිෂ්ප්‍රභා වෙච්ච වෙලාවක් මේක. ඉන් හැර මේක එයාගෙන් ගලවන්න බැහැනේ ඔය කියන විදියට. ඔය කියන විදියට ගලවන්න බැහැ. නමුත් අපි මේකේ යම් අක්‍රමිකතාවයක් සිදු වෙලා තියෙනවා කියන විශ්වාසය මත තමුන්නාන්සේලා ලියුම පිළියෙල කරන්න. අපිත් ඒකට අත්සන් කරන්නම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හොඳට පේනවා මේක දුරකථනයෙන් ගහලා කියලා. එහෙම ලියුම් දෙකක් තියෙනවා මේකේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මොකක්ද ඒ ලියුම කියවන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් මෙහෙට ආපු ලියුම ඒක. ඒක තමයි ගිහින් තියෙන්නේ. හැබැයි ගිහින් තියෙන්නේ දුරකථනයකින් ගහපු එකක්. අර ඔක්කොම අකුරු ඇදයිනේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ආපු ලියුමක් ඔබතුමන්ලා අපිට දුන්නනේ. අපිට ඡායා පිටපත් කරලා දුන්නනේ. ඔබතුමන්ලා අපිට දීපු එකනේ තියෙන්නේ. නැතුව අපි ගාව නැහැ වෙන ඒවා. ලිපිගොනුවක් බලලා නැහැ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** අනිත් එක මෙහේ ලියකියවිලි තියෙන්නේ නිලධාරීන් ගාවනේ. ඒවා ආරක්ෂා කර ගන්න හැටි ඒ අය දැන ගන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමාගේ යෝජනා</u>**

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ- 59.** කිතුලම්පිටිය කොට්ඨාශයේ පහත සඳහන් මාර්ග හඳුනාගැනීමේ පහසුව සඳහා නාම පුවරු සවි කිරීමට යෝජනා කරමි.

I. බටුවන්තුඩාව මාර්ගය
II. කොහොඹන්වත්ත - ගෙදරවත්ත පාර
III. ආරච්චිගේ වත්ත පාර
IV. ධම්මරතන පාර
V. පුවක්වත්ත පාර
VI. බොකරමුල්ලගොඩ පාර
VII. මාදම්ගහ වත්ත පාර
VIII. කාල්ටන් සිටි මාර්ගය
IX. බෙරලියදොළ වත්ත පාර
X. ගොඩකන්ද වත්ත පාර
XI. ගොඩළිඳවත්ත පාර
XII. බටුවත්ත පාර
XIII. කොල්ලවත්ත පාර
XIV. අපේ ගම ප්‍රධාන පාර
XV. පැලවත්ත - රත්නගිරිවත්ත ප්‍රධාන පාර
XVI. ආනන්ද මාවත
XVII. කොහොඹන්වත්ත පාර
XVIII. එගොඩහවත්ත - ගල්කුටිගොඩ පාර
XIX. දාවුදු කන්ද පාර
XX. එදිරිසිංහ මාවත
XXI. ආනන්ද මාවත අතුරු මාර්ගය
XXII. බද්දේගෙවත්ත පාර
XXIIII. වී.සී. පාර
XXIV. අපේගම අතුරු මාර්ගය
XXV. රත්නගිරිවත්ත පාර
XXVI. සුප්‍රීම් සිටි මාර්ගය
XXVII. නාගරුක්ඛාරාම පාර
XXVIII. ගෝනකොළ දෙණිය පාර
XXIX. පැණියදෙණිය පාර

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ඒ මාර්ග 29 ක නාමලේඛනයක් තියෙනවා. ඒ නාමපුවරු යටින් බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව කියලා පොඩි අකුරින් සඳහන් කරත්, අපේ විරෝධතාවයක් නැහැ. පාරේ නම ලොකුවට සඳහන් කරන්න. ඒක ගැටළුවක් නැහැ. මේ සියලුම නම් කරලා තියෙන මාර්ග දැනට භාවිතා වෙන නම් තියෙන්නේ. අලුත් නම් එතන නැහැ. ඒ නිසා නීති ගැටලුවක් නැහැ ඒවායේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ- 60.** පැණියදෙණිය මහේෂ් මහතාගේ නිවස අසළ පැති කාණුව ඉදිකිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ- 61.** තුන්හිරිපාන අප ප්‍රාදේශීය සභාව සතු ඉඩමේ මාතෘ සායන ගොඩනැගිල්ලක් ඉදිකිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ- 62.** පලාගල කන්ද ඉහළ මාර්ගයේ කොටසක් කොන්ක්‍රීට් දමා සකස්කිරීමට සහ පැති කාණු ඉදිකිරීමටත් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රිනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ- 63.** රත්නගිරිවත්ත ප්‍රජා ශාලාව පහළ මාර්ගයේ කාණු පද්ධතිය, පෙට්ටි බෝක්කුව සහ මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ- 64.** පැලවත්ත රවීන්ද්‍ර වික්‍රමසිංහ මහතාගේ නිවසට යන මාර්ගයේ පැති කාණුව ඉදිකිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

මතක් වෙච්ච කාරණයක් තියෙනවා කියන්න. ඒක වැදගත්ම කාරණයක්. ඒක කියන්න අමතක වුණා. දැන් අපි සමහර වෙලාවට මන්ත්‍රීවරු විදියට යම් යම් චෝදනා කරනවා ලේකම්තුමාට. එක වෙලාවක මමත් හිටපු ස්ථාවරයක් තමයි ඇයි මන්ත්‍රීවරුන්ට ලිපි ශීර්ෂ දෙන්නේ නැත්තේ කියලා. ඒකටත් මම දිගින් දිගටම ලේකම්තුමා එක්ක කතා වෙලා අපි දෙන්නා කතා නොකර හිටපු අවස්ථාවලුත් තියෙනවා. නමුත් ඊයේ මගේ ළඟට ලියුමක් එනවා සභාවේ ලිපි ශීර්ෂය යටතේ. සභාවේ ලිපි ශීර්ෂය ඡායා පිටපත් කරලා ගමක මනුස්සයෙක් ලියුමක් එවනවා මට. අද ඒ මට්ටමට ගිහිල්ලා තියෙන්නේ තේරුණාද.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** ඒක මගේ අතින් සිද්ධ වෙච්ච වරදක්.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** නමුත් ලිපි ශීර්ෂ ගෙනත් දෙන්න ඕන. ඒක ප්‍රශ්නයක් නෙමෙයි. නගර සභාවෙත් දෙනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එහෙම දෙයක් නෙමෙයි වුණේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කියන්නේ ඒක නෙමෙයි. ගමේ පුද්ගලයෙක් මට ලියුමක් එවනවා සභාවේ ලිපි ශීර්ෂය යටතේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒ මනුස්සයාට පුලුවන් සභාවේ ලිපි ශීර්ෂය හදා ගන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** නැහැ, නැහැ. මම කියනකම් ඉන්නකෝ. ඒ මනුස්සයාගේ අඩි 03 ක පාර අඩි 04 ක් කරලා දෙන්න කියලා ඉල්ලගෙන අපේ ගෙදරට ආවා. ඒකට සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරන්න ඕනනේ. මගේ ඇස් දෙක පේන්නේ නැහැ. කාවයක් දාන්න ඉන්නේ. මම ගෙදර නෝනට කිව්වා ලියුමක් ලියලා ගෙනත් දෙන්න මම අත්සන් කරලා දෙන්නම් කියලා. එයා කොලේ ලියලා දීලා තියෙනවා. සමාවෙන්න අත් වැරැද්දක් වුණේ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** කොලයක් දීලා තියෙනවාද.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** කොලයක් දීලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කාගෙද කියලා කිව්වේ නැහැනේ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ඒක එතුමා පිළිගන්නවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** වැරැද්දක් වුණේ සමාවෙන්න. මේක හිතලා කරලා එහෙම නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක මාර විහිළු කතාවක්නේ. ලොකු දෙයක් නෙමෙයි කියලා කියන්න බැහැනේ. විලි ලැජ්ජාවක් නැතුව මගේ ළඟට එවනවා සභාවේ ලිපි ශීර්ෂයෙන්. එහෙම එවන්න පුලුවන් මන්ත්‍රීවරයෙකුට විතරයි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** මගේ අතින් වැරැද්දක් කෙරුණේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඒක පාවිච්චි කරන්න ඔබතුමාට පුලුවන්. ලේකම්තුමාට පුලුවන්. බලය පවරපු නිලධාරියෙකුට පුලුවන්. ඒවා පාවිච්චි කරන්න පුලුවන් බලය පවරපු කෙනෙකුට විතරයි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** මම වරද පිළිගන්නවා. මමනේ වැරැද්ද කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම ඔබතුමා කියලා කිව්වද. මම ඔබතුමාට කියලා කිව්වේ නැහැනේ.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** මට බලන් ඉන්න බැහැනේ වැරැද්දක් කරහම.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං මම ඔබතුමා කියලා කිව්වේ නැහැනේ. අපි ඇයි අහක යන ඒවා දා ගන්නේ. මම කියන්නේ ඔබතුමා කරපු දෙයක් නෙමෙයි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** ඔබතුමාට කියන්න තිබුණා තවත් ඕක කරන්න එපා කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාට නෙමෙයිනේ මම කිව්වේ.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** මමනේ වැරැද්ද කෙරුවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා වැරැද්ද කරානම් නිශ්ශබ්ද වෙලා ඉන්නකෝ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එතුමාගේ නිහතමානීකමට ඒක කිව්වා. ඒක හරි. හැබැයි එහෙම ඒවා කරන්න එපා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කිව්වේ තිස්ස මන්ත්‍රීතුමා කරපු දේට වැරැද්දක් නෙමෙයි. පොදුවේ මෙහෙම දේවල් කරන්න එපා කියලා මම කිව්වේ. නැත්නම් මට තිස්ස මන්ත්‍රීතුමාට කියන්න තිබුණා මේක ඔබතුමා කරන්න එපා කියලා. ඔබතුමා ඇයි පිළිගන්නේ. ඔබතුමාගෙන් වෙච්ච දෙයක්ද, කාගෙන් වෙච්ච දෙයක්ද කියලා මමනේ දන්නේ. මමනේ දන්නේ කාගෙන්ද වුණේ කියලා. මම කියන්නේ ඔබතුමාගෙන් වෙච්ච දෙයක් නෙමෙයි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** එතුමා ඒක පිළිගත්තානේ.

<u>ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ- 65.** කුරුඳුවත්ත කොට්ඨාශයේ අවහිර වී ඇති ඇළවල් පවිත්‍ර කර ඇළ කැපීම සඳහා බාජ් එකක් සමඟ එක්ස්කැවේටර් යන්ත්‍රයක් කොන්ත්‍රාත් පදනම මත හෝ කුලී පදනම මත ලබා ගැනීමට යෝජනා කරමි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මම කාලයක් තිස්සේ මේක කියන එකක්. මගේ කොට්ඨාශය නිතරම යටවෙනවා. පොඩ්ඩක් වැස්ස ගමන් යටවෙනවා. ඒ ඇළවල් ටික කපන්න කියලා දැඩි ඉල්ලීමක් තියෙනවා ප්‍රදේශවාසීන්ගේ. මම ගණන් ඇහුවා. රුපියල් 1800.00 ක් ද, රුපියල් 1900.00 ක් ද කොහෙද ඉල්ලනවා පැයකට. ප්‍රයිවට් ඒවා තියෙනවා. එහෙම හරි කරන්න. සභාවේ යුතුකමක්නේ ඒක. මේ ඇළවල් ටික කපලා වතුර බැහැලා යන්න පුලුවන් විදියට වැඩ ටික කරලා දෙන්න. පුලුවන් තරම් ඉක්මනට ඒක කරලා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ- 66.** කුරුඳුවත්ත කොට්ඨාශයේ, ගිංතොට සහිරා ජාතික පාසලේ පිට්ටනිය පිටුපස පළාත් නිශ්චිත මුදලින් රුපියල් ලක්ෂ විස්සක් වැයකර ඇවිදින මංතීරුවක් සකස්කර ඇත. එයට ප්‍රවේශ මාර්ගයක්ද නොමැත. සකස්කරන ලද මංතීරුව සෑම තැනින්ම පුපුරා ගොස් ඇත. මෙය අප ප්‍රාදේශීය සභාවේ අධීක්ෂණය යටතේ සිදුකරන ලද අතර මේ සම්බන්ධව පරීක්ෂණයක් පවත්වන ලෙස යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** අපේ තාක්ෂණ නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ සිදු වුණේ මේක. ලක්ෂ 20 ක් වියදම් කරලා යම්කිසි දෙයක් කරන කොට ඒකට තියෙන්න එපැයි ප්‍රවේශ මාර්ගයක්. කුරුඳුවත්තේ කාණුවක් දාලා හිරේ ගියා වගේ, වතුර බහින්න තැනක් නැතුව කාණුවක් දැම්මා වගේ වැඩක් මේක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක අපි අධීක්ෂණය කරාට දිස්ත්‍රික් ඉංජිනේරු තමයි බැලුවේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** සභාවෙන් තමයි අධීක්ෂණය කළේ. සභා බල ප්‍රදේශයේ සිදු වෙච්ච දෙයක්නේ. පරීක්ෂණයක් ඉල්ලනවා. මේ සම්බන්ධව සභාවෙන්නේ අධීක්ෂණය කරේ. දිස්ත්‍රික් ඉංජිනේරුවරයාට ලියුමක් යවන්න වහාම අඩු පාඩු ටික බලන්න කියලා. යම්කිසි වැඩක් කරන කොට, සාමාන්‍යයෙන් කාණුවක් දාන කොට බලනවා. මම අර ගිංතොට විදානගොඩ පාරේ කාණුවක් දාන කොට, අතුරු පාරක කාණුවක් දාන්න සිද්ධ වුණා. ඒ කාණුව පටන් ගැන්මේ ඉඳලා මීටර් 200 ක් විතර තියෙනවා බහින තැනට. මට කාණුව දාන්න සල්ලි තිබුණේ ලක්ෂ තුනහමාරයි. නමුත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් නියෝගය දුන්නේ මොකක්ද වතුර බස්සවන තැන ඉඳන් පටන්අරගෙන යන්න ඉස්සරහට. ඉතුරු ටික පස්සේ හදන්න. එහෙම තමයි වෙන්න ඕන. නැත්නම් කාණුව අතර මඟ නවත්වන්න බැහැනේ. බහින තැන ඉඳගෙන කරගෙන යන්න ඕන. ඒවගේ චෝදනාවක් තමයි තිබුණේ ගිංතොට සහිරා විද්‍යාලය ඉදිරිපිටින් කාණුවක් දාලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තවත් යෝජනාවක් ඇවිල්ලා තිබුණා පැති බැම්මකටයි, වැටකටයි.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** සහිරා විද්‍යාලය ඉස්සරහ කාණුවක් මේ විදියට කපලා, වතුර බහින්න තැනක් නැතුව කාණුවක් කපලා ඊට පස්සේ රිමාන්ඩ් වෙලා ප්‍රශ්නයකුත් ගියා. ඒ වගේ තමයි මේ මංතීරුව හදලා තියෙන්නේ. මේ මංතීරුවට යන්න ප්‍රවේශ මාර්ගයක් නැහැ. මිනිස්සුන්ට ඇවිදින්න යන්න පාරක් තියෙන්න එපැයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි. අරක ගත්තට පස්සේ පුලුවන්නේ. ප්ලයිවුඩ් එකේ ඉඩම ගත්තට පස්සේ පුලුවන්නේ මේක සම්බන්ධ කරන්න.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ප්ලයිවුඩ් එක ගාවට යන්න බැහැ. ගඟ අහුවෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ගඟෙන් දාමු පාලමක්.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එතකොට සභාපතිතුමනි, මේක ඉතා විශාල මුදල් නාස්තියක්. මේ සම්බන්ධව පරීක්ෂණයක් ඉල්ලන්න. හැම තැනම කැඩිලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** රියාස්ව අත්අඩංගුවට ගන්නද.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මම මෙච්චරකල් ඉන්න ඕන නැහැ. මම රියාස් ඕක කරන කොටත් විරුද්ධ වුණා. ඒ මදිවට තව තාප්පයක් හැදුවා. තාප්පය අයිනේ මායිමට කැපුවා තාප්පය කඩන් වැටෙන සයිස් එකට. ප්‍රාදේශීය ලේකම් එකෙනුත් ඒකට බලන්න ආවා. ඒ නිසා මේ සම්බන්ධව පරීක්ෂණයක් කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ සභාවට නැවත එවලා තියෙනවා. "2020 පළාත් පාලන ප්‍රතිපාදන යටතේ මුදල් ලබා ගැනීම (පළාත් පාලන දෙපාර්තමේන්තුව, දකුණු පළාත.)"

මේ තියෙන්නේ පැති බැම්මක් සහ වැට ඉදිකිරීම. ආරක්ෂිත ගල් බැම්මක් සහ වැට ඉදිකිරීම.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඉතිං තවත් ඇස්තමේන්තුවක් මොකටද සභාපතිතුමා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** අපි ඉස්සෙල්ලා තාප්පය හැදුවා. ඉස්කෝලේ වැට හැදුවා. වැට හැදුවට පස්සේ මෙයා කරපු වැඩේ මොකක්ද මංතීරුව හදන්න ඉඩ අර පැත්තෙන් ගන්න බැරි නිසා ඉස්කෝලේ පැත්තෙන් ගත්තා. තාප්පය මායිමටම කැපුවා. තාප්පය කඩන් වැටෙන්න ආවා. ඊට පස්සේ ප්‍රාදේශීය ලේකම් එකෙන් පරීක්ෂණයක් පැවැත්වුවා. වහාම මේක හදන්න කිවුවා. මේක හදන්න හදන්නෙත් සල්ලි පාස් කර ගෙන. ඒක අපිට අදාළ නැහැ. හදපු මංතීරුවත් හැම තැනින්ම පුපුරලා බැහැලා තියෙන්නේ. පොඩ්ඩක් බලන්න. මංතීරුව දැන් පේන්නේ නැහැ. ඔක්කොම පස් පිරිලා. බැම්ම ඔක්කොම යටවෙලා. අන්න ඒක සම්බන්ධව පරීක්ෂණයක් කරන්න ඉල්ලන්නේ. තව සල්ලි යටකරලා බැම්මක් හදන්න කලින්.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, ඒ පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් මෙම ප්‍රදේශයට විතරක් කොහොමද සල්ලි එවන්නේ. මුළු බෝපෙ පෝද්දලටම එවන්න එපැයි සාමානව. කාලයක් තිබුණා කියාස් මන්ත්‍රීතුමා ගිහිල්ලා ඒ මුදල් ගේන්න ඇති. එහෙමනේ වුණේ. දැන් සභාවක් තියෙද්දි සභාවට මුදල් එවන කොට සභාපතිතුමාව දැනුවත්වනේ වෙන්න ඕන මෙහෙම.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් අපිට ඇස්තමේන්තු හදලා එවන්න කියනවා. අපි යවනවා. අපෙන් මුදල් යන්නේ නැහැනේ. සභාවෙන් නෙමෙයිනේ කරන්නේ. පළාත් නිශ්චිත අරමුදල් වලින් කරන්නේ. ඒක කොහෙන් හරි ක්‍රමයකින් ගන්නවා ඇති.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** පළාත් නිශ්චිත අරමුදල් සාධාරණ විදියට එපැයි දාන්න. ඔහොම දැම්මම සාධාරණයක් නැහැනේ. මන්ත්‍රීවරුන්ට තේරෙනවද දන්නේ නැහැ මේක. දැන් කීයක ඇස්තමේන්තුවක්ද හදන්න කියන්නේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** තවත් ලක්ෂ 20 ක් විතර යාවි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මුදලක් නැහැ. ඇස්තමේන්තුව හදලා එවන්න කියන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මෙහෙමයි ඉතිං. සභාවක් විදියට අපි විරුද්ධයි මේකට.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** මේක සාමාන්‍යයෙන් බෙදිලා යන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සමසේ බෙදන්න කියලා ඉල්ලුවට කෙරෙන්නේ නැහැ. ඕක නොකෙරෙන එක තමයි වෙන්නේ. මට නම් අදාළතාවයක් නැහැ. කෙලින්ම සටහනක් ගහලා එවලා තියෙන්නේ "තාක්ෂණ නිලධාරි ගුණසේකර මහත්මයා, වැඩබිමේදී සාකච්ඡා කල පරිදි කඩිනමින් සකස් කරන ලද ඇස්තමේන්තුව එවන්න." කියලා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** සභාපතිතුමනි, අර ගිංතොට ඇස්තමේන්තුව ගැන කතා කරන වෙලාවේදී මම දැන් ඒ ලියුම බැලුවේ. පහුගිය කාලයේ ලක්ෂ 20 ක 30 ක විතර වැඩ කරා කියනවා. දැන් පළාත් නිශ්චිත මුදල් වලින් අපේ කොට්ඨාශ වලට ඒ මුදල ලැබිලා නැහැ. ලක්ෂ 30 ක මුදල් ලැබිලා තියෙනවා චන්දිම වීරක්කොඩි මැතිතුමා හෝ කවුරුහරි හරහා. ඉතුරු ටිකත් එතනටම යනවා නම් ඒකට අපි විරුද්ධයි. බෝපෙ පෝද්දල කොට්ඨාශ වලට ඒක බෙදලා දෙන්න. ඇස්තමේන්තුව හදලා යවලා ඒ කොට්ඨාශයේ විතරයි වැඩ කරන්නේ. ඉතුරු කොට්ඨාශ වලටත් මේක සමානව බෙදන්න කියන එක ඉල්ලුවේ. තව කොට්ඨාශ 11 ක් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමයි. ඕක තේරුම් ගන්න ඕන කාරණාවක්. ඒ පුලුවන් කෙනා ගිහිල්ලා, ආණ්ඩුකාරතුමාට කියලා එහෙම තමයි එන්නේ ඉතිං. ඒවගේම තමයි කිතුලම්පිටියේ උදාර පෙදෙසටත් ලක්ෂ 10 ක මුදලක් ඇවිල්ලා තියෙනවා පළාත් නිශ්චිත අරමුදල් යටතේ. අපි එහෙමනම් ඒවා එපා කියන්න ඕන. මෙහෙට එන සංවර්ධන මුදලක් අපිට එපා කියන්න බැහැ. ඒක තමයි මන්ත්‍රීතුමා මෙතෙන තියෙන කාරණය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** සභාපතිතුමා මම එදත් කතා කරා. පුලුවන් හැටියට, සමහර නිලධාරීන්ගේ හැටියට, කිතුලම්පිටියේ ඊට ඉස්සර වෙලා කාපට් මාර්ගයක් කරා. ඒක කරන වෙලාවේ ඒකට විරුද්ධව නෙමෙයි මම කතා කරේ. මේ මුදල් වලින් අනිත් කොට්ඨාශ වලටත් වැඩක් කෙරෙන්න ඕන. එහෙමනම් අපි පොදු වැඩපිළිවෙලක් හදලා මෙහෙන් යෝජනා කරමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමයි මන්ත්‍රීතුමා. අපි මොනවා කිවුවත් ඒ ක්‍රමය වළක්වාගන්න පුලුවන් ක්‍රමයක් නෙමෙයි. මොකද උදාහරණයක් හැටියට අපි සභාව එන්න කලිනුත් හපුගල මාදුගොඩ මන්ත්‍රීතුමා එවෙලේ පැහැදිළිව විරුද්ධ වුණා. නමත් සඳහන් කරාට කමක් නැහැ. දහනායක මැතිතුමාගේ මේවා එක අනුව ඒ කාණු පද්ධතිය හදා ගන්නවා. දැන් මෙහෙමයි අපිට පුලුවන් ඒකට එකම දෙයයි කරන්න. ඒක අපිට එපා කියන්න විතරයි පුලුවන්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** අපිත් ඉල්ලීමක් කරමු එක කොට්ඨාශයකින් එක වැඩක් හරි අරගෙන මේ වැඩ ටික කරලා දෙන්න කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමා බනින්නේ කියාස් මන්ත්‍රීතුමාටද, එතුමා කෝටියක වැඩ කරලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** කියාස් මන්ත්‍රීතුමාගේ වැඩේට නෙමෙයි මම විරුද්ධ. අපේ මන්ත්‍රීවරුන්ගෙනුත් යෝජනාවක් අරගන්න මේ ටිකත් හදමු කියලා පළාත් නිශ්චිත අරමුදල් වලින්. ඉස්සර කරානේ එහෙම. අපි එහෙම ඉල්ලීමක් කරලා නැහැනේ එහෙන් මේවා ලබා දෙන්න කියලා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** සභාවෙන් තමයි යෝජනා ටික එවන්න ඕන. පළාත් නිශ්චිත අරමුදල් දෙන්න සභාවලට යෝජනා දෙන්න කියනවා. ඒ යෝජනා අනුව තමයි ඒක ක්‍රියාත්මක වෙන්නේ. දැන් ඉතිං පළාත් සභාවක් නැති නිසා ඕක ඔහොම ක්‍රියාත්මක වෙනවා ඇති.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** සභාව විදියට ආණ්ඩුකාරතුමාගෙන් ඉල්ලීමක් කරමු. අත්‍යාවශ්‍ය වැඩ කිහිපයක් යෝජනා කරගෙන යවමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් ඒ වගේම තමයි උස්ගොඩ කන්දටත් එවලා තිබුණා. මම දන්නේවත් නැහැ. ලක්ෂ පහක මුදලක් එවලා තිබුණා. මම කියන්නේ අපිට තියෙන එකම දේ එක්කෝ මේක ගන්නවාද, නැත්නම් එපැයි කියලා යවන්නද කියන එක විතරයි තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** අපේ කොට්ඨාශයේ ගොඩකන්දේ පාරක් තියෙනවා. කාණුව කපලා බැම්මත් කඩා ගෙන ගිහිල්ලා. ඒ මිනිස්සුන්ට එහා මෙහා යන්න බැරි කොටසක් තියෙනවා වේල්ලගාව වත්ත කියලා. ඒ නිවාස වලට වාහනයක් යන්නත් බැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිට ඒක කියන්න පුලුවන්. එහෙම නෙමෙයි ඒක කරන්නේ. දැන් උදාහරණයක් මම කියන්නද, ඕක කවදත් සිදු වෙච්ච දෙයක්. මහා ඇමතිවරයා ඉන්න කොට අබේසේකර මන්ත්‍රීතුමාට, හිතවත් හිතවත් විදියට මූණු බලලා ඒක කරා. අපිටත් දුන්නේ නැහැ. ඒ කාලෙත් කරා. සුගත් මන්ත්‍රීතුමාටත් දුන්නා. අබේසේකර මන්ත්‍රීතුමාටත් දුන්නා. පද්මසේන සභාපතිතුමාටත් දුන්නා. ඒ කිහිප දෙනෙකුට දුන්නා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී කේ.යූ.පී යසරත්න මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී කේ.යූ.පී යසරත්න මැතිතුමා ඃ- 67.** උඩුවිටිකේ සංඝරතන මාවතේ මානිගවත්තේ සිට තල්පෙවත්ත දක්වා ඇති මාර්ගය දෙපස කම්කරුවන් යොදා පවිත්‍ර කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඒ. ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී යසරත්න මැතිතුමා ඃ-** මෙම මාර්ගය මම හිතන්නේ අවුරුදු ගාණකින් සුද්ධ කරලා නැහැ. වෙලත් එක්ක තියෙන්නේ. මහ කැලයක් තියෙන්නේ. උඩුවිටිකේ මේවා කරනවා. හැමදාම සුද්ධ කරනවා. මන්ත්‍රීතුමිය මේ පැත්තට ගිහිල්ලා නැහැ. මහා ගස් වැවිලා තියෙනවා. පාර සුද්ධ කරන්න මම යෝජනා කරේ කෙරුනේ නැති නිසා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී යසරත්න මැතිතුමා ඃ- 68.** උඩුවිටිකේ සඟබෝවත්ත මාර්ගය බ්‍රයිට්වේ පාසල අසල සිට මාර්ගයේ දෙපස ගස් පාරට බරවී ඇති අතර එය කපා ඉවත්කර සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඒ. ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී යසරත්න මැතිතුමා ඃ-** මේ පාර හැදුවා. මාර්ගය දෙපැත්තේ ගස් කොලන් මේවා වෙලා සම්පූර්ණයෙන්ම ඒ පාර ලිස්සනවා දැන්. අවහිර වෙලා තියෙන්නේ. ඒක නිසා ඒ පාර සුද්ධ කරලා දෙන්න කියලා ඉල්ලීම කෙරුවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ- 69.** කලේගාන දකුණ සහ කලේගාන උතුර ග්‍රාම සේවා වසම්වල අඩු ආදායම්ලාභි පවුල්වල ළමුන් උදෙසා රු.25,000.00 මුදලක අභ්‍යාස පොත් පරිත්‍යාග කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** 2019 වසරට මේ පොත් ටික හම්බ වුණා. ගරු සභාපතිතුමාත්, මන්ත්‍රී කණ්ඩායමත් ඇවිල්ලා මගේ ආරාධනාව පිළිඅරගෙන ශ්වේතබිම්බාරාම පන්සලේදී මේවා ප්‍රදානය කරනු ලැබුවා අඩු ආදායම්ලාභීන්ට. මේකේ කතාව මම හිතනවා සභාපතිතුමා කියයි කියලා. මේ වර්ෂයේදීත් රුපියල් 25,000.00 ක පොත් ලබා දෙන මෙන් මම යෝජනා කර සිටිනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා දෙනවා නම් මුළු බල ප්‍රදේශයටම දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක පිළිබඳව අදහසක් දක්වන්න ඕන. මේ පොළ කරේ කලින් ඔය සර්වෝදය සමිතියෙන් කලේගාන ශ්වේතබිම්බාරාම පන්සලේ. ඒ තිබුණ සභාව තමයි එකඟ වෙලා අපි ගත්තේ කලේගාන හන්දියට. ඒ සභාවේ අබේසේකර මන්ත්‍රීතුමත් හිටියා. සර්වෝදය සමිතියෙන් පොළ කාසි එකතු කරලා පොත් ටිකක් දීගෙන හිටියා. ඉතිං ඒ මුදල නැති වුණා පොළ මෙතනට ගෙනාවම. අපි වෙනම ආදායමක් ගත්තා ඒකෙන්. ඉතිං ඒක සාකච්ඡා කරලා තමයි තිබ්බ්ච්ච සභාව තීන්දු කරේ රුපියල් 25,000.00 ක මුදලක් දෙන්න. ඇත්තටම තීන්දු කරලා රුපියල් 25,000.00 ක මුදල දුන්නා දෙතුන් පාරක්. නමුත් අපි දැන් ගිය වර්ෂයේදී ඒක මුදලක් විදියට නෙමෙයි, සභාව අනුව ඒ අවශ්‍ය පොත් ප්‍රමාණය මිල

ගණන් කැඳවලා ගෙනල්ලා, මිනිස්සු හඳුනාගෙන, අඩු ආදායම්ලාභී අයගේ ලැයිස්තුව අරගෙන ඒ සර්වෝදය සමිතිය හරහා මන්ත්‍රීවරයාගේ මැදිහත්වීම මත මේ රුපියල් 25,000.00 ක පොත් ටික ඒ ළමයින්ට දුන්නේ. ඉතිං ඒ අරකට කරපු කෘතෝපකාරයක් විදියට තමයි කරේ. ඒත් ආණ්ඩුකාරතුමාගේ විශේෂ අනුමැතිය අරගෙන තමයි මේක කරන්නේ. මේ රුපියල් 25,000.00 ක පොත් ටික ලබා දුන්නේ එහෙම. ගිය සැරෙත් ඕක කරා. ඒක තමයි මෙතුමා මේ සැරෙත් ඉල්ලන්නේ. ඒක වෙනස් කාරණාවක් නෙමෙයි, පොළ සම්බන්ධ කාරණාවක්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- අඩු ආදායම්ලාභීන්ට දෙන්න පුලුවන් නම් බල ප්‍රදේශයේම අඩු ආදායම්ලාභීන්ට දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ලබන අවුරුද්දේ අපි විශේෂ ව්‍යාපෘති රාශියකට යන හින්දා මේ ඔක්කොම කරන්න වෙන්නේ මුද්දර සල්ලි වලින්. ඒකේදී සංවර්ධන කටයුතු නම් අඩු කරන්න වේවි බොහෝ දුරට ලබන අවුරුද්දේදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>(ඊ) කාරක සභාවල වාර්තා</u>

**<u>01. මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- I. 2020-10-09 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා** ඃ- එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>02. තාක්ෂණික සේවා කමිටුව</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- I. 2020-10-09 දින පැවති තාක්ෂණික සේවා කමිටු වාර්තාව

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා** ඃ- එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>03. නිවාස සහ ප්‍රජා සංවර්ධන කමිටුව</u> ඃ- නැත**

**<u>04. පරිසරය සහ පහසුකම් කමිටුව</u> ඃ- නැත**

**<u>(උ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම ඃ-</u>**

<u>01. ලැබීම් පිළිබඳ මාසික ප්‍රකාශ</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- 2020 වර්ෂයේ සැප්තැම්බර් මස මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය (ප්‍රා.ස. 16)

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා** ඃ- එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

<u>02. වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- 2020 වර්ෂයේ සැප්තැම්බර් මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය (ප්‍රා.ස.14)

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා** ඃ- එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

<u>03. එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තාව</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2020 වර්ෂයේ සැප්තැම්බර් මස මාසික ඒකාබද්ධ හිඟ ආදායම් ප්‍රකාශය (ප්‍රා.ස. 07)

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

<u>04. වෙනත් ලේඛන</u> ඃ- නැත

<u>(ඌ) රැස්වීම් කැඳවීම් දැන්වීමේ දක්වා ඇති වෙනත් කාරණා</u>

<u>**පසුගිය මහා සභා රැස්වීම් සඳහා ඉදිරිපත් කරන ලද යෝජනාවල ප්‍රගතිය සමාලෝචනය**</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2020 වර්ෂයේ ඔක්තෝම්බර් මස මහා සභාවට ඉදිරිපත් කරන ප්‍රගතිය සමාලෝචනය.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ප්‍රගතිය ගැන කතා කරන කොට මට කියන්න තියෙන්නේ කිහිප වතාවක්ම කතා කරත් මෙතෙක් ඉටු නොවුන සිද්ධියක් තියෙනවා. කුරුන්ද කන්දේ සොහොන් පිටියේ ඉඩම ගැන කතා කරා මීට පෙර. නමුත් ඒවායේ අයිතිය තහවුරු කර ගන්න ඉස්සෙල්ලා. ඒක අපේ සභාව සතු සොහොන් පිටියක්. ඊයෙත් සංවර්ධන කටයුත්තක් කරලා තියෙනවා මම දැක්කා. දිගින් දිගටම ඒ කාරණය ඒ විදියටම සිදු වෙනවා. ඔබතුමා කිවුවා නැවත සභාවේදී කතා කරන්නත් එපා කියලා. නමුත් ඒක ඒ ආකාරයෙන්ම ඒ අත්පත් කිරීම සිදු වෙලා තියෙනවා තනි පුද්ගලයෙකුට. සභාවේ සොහොන් පිටිය අයිති කර ගෙන තියෙනවා. ඇත්තටම ඒ යෝජනාව එදා මම කරේ මොකටද කියලත් හිතෙනවා. අපේ සභාවේ දේපල පිට කට්ටිය මංකොල්ලා කනකොට අපි මේ වෙන වෙන තැන්වලට ගිහිල්ලා තොරතුරු හොයනවා අපේ ඉඩම් ගැන. ඔබතුමාට මොකක් හරි බලපෑමක් තියෙනවද සභාපතිතුමා. අපිට මේ වැට ගහලා මේක වහන්න බැරි ඇයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පොලීසියේ පැමිණිල්ලක් දාලා කරන්නකෝ ඉතිං. ඊළඟ සභාවට කලින් කරන්න. හැමදාම කියන්න බැහැනේ.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එපමණයි සභාපතිතුමනි, බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මට පොඩි ගැටළු දෙකක් තුනක් තියෙනවා. අර ගිය සභාවාරයේදී පොඩි ගැටලුවක් ඇති වුණා මගේ කොට්ඨාශය තුළ අනවසර ඉදිකිරීමක් සම්බන්ධව. ඒකෙදි මම කිවුවා සභාවට ඉදිරිපත් කරන්න කියලා ඔබතුමාට ලැබුණ වාර්තාව. ඔබතුමා කියලා තියෙනවා " මේ සභාවට ගේන්න විදියක් නැහැ. ඒක උප කාර්යාලයේනේ තියෙන්නේ. ඒක ලබන සභාවට දෙන්නම්." කියලා. ඔබතුමා අත්සන් කරපු ලියුමේ වාර්තාවේ මායිම කොහොමද තියෙන්නේ. අයිතිකාරයා කවුරු කියලද තියෙන්නේ. වාර්තාවක් ඔබතුමාට ලැබෙන්න ඇතිනේ. මම ඒකට ඉල්ලීමක් කරනවා.

ඒ වගේම අද මේ සභාව පැවැත්වෙන දිනය වෙන කොටත් නරාවල කොට්ඨාශයේ තාක්ෂණ නිලධාරි විදියට කවුද වැඩ කරන්නේ කියන එක අහනවා. මොකද ඒක මට පළවෙනිදා ඉඳලා වෙනස් කරලා දෙන්නම් කිවුවා. අද වෙනකොටත් මට දැන ගන්න ලැබුණේ නැහැ කවුද වැඩ කරන්නේ කියන එක. මොකද මට හිටපු නිලධාරියා එක්ක වැඩ කරන්න බැහැ. මම කැමති නැහැ. ඒක නිසා ඒ පිළිබඳව මම ඔබතුමාගෙන් පැහැදිළිකිරීමක් ඉල්ලනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වාර්ෂික ස්ථානමාරු දාලා තියෙන නිසා අභ්‍යන්තර ස්ථානමාරු කරන්න එපා කියලා කොමසාරිස්තුමා කිවුවා. වාචිකව කිවුවේ. ලිඛිතව නම් දුන්නේ නැහැ. තව මාස දෙකක් ඇතුළත ස්ථාන මාරු වාර්ෂිකව කෙරෙන හින්දා ඒ අතරේ ගැලපීම් කරන්න ඕන කියන එක කිවුවා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** එතකොට සභාපතිතුමා නරාවල කොට්ඨාශයේ මිනිස්සු වෙනුවෙන් වැඩ කරන්නේ කවුද කියන්නකෝ. නරාවල කොට්ඨාශය වෙනුවෙන් වැඩ කරන්නේ කොහොමද, වැඩ කෙරෙන්නේ නැහැනේ. බොරු වැඩනේ මේවා. අපිට දෙයක් කතා කරන්න පුලුවන්ද දැන්. මම දෙයක් කිවුවම අනිත් පැත්තට ගිහිල්ලා කියනවා. මට විශ්වාසයක් නැහැනේ. මට මේ සභාවේ ඉන්න වෙන කෙනෙක්ව දෙන්න. දැන් උප සභාපතිතුමාට මාරු කරලා දුන්නා වගේ මට දෙන්න වෙන කෙනෙක්ව. නැත්නම් මගේ අන්තිම සභාව මේක. ඊට පස්සේ ආයේ එන්නේ අය වැය සභාවට විතරයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට එනවා නේද.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා** ඃ- ඒකට එනවා. පක්ෂයෙන් මොන ලියුම ගැහුවත් අපිට කොන්ද කෙලින් තියා ගෙන දේශපාලනය කරන්න පුලුවන් වෙන්න ඕන. මේ කවුරුවත් නෙමෙයි. නිලධාරීන් නිසා දේශපාලනය නොකර ඉන්නද කොට්ඨාශයේ. ඔබතුමා උප සභාපතිතුමාට කරලා දුන්නනේ. මටත් වෙනස් කරලා දෙන්නකෝ. මටත් වැඩ කරන්න බැහැ. මම දැන් දිගින් දිගටම ඔබතුමාගෙන් ඉල්ලුවානේ. අනුකම්පා කරලා හරි ඕක කරලා දෙන්න මට. අර වාර්තාවත් ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- කෝ ඒ වාර්තාව මට දෙන්න. පර්ලි මිස්ට ඒක දෙන්න කියන්න. ඒ ගියපු විදිය මොකක්ද කියලා, ඒ ලියුම යවන්න හේතුව මොකක්ද කියලා බලන්න ඕන.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා** ඃ- අයිතිකාරයෙක් නැහැ කියනවා. අයිතිකාරයෙක් නැත්නම් ලියුමක් යවලා පරීක්ෂණයක් කරන්නේ මොකටද, දැන් කරලා තියෙනවානේ. ඒක දෙන්න මට. මාසයක් වෙනවා ඒ ලියුම මේ ගෙදරට යවලා. තාම සල්ලි අයකර ගෙනත් නැහැ. හැම ලියුමක්ම එවන්න කියන්න අර වගේම. පිටපතක් එවන්න කියන්න.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය** ඃ- ගරු සභාපතිතුමා, යෝජනාවක් හැටියට මේක ඉදිරිපත් කරනවා. අපේ සභාවේ කාන්තා මන්ත්‍රීවරියන් පස් දෙනෙක් ඉන්නවා. අපි ළමා හා කාන්තා කමිටුවක් පිහිටුවන්න සියලු මන්ත්‍රීවරියන්ගේ එකඟතාවයෙන් අපි සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- තව කමිටු පිහිටුවන්න හදනවා. ටෙක්ලා මන්ත්‍රීතුමියයි, ශ්‍යාමිකා මන්ත්‍රීතුමියයි එක කමිටුවකටවත් ඇවිල්ලා නැහැ මෙතෙක්. තව කමිටු පිහිටුවන්න හදනවා. ඉස්සෙල්ලා ඔය කමිටු වලට එන්න කියලා ඕක හදමු ඊට පස්සේ.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය** ඃ- මම කමිටු වලට එන්නේ නැත්තේ මගේ එක යෝජනාවක්වත් වෙන්නේ නැති නිසා. මගේ එකම යෝජනාවක්වත් කරන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී ඒ. ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා** ඃ- ගරු සභාපතිතුමා මහවත්ත මාර්ගයේ අර මාර්ගය අවහිර කිරීම පිළිබඳව අපි දිගින් දිගටම කතා කරා. තාම ඒ කාරණය ඉෂ්ඨ වෙලා නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එවෙලේ මම කිවුවානේ ගිහින් පටවා ගෙන එන්න කියලා. දැන් කියලා මාසයකට වැඩියිනේ. මම කිවුවානේ එදාම කරන්න කියලා. ආයෙමත් මතුවෙනකම් ඉන්නවානේ ඕක අහන්න. ලබන සතියේ සඳුදා ඒක කෙරෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා** ඃ- ගරු සභාපතිතුමනි, ප්‍රගතිය අවස්ථාවේ මම කැමතියි මතක් කරන්න අපි අර අනතුරුදායක සහ අවදානම් වෙන්දේසි ඉඩම් සම්බන්ධව පත් කර ගනිපු කමිටුවෙන් පහුගිය දවස්වල නිරීක්ෂණ චාරිකාවක යෙදිලා ස්ථාන 13 ක වගේ ප්‍රමාණයක් අපි නිරීක්ෂණය කරා. ඒ නිරීක්ෂණය කරපු ස්ථාන 13 අතරින් අවදානම් සහ නීතිවිරෝධී ඉදිකිරීම් කිහිපයක් ඉලක්ක කර ගනිමින් අපි මුල් අවස්ථාවේ පළවෙනි අදියර හැටියට ඊට එරෙහිව නීතිමය පියවර ගන්න නිර්දේශ කරලා තියෙනවා. අඩුම තරමේ පහකටවත් නීතිමය ක්‍රියාමාර්ග ගන්න ඕන මුල් වතාවේදී. ඒ අනුව කමිටුව විසින් නම් කරනවා හපුගල බටුවන්තුඩාව පාරේ මවුන්ට්කැල්වරි පුද්ගලික විදුහල ඉදිරිපිට සදර්න් කන්ස්ට්‍රක්ෂන්ස් ආයතනය මිලදී ගෙන සංවර්ධනය කරන ඉඩම ගැන. විශාල බෑවුමක් සහිතව ඒකේ කණ්ඩි කපලා ගල් මතුවෙලා තියෙනවා. ඒකේ තියෙන අවදානම සලකලා ඒකට ක්‍රියාමාර්ග ගන්න කියලා තියෙනවා පළවෙනි එක හැටියට. ඊට පස්සේ හපුගල සුධර්මාරාම පන්සල අසල කාගිල්ස් සුපර් මාර්කට් එක පිටුපස අනවසර ඉදිකිරීම සම්බන්ධයෙන් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඒක විශේෂ සභාවේදී සභාගත කරානේ. න්‍යාය පත්‍රයෙන් යන්නේ නැතුව වැඩක් නැහැනේ. ඒක දැම්මට ඇති වැඩක් නැහැ. නෛතික බලයක් මුකුත් නැහැ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා** ඃ- ඒකෙන් පහකට නීතිමය කටයුතු ගන්න කියන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- සභාවේ ප්‍රගතිය එක්ක කතා කරන කොට පසුගිය විශේෂ සභාවේදී ගනිපු ක්‍රියාමාර්ග ගැන අහන්නේ.

(ගරු උප සභාපති ජේ.ජී. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- දහනායක හාඩ්වෙයාර් එකට නඩු දාන්න ඊයේ භාර දුන්නා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- ගරු සභාපතිතුමා, මේ නඩු දැම්ල්ල වැඩක් නැහැ. තහනම් නියෝගයක් ගන්න ඕන. තහනම් නියෝගය ගන්න එකත් අපි ගන්නවා. වගකීමෙන් ගන්නවා ඒවා. නැත්නම් මේ අය හදනවා. නඩු දානවට වඩා තහනම් නියෝගයක් ගත්තම හරි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- විදිමත් සභා යෝජනාවක් ගේන්න එකින් එකට.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- විදිමත් සභා යෝජනාවක් විශේෂ සභාවේදී ගෙනල්ලා වාර්තාවක් දුන්නනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඉතිං දැන් ඒක වැඩක් නැහැනේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- ඔබතුමන්ලා අපිට ඉඩකඩ දෙන්න මේ සතියේ දාන්නම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- තහනම් නියෝගයක් ගන්න සභාවෙන් එපැයි දාන්න. ඒකට සභාවෙන් මුදල් ගෙවන්න සභාවේ අනුමත වෙන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- ගරු සභාපතිතුමා දැන් වැඩේ තියෙන්නේ විශේෂ සභාවේදී තීන්දු ගත්තා පරීක්ෂණ කරලා ගිහිල්ලා බලලා. අඩු ගානේ ස්ථාන පහකට නඩු දාන්න. තහනම් නියෝග ගන්න. එතකොට සභාවෙන් මේක කරනවා කියලා නිලධාරි මහත්වරු පත් කරා ඒකට. දැන් අපිට තියෙන්නේ නඩු දාන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- විශේෂ සභාවේ ගත්තද එහෙම තීරණයක්. තහනම් නියෝගයක් ගන්න කියලා ගත්තේ නැහැනේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- බොහොම පැහැදිලිව අපි කතා කරලා තියෙනවා මේ සභාවේ. කළ යුත්තේ තහනම් නියෝග ගැනීම මිසක් නඩු දැමීම නෙමෙයි කියලා අපි කතා කරලා තියෙනවා. අනිත් එක තමයි සභාපතිතුමා ඒකෙ ඇත්ත කතාව.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- දැන් ගේන්නකෝ. දැන් ගෙනල්ලා බලලා කරමු.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- දැන් අද නඩු දාන්න දෙනවා කියලා දීපුවා මම පෙන්වන්නම්. මේවා දීලා තියෙන්නේ 2017 දී, 2016 දී. කෙරිලා නැහැ. දැන් අපි අවශ්‍ය ටික කරලා තියෙනවා. දැන් ඔබතුමා හිතන්න වැරදිලාවත් දැන් මේ දහනායක එක නැත්නම් අතන හන්දියේ තියෙන එක, මේවායේ බිල්ඩින් එකක් කඩාගෙන වැටුණොත් මොකද කරන්නේ. තට්ටු තුනකට යනවා. බේස් එකක් දාලාද දාන්නේ. එතකොට කවුද වග කියන්නේ. එතකොට ප්‍රාදේශීය සභාවට එන්නේ නැද්ද, සැලසුම් කමිටුවට එන්නේ නැද්ද වරද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- අබේසේකර මන්ත්‍රීතුමා ඕකට විරෝධාකල්පයක් නෙමෙයි කියන්නේ. විදිමත්ව ගන්න කියලා කියන්නේ. ගෙනල්ලා වැඩක් නැහැ විදිමත්ව නැත්නම්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- විදිමත්ව අපි ගෙනල්ලා තියෙනවා. ඔබතුමා බොහොම පැහැදිලිව කමිටුවට දාලා ඒකේ නිර්දේශ දීලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- හරි ඕක ගෙනල්ලා බලලා මේකට අනුකූලනම් දෙන්න. නැත්නම් ආයෙම ඊළඟ සභාවේදී ගේන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- ඊළඟ සභාවක් එනවා කියන්නේ මොකක්ද සභාපතිතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඉතිං අබේසේකර මන්ත්‍රීතුමා නීත්‍යානුකූලභාවයට මොකද කරන්නේ. මට දැන් කියන්න බැහැ ගිය සභාවේ ගනිපු තීන්දුව මොකක්ද කියලා. ඒක බලලා ඒකට එකගනම් බලමු. ඔබතුමා ගෙනාවේ නඩු දාන්නද, තහනම් නියෝග ගන්නද කියලා මට මතක නැහැනේ. ඉතිං ඒක බලන්න ඕන. බලලා ඒකට අනුකූලනම් කිසි ප්‍රශ්නයක් නැහැ ඔය තීන්දු ගන්න. නැත්නම් ඕක යෝජනා කරාට වැඩක් නැහැ නීත්‍යානුකූල නැත්නම්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා** ඃ- ගරු සභාපතිතුමා ප්‍රගතිය අවස්ථාවේ කතා කරේ. අපි එදා භාර දුන්නානේ මේවා. මේ කමිටුවේ නිර්දේශ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- විදිමත්ව ලබන සභාවට ගෙනාවා නම් හරිනේ. මේ සඳහා කියලා විදිමත්ව එකින් එක ගේන්න. ලබන සභාවට න්‍යාය පත්‍රයෙන් ගේන්න මේ සඳහා කියලා. එතකොට කිසි ප්‍රශ්නයක් නැහැනේ. එතකොට නෛතිකව ඇවිල්ලානේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා** ඃ- මේක විශේෂ සභාවෙන් අනුමත කරානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- අනුමත කරාට එකින් එකට නඩු දාන්න හරි, තහනම් නියෝග ගන්න හරි ඊළඟ එකකින් ගේන්න. සභා යෝජනා විදියට න්‍යාය පත්‍රයෙන් ගේන්න.

**<u>සභා රැස්වීමේ වැඩ කටයුතු අවසන් කිරීම.</u>**

මීළඟ මහා සභා රැස්වීම 2020-11-17 වන අඟහරුවාදා දින පෙ.ව 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වෙන බව දන්වා සිටිමින් මහා සභා රැස්වීම අවසන් කරන ලදී.

දිල්රුක් එන්. අබේකෝන්,
සභාපති,
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව